කාර්ය සාධන වාර්තාව - 2022



සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

			පිටුව
01	අන්තර්ගතය		3-3
02	පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	5-9
03	පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10 - 53
04	පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	54 - 76
05	පරිච්ඡේදය 04 -	කාර්ය සාධන දර්ශක	77 - 79
06	පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	80 - 83
07	පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	84 - 91
08	පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	92 – 99
09	සංවර්ධන වැඩසටහන්වලට අදාල ඡායාරූප		I - I

පරිච්ඡේදය - 01- ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනත මගින් ස්ථාපිත මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධානම කාර්යය වන්නේ සමෘද්ධිලාභී දිළිඳු පවුල් ලක්ෂ 17 ට සමෘද්ධි සුබසාධනය සලසමින් ඔවුන් ආර්ථික වශයෙන් සවිබලගැන්වීමය. සමාජ ආරක්ෂණ අරමුදල මගින් එම පවුල්වල දෛනික වැදගත් අවස්ථාවලදී ආරක්ෂණය සැලසීමට අදාලව දීමනා ලබා දේ. ශ්‍රී ලංකාවේ දිළිඳුකම මුලින් උපුටා දැමීම සඳහා එම පවුල් සවිබලගැන්වීමට ඔවුන්ගේ ජීවනෝපාය ප්‍රවර්ධනයට අදාළ වැඩසටහන් සහ ප්‍රජාමූල බැංකු 1089 ක් මගින් දිවයින පුරා විසිරී සිටින එම දිළිඳු පවුල්වල සහ අඩු ආදායම්ලාභී පවුල්වලට අවශ්‍ය කරන විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්පාදනය කිරීම සිදු කෙරේ. මීට අමතරව, දිළිඳු පවුල් සහ අඩු ආදායම්ලාභී ජනතාව, ඒකරාශී කරමින් ප්‍රජාමූල සංවිධාන ජාලයක් ස්ථාපිත කොට පවත්වාගෙන යාමත්, ඔවුන්ගේ සමාජ හා ආර්ථික සංවර්ධනය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කෙරේ.

1.2. දැක්ම හා මෙහෙවර

දැක්ම

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම"

මෙහෙවර

අවාසි සහගත තත්ත්වයට පත් ජනතාව ආර්ථික, සමාජීය, භෞතික, මානසික, නෛතික, හා පාරිසරික වශයෙන් බලගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී වැඩසටහන් ප්‍රජා සහභාගීත්වය ලබා ගනිමින් තිරසාර ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවට නැංවීම.

පරමාර්ථ

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 4 වන වගන්තිය අනුව දෙපාර්තමේන්තුවේ පරමාර්ථ පහත දක්වා ඇත.

(අ) දිළිඳුබව තුරන් කිරීම සහ සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීම සඳහා අවශ්‍ය විය හැකි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.

(ආ) පුද්ගල, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කෙන්ද්‍ර කරගත් ජීවනෝපාය ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

(ඇ) එක් එක් පුද්ගලයා සහ පවුල වෙනුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.

(ඈ) ජාතික සංවර්ධනය වේගවත් කිරීම සඳහා ජනතාව ඒකරාශී කිරීම සහ සවිබලගැන්වීම.

(ඉ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය ඉහළ නැංවීමේ කාර්ය සඳහා ක්ෂද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම.

(ඊ) ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි භෞතික සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(උ) ජනතාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට අවශ්‍ය විය හැකි අධ්‍යන සහ පර්යේෂණ කටයුතු සිදු කිරීම.

(ඌ) ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සහ සමාජ ආරක්ෂණයක් අවශ්‍ය පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම.

1.3. ක්‍රියාත්මක ප්‍රධාන ධාරාවන්

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි වන ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

1. නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව
2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව
3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

1.3.1 නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

සමෘද්ධි පනතේ 7 (1), (2), (3) වගන්ති අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට අනුව ජාතික සභාවක් පත් කර ඇත. එහි සාමාජිකයින් 11 දෙනෙකු සිටී. දෙපාර්තමේන්තුවේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ ජනරාල්ගේ නිල නායකත්වය යටතේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් තිදෙනෙකු සහ ප්‍රධාන අංශ 17 ක ප්‍රධානීන් මගින් ක්‍රියාත්මක වේ. එනම්, පාලන, ආයතන, විමර්ශන, නීති, තොරතුරු තාක්ෂණ, විශ්‍රාම වැටුප්, මානව සම්පත් සංවර්ධන, සමාජ ආරක්ෂණ හා සුබසාධන, ජීවනෝපාය සංවර්ධන, සමාජ සංවර්ධන හා පරිසර, ප්‍රජාමූල සංවිධාන, ව්‍යවසාය සංවර්ධන, සැලසුම් හා මෙහෙයුම්, ක්ෂුද්‍රමූල්‍ය (බැංකු / මහා සංගම්), මාධ්‍ය, මුදල් හා විගණන, යන අංශ භාර ප්‍රධානීන් ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් 25 ආවරණය වන ලෙසින් තම අංශවල රාජකාරී කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ ඇති දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මගින් දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ, කලාප හා ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් සමෘද්ධි පනතේ අරමුණු ලභාකර ගැනීමට අදාල රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජාමූල බැංකු කටයුතු, ප්‍රජාමූල සංවිධාන ගොඩනැගීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් ප්‍රාදේශීය නිලධාරීන් වන සමෘද්ධි කලමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි. සමස්ත සේවක සංඛ්‍යාව 25,481 වේ.

1.3.2. ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

සමෘද්ධි පනතේ 25(1),(2),(3),(4) ,29 (1),(2),(3),(4) හා 34 වගන්ති අනුව ප්‍රජාමූල බැංකු, බැංකු සමිති හා මහා සංගමයේ කටයුතු අධීක්ෂණය හා නියාමනය සඳහා සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් කළමනාකරණ මණ්ඩලයක් පත් කර ඇත. මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ හා මහා සංගමය යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මගින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 335 ට අදාල ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති, කලාප සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1,089 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මගින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මගින් සමෘද්ධි සහනාධාර බෙදා දීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ තැන්පතු පවත්වාගෙන යාම, ප්‍රතිලාභීන්ගේ තැන්පතු පවත්වාගෙන යාම හා ඉතුරුම් වර්ධනය, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2022 වර්ෂය තුල දී ජීවනෝපාය සංවර්ධන කටයුතු නිවාස, පාරිභෝගික, ආපදා සහ වෙනත් ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට ණය යෝජනා ක්‍රම 15 ක් යටතේ ලබා දී තිබූ මුළු ණය වටිනාකම රු.මි.19,273 කි. ඊට අදාල ව නිකුත් කර ඇති ණය සංඛ්‍යාව 192,491 කි. 1999 සිට 2022 වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ මුළු ණයවල සමුච්චිත වටිනාකම රු.මි. 424,906.65 කි. ඊට අදාල සමුච්චිත ණය සංඛ්‍යාව 11,959,271 කි. සමස්ත බැංකු ගිණුම් සංඛ්‍යාව 12,250,366 කි. මුළු තැන්පතු මුදල මිලියන 155,183 කි. තව ද මෙම අංශයේ සියළු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කර ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ඉන් ලබා දීමට පියවර ගෙන ඇත.

1.3.3. ප්‍රජාමූල සංවිධාන ධාරාව

2017 අංක 2 දරණ දිවිනැගුම සංශෝධන පනතින් සංශෝධිත 2013 අංක 01 දරණ සමෘද්ධි පනතට අනුව සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා සමෘද්ධි දිස්ත්‍රික් සංවිධාන පිහිටුවීම සඳහා අවශ්‍ය නියෝග හා ව්‍යවස්ථා (සමෘද්ධි පනතේ 42 වන වගන්තිය) ඇතුලත් 2017 මාර්තු 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2009/08 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත්විය. ඒ අනුව සමෘද්ධි පනතේ මූලික අරමුණ වන දිළිඳුකම තුරන් කිරීම හා සමාජ සාධාරණත්වය ඉටු කිරීම උදෙසා සෑම ග්‍රාම නිළධාරී වසමක්ම ආවරණය වන පරිදි ස්වේච්ඡාවෙන් සංවිධානය වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 09 වන වගන්තිය) ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 15 වන වගන්තිය) සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවීමත් (සමෘද්ධි පනතේ 19 වන වගන්තිය) සිදුකර ඇත. ප්‍රජා මූල සංවිධානවල කටයුතු පිළිබඳ අධීක්ෂණය, මෙහෙයවීම හා උපදෙස් ලබා දීමට සාමාජිකයින් 18 කින් සැදුම්ලත් සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල නමින් කමිටුවක් ජාතික මට්ටමින් රැස් වේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින්, ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2022 වර්ෂය වන විට ප්‍රජා මූල සංවිධාන 30,128 ක් ද ප්‍රාදේශීය සංවිධාන 335ක් සහ දිස්ත්‍රික් කමිටු 25ක් ක්‍රියාත්මකව පවතී.

1.4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා එහි කාර්ය භාරයන්

අනු අංකය	අංශය	කාර්යභාරය
1	පාලන අංශය	මානව සම්පත් හා භෞතික සම්පත් කළමනාකරණය
2	ආයතන අංශය	මානව සම්පත් බඳවා ගැනීම, උසස් කිරීම හා පෞද්ගලික ලිපි ගොණු නඩත්තු කිරීම
3	ගිණුම් අංශය	රාජ්‍ය මුදල් හා ගිණුම් කටයුතු පාලනය කිරීම
4	ජීවනෝපාය සංවර්ධන අංශය	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
5	ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගම් අංශය	ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීම, ඉතුරුම් හා ආයෝජන ප්‍රවර්ධනය, බැංකු හා බැංකු සමිති අධීක්ෂණය
6	ව්‍යවසාය සංවර්ධන අංශය	ව්‍යවසායකත්ව සංවර්ධනය හා අලෙවි සංවර්ධනය සඳහා ප්‍රාදේශීය, ග්‍රාමීය හා ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
7	සමාජ සංවර්ධන හා පරිසර අංශය	පරිසර හා සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
8	සැලසුම් හා මෙහෙයුම් අංශය	වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම්කරණය, ප්‍රගති සමාලෝචනය, පසුවිපරම් කිරීම, අධීක්ෂණය, වාර්තා කිරීම හා පර්යේෂණ කටයුතු සඳහා සහාය වීම.
9	ප්‍රජාමූල සංවිධාන අංශය	ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු පිහිටුවීම හා පවත්වගෙන යාම හා ප්‍රාජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10	විගණන අංශය	සමෘද්ධි පනත හා පොදු උපදෙස් අනුව විගණන කටයුතු පවත්වාගෙන යාම හා කළමනාකරණය
11	තොරතුරු තාක්ෂණ අංශය	තොරතුරු තාක්ෂණ කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය
12	මාධ්‍ය අංශය	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාතමක කිරීම
13	මානව සම්පත් සංවර්ධන අංශය	නිලධාරීන්ගේ (මානව සම්පත්) ධාරිතා සංවර්ධනය කිරීම
14	සමාජ සුඛසාධන හා සමාජ ආරක්ෂණ අංශය	රජයේ සහනාධාර හා සමාජ ආරක්ෂණ අරමුදලේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
15	නීති අංශය	නීති උපදෙස් ලබාදීම හා නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීම
16	විමර්ෂණ අංශය	සේවක විනයානුකූල කටයුතු හා විමර්ෂණ කටයුතු පවතවාගෙන යාම
17	විශ්‍රාම වැටුප් අංශය	සේවක විශ්‍රාම ගැනීම් සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම.

1.5 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



පරිච්ඡේදය - 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වල ප්‍රගතිය

2.1.1. පාලන අංශය

2.1.1.1. පාලන අංශයේ කාර්ය සාධනය

පාලන, ආයතන, විශ්‍රාම වැටුප්, නීති හා විමර්ශන අංශවලට අදාල කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරී වේ.

2.1.1.1.1. ප්‍රධාන අරමුණු

- බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන ව්‍යුහය සකස් කිරීම.

2.1.1.1.2. දෛනික රාජකාරී

- දෛනික තැපෑල පිළිබඳ කටයුතු කිරීම.
- අංශවල හා අංශ ගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- කාර්ය මණ්ඩලයේ සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාල කටයුතු.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග, තරඟ විභාග හා උසස්වීමේ විභාග සංවිධානය කිරීම.
- නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛන වාර්තා නඩත්තු කිරීම.
- අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු කටයුතු.
- නිලධාරීන් හා සම්බන්ධ විනය පරිපාලන කටයුතු.

2.1.1.1.3. විශේෂ පැවරුම්

- පාලන අංශයට අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- මහජන පෙත්සම් කාරක සභා රාජකාරී කටයුතු.
- පාලන අංශයට අදාල විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම්වලින් පැන නගින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනෙකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදන කාර්ය සපුරාලීම.
- පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරීන් බඳවා ගැනීම.

2.1.1.2. ආයතන අංශය

දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන සියළුම සමෘද්ධි කළමණාකරුවන්ගේ හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොණුවල රාජකාරී කටයුතු මෙම අංශය මගින් ඉටු කරනු ලබයි. ඒ අනුව

- එක් එක් නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් වීම් ලබා දීම.
- සේවය ස්ථීර කිරීම.
- පනතේ විධිවිධාන අනුව නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීම.
- එක් එක් නිලධාරීන්ගේ අවශ්‍යතා අනුව දේශීය, විදේශීය නිවාඩු ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

2.1.1.3. විමර්ශන අංශයේ කාර්ය සාධනය

2.1.1.3.1. අරමුණ

1. නිලධාරින් විසින් සිදු කරන විෂමාචාරයන් විමර්ශනය කර, විනය දඬුවම් පැමිණවීම මගින් ඔවුන් නිසි මගට ගැනීමට කටයුතු කිරීම.
2. දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය සේවයේ කීර්ති නාමය ආරක්ෂා කිරීම.
3. දෙපාර්තමේන්තු සේවකයින් තුළ විනය පවත්වාගෙන යාම සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම සහතික කිරීම.
4. වංචා වළක්වා අක්‍රමිකතා වැලැක්වීම සඳහා අවශ්‍ය යෝජනා / නිර්දේශ ඉදිරිපත් කිරීම.

2.1.1.3.2. අංශයේ කාර්යභාරය

- ලැබෙන පැමිණිලි අනුව මූලික විමර්ශන පැවැත්වීම.
- අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන විශේෂ විගණන පරීක්ෂණ සම්බන්ධ ඉදිරි විනය ක්‍රියාමාර්ග සිදු කිරීම.
- නිදහසට කරුණු විමසීම හා චෝදනා පත්‍ර නිකුත් කිරීම.
- විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම.
- විනය නියෝග නිකුත් කිරීම.
- මාණ්ඩලික නිලධාරින්ට අදාළ චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.
- විනය නියෝගවලට එරෙහි අභියාචනා සඳහා රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
- ජනාධිපති විමර්ශන අංශය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව හා පාර්ලිමේන්තු පෙත්සම්කාරක සභාව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු.

2.1.1.3.3. 2022 වර්ෂයේදී සිදු කළ කාර්යයන්හි සංක්ෂිප්ත වාර්තාව

- වර්ෂය තුළ ලැබී ඇති මූලික විමර්ශන වාර්තා - 22
- මූලික විමර්ශන පැවැත්වීම සඳහා පත් කරන ලද සංඛ්‍යාව - 42
- අනිවාර්ය නිවාඩු /ස්ථාන මාරුවීම් / වැඩතහනම් කරන ලද සංඛ්‍යාව - 26
- විනය පරීක්ෂණවලට යටත්ව නැවත සේවයේ පිහිටුවීම - 10
- වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇති වාර්තා සංඛ්‍යාව - 14

- නිදහසට කරුණු විමසීම් සංඛ්‍යාව - 47
- නිදහසට කරුණු විමසීමට අදාළව තීරණ දැනුම් දීම - 36
- නිකුත් කරන ලද චෝදනාපත්‍ර සංඛ්‍යාව - 72
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවන ලද චෝදනා පත්‍ර කෙටුම්පත් සංඛ්‍යාව - 06
- සංශෝධනය කරන ලද චෝදනා පත්‍ර සංඛ්‍යාව - 22
- පත් කරන ලද විනිශ්චය සභා සංඛ්‍යාව - 13
- පරීක්ෂණ මණ්ඩල වෙත, පැමිණිල්ල මෙහෙයවන නිලධාරි/චුදිත වෙත අදාළ ලේඛන ලබා දීම - 23
- ලබා දී ඇති විනය නියෝග සංඛ්‍යාව -112
- රාජ්‍යසේවා කොමිෂන් සභාව වෙත යවා ඇති විනය නියෝග කෙටුම්පත් සංඛ්‍යාව - 09
- සේවයෙන් පහ කරන ලද සංඛ්‍යාව - 05
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇති 3 වන පරිශිෂ්ට සංඛ්‍යාව - 19
- අභියාචනා තීරණ දැනුම් දීම - 08
- අවසන් කර ඇති ලිපිගොනු සංඛ්‍යාව - 103
- ක්‍රියා කිරීමට ඇති ඉතිරි විනය ගොනු සංඛ්‍යාව - 705

2.1.1.3.4. ඉදිරි සැලසුම්

- විෂය දැනුම සහිත විමර්ශන කළමනාකරුවෙකු පූර්ණකාලීනව අංශය සඳහා අනුයුක්ත කර ගැනීම හා සංචිතය සඳහා විමර්ශන කළමනාකරුවන් පුරප්පාඩු දිස්ත්‍රික්ක සඳහා බඳවා ගැනීම.
- අංශයේ කාර්යාල පරිශ්‍රය වැඩි දියුණු කිරීම.
- වර්ෂය තුළ ආරම්භ කරන ගොනුවලින් 50%ක් වර්ෂය තුළ අවසන් කිරීම.
- අංශයේ නිලධාරීන්ගේ කාර්යය සාධනය ඇගයීමේ ක්‍රමයක් හඳුන්වා දීම.
- සියළු කාර්යය මණ්ඩලය වෙත පරිපාලන නීතිය හා විනය කාර්යය පටිපාටිය පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා දීම.
- වැඩ අවසන් ගොනු
- ක්‍රමානුකූලව බැහැර කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

2.1.1.4. විශ්‍රාම වැටුප් අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගෙන් මුල් සේවා හා නව සේවා මනාපය පල කරමින් අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් හිමිකම් ප්‍රධානය කිරීම විශ්‍රාම වැටුප් ඒකකය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

මේ අනුව 2019 වර්ෂයේ අගොස්තු මස 01 වන දින සිට දෙපාර්තමේන්තුවේ පාලන අංශය යටතේ මෙම ඒකකය ස්ථාපිත කරන ලදි. එතැන් සිට මේ දක්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ හා අමතර වශයෙන් ලබා දී ඇති උපදෙස්වලට අනුගත වෙමින් සමෘද්ධි නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පිළිගැන්වීම ක්‍රියාත්මක කරන ලදි.

මෙහිදී අධිකාරියක් තුල කටයුතු කරමින් ඒ අනුව පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරමින් කටයුතු කල ආයතනික ක්‍රියාවලිය තුල පොදු 53 වර්යා සටහන ආදිය මුල් පත්වීමේ දින සිට නිලධාරියා විශ්‍රාම යන / මිය යන දිනය දක්වා පත්වීමට අදාල සියළු තොරතුරු ක්‍රමානුකූලව ඇතුලත් කරමින්, සටහන් කිරීම ඇතැම්

අවස්ථාවල ගැටළු සහගත තත්ත්වයක පැවති අතර, මෙම කරුණු නිරාකරණය කර ගැනීම සඳහා දැඩි වෙහෙසක් දැරීම සියළු නිලධාරීන් මුහුණ දුන් අභියෝගයක් විය.

මෙම සියළු කාරණා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ, අණ පනත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා ගලපා ගනිමින් 2019 වර්ෂයේ ආරම්භ කල මෙම ඒකකය මගින් 2022.12.31 දිනට විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන් 1812 අතරින් නිලධාරීන් 1342 දෙනෙකුට අදාල ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර, ඒ අතරින් නිලධාරීන් 1212 ක් මේ වන විට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබමින් සිටියි.

මෙම කාර්යය කාර්යක්ෂමව හා යාවත්කාලීනව පවත්වා ගෙන යාම සඳහා නිරන්තර ප්‍රගති සමාලෝචන හා Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද වැඩසටහන්ද ඉවහල් විය.

2.1.1.4.1. විශ්‍රාම වැටුප් ගෙවීමේ ප්‍රගතිය 2022.12.31 දිනට

සංඛ්‍යා සටහන - (I)

අනු අංකය	කාරණය	විශ්‍රාම ගිය සංඛ්‍යාව	මිය ගිය සංඛ්‍යාව	එකතුව
1	විශ්‍රාම ගිය සංඛ්‍යාව	1402	410	1812
2	නිලධාරීන් විසින් අවශ්‍ය තොරතුරු ලබා නොදීම මත ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි ගොණු සංඛ්‍යාව	11	24	35
3	විශ්‍රාම වැටුප් ගෙවිය යුතු මුළු සංඛ්‍යාව	1391	386	1777
*4	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	1152	190	1342
5	විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා තවදුරටත් සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ඉතිරි සංඛ්‍යාව	239	196	435
*4	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කළ සංඛ්‍යාව	1152	190	1342
2022.12.31 දිනට සමස්ත ගෙවීම් එකතුව		1060	152	1212
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගෙවීමට ඉතිරි		92	38	130

2.1.1.5. නීති අංශයේ කාර්යභාරය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළුම අංශයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන නෛතික කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම, නෛතික සහාය ලබා දීමත්, දෙපාර්තමේන්තුවේ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති නිලධාරීන් හා ප්‍රතිලාභීන් නීතිමය වශයෙන් සවිබලගැන්වීම සඳහා මැදිහත් වෙමින් ඵලදායීතාවය ඉහළ නැංවීමත්, දෙපාර්තමේන්තුව විසින් හා දෙපාර්තමේන්තුවට එරෙහි කටයුතුවලදී නීතිපති දෙපාර්තමේන්තුව හා නිසි සම්බන්ධීකරණය සිදු කිරීමත් නීති අංශයේ කාර්යභාරය වේ.

2.1.2. සමාජ සුබසාධන අංශය හා සමාජ ආරක්ෂණ අරමුදල

2.1.2.1. සමාජ සුබසාධන වැඩසටහන

2.1.2.1.1 හැඳින්වීම

දිළිඳුකම පිටුදැකීමේ මූලික පරමාර්ථය කේන්ද්‍රකර ගනිමින් ක්‍රියාත්මක වන රජයේ ප්‍රධාන සුබසාධන වැඩසටහන ලෙස 1994 සිට මේ දක්වා සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක වෙමින් පවති.මෙම ව්‍යාපාරය ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය හා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ලෙස ආයතන දෙකක් යටතේ ක්‍රියාත්මක වූ අතර සහනාධාර වැඩසටහන සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක විය.

එමෙන්ම 2013 අංක 01 දරණ දිවිනැගුම පනතින් ස්ථාපනය කරන ලද දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 අංක 02 දරණ සමෘද්ධි පනත හරහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ලෙස සංශෝධනය විය. ඒ අනුව සහනාධාර වැඩසටහන මෙම දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ හා සුබසාධන අංශය යටතේ දැනට ක්‍රියාත්මක වේ.

2.1.2.1.2 සහනාධාර වැඩසටහනේ ප්‍රධාන අරමුණු

- දිළිඳු ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාදීම හා සංවර්ධන අවශ්‍යතා සඳහා ඔවුන් පෙළගැස්වීම.
- නිවාස ලොතරැයි අරමුදල සඳහා දායක කර ගැනීම.
- අනිවාර්යය ඉතුරුම් තුලින් අඩු ආදායම්ලාභියා මූල්‍ය වශයෙන් ශක්තිමත් කිරීම.
- සමාජ ආරක්ෂණ වැඩසටහනට දායක කර ගනිමින් එම පවුල්වල අපේක්ෂිත හා අනපේක්ෂිත අවධානම් අවස්ථාවලදී මූල්‍ය ශක්තිය ලබාදීම.

2.1.2.1.3 සහනාධාර වර්ගීකරණය

සංඛ්‍යා සටහන - (II)

සමෘද්ධි සහනාධාර ව්‍යුහය

පවුලේ සාමාජික සංඛ්‍යාව	සහනාධාර වටිනාකම (රු.)	සහනාධාර දීමනාව බෙදීයන ආකාරය			
		අනිවාර්ය ඉතිරි කිරීම් (රු.)	සමාජ ආරක්ෂණ අරමුදල (රු.)	නිවාස ලොතරැයි අරමුදල (රු.)	ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල(රු.)
04 හෝ 04 ට වැඩි	4500/-	400/-	200/-	100/-	3,800/-
3	3200/-	300/-	150/-	100/-	2650/-
03 ට අඩු	1900/-	170/-	130/-	100/-	1500/-
ආයතනගත	1900/-	-	130/-	100/-	1670/-
සවිබල ගැන්වූ පවුල්	420/-	120/-	200/-	100/-	-

2.1.2.1.4 සමෘද්ධි සහනාධාර පවුල

එකම නිවසක් තුල පදිංචි පියා ඇතුළු අවිවාහක දරුවන් හා එම පවුලෙන් යැපෙන වැඩිහිටියන් හා වෙනත් අය එක පවුලක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

2.1.2.1.5 සමෘද්ධි සහනාධාරලාභී පවුලක් තෝරා ගැනීමේදී සළකා බලනු ලබන ප්‍රධාන නිර්ණායක

i. අධ්‍යාපනය
ii. සෞඛ්‍යය
iii. පවුලේ ආර්ථික මට්ටම
iv. වත්කම්
v. නිවාස තත්වය
vi. පවුලේ ජන විකාශනය

2.1.2.1.6 සහනාධාර අනුමත කිරීම.

වසම් මට්ටමින් ලබා ගන්නා නාමලේඛන සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, ග්‍රාමීය කමිටුවේ නිර්දේශය ලබා, බැංකු කළාප කළමණාකරු විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරනු ලබන ප්‍රතිලාභී ලේඛන සලකා බලා ඉල්ලුම්කරු වෙත සමෘද්ධි සහනාධාර හිමිකම ලබාදීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ඇත.

2.1.2.1.7 අභියාචනා / විරෝධතා

සහනාධාර ලැබීමට තමාට සුදුසුකම් තිබියදීත් නොලැබී ඇති බව හැඟීයන්නේ නම් ඒ පිළිබඳ අභියාචනා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය. එහිදී ගනු ලබන තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ හැකිය.

2.1.2.1.8 සමෘද්ධි සහනාධාර නොලැබී යන අවස්ථා

රජයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක් කරන සාමාජිකයෙකු පවුල් ඒකකය තුළ සිටීම.

i. රජයේ රැකියාවක නිරත වීම හේතුවෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නෙකු පවුල් ඒකකය තුළ සිටීම.
ii. ආදායම් උත්පාදන ක්‍රියාදාමයක් තුළින් ඉහළ ආදායම් උපයන සවිබලගැන්වී ඇති පවුල්.
iii. රැකියා සඳහා විදේශ ගතවී මාස 06 ක් ඉක්මව ගොස් ඇති අය සහිත පවුල්.
iv. ග්‍රාමීය කමිටුව විසින් හඳුනාගනු ලබන සැලකිය යුතු දෛනික ආදායම් ලබන පුහුණු ශ්‍රමිකයන් සහිත පවුල්.

2.1.2.1.9 පූජ්‍ය පක්ෂය වෙත සහනාධාර ලබාදීම

පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාරය වන්නේ තනි පුද්ගලයන්ට හිමි රු.1500/- යේ සහනාධාර වටිනාකමයි. වයස අවුරුදු 18 ට අඩු පූජ්‍ය පක්ෂයට හිමි සහනාධාර මුදල් ආයතනයේ නීත්‍යානුකූල භාරකරුවන්ගේ ගිණුම්වලට බැර කෙරේ. මෙම ආගමික ආයතන රජයේ ලියාපදිංචි විය යුතුය.

2.1.2.1.10 වැඩිහිටි නිවාස/ළමා නිවාස/ආබාධිත නිවාස

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ඇති ප්‍රමාණවත් ආදායමක් නොලබන අය තනි පුද්ගලයන් සේ සලකා රු1500/- ක සහනාධාරයක් නිකුත් කර ඇත.වයස අවුරුදු 18 ට අඩු දරුවන් සඳහා හිමි සහනාධාර අදාළ නිවාස භාර පාලිකාවන් නමින් ලබාදෙන අතර වයස අවුරුදු18ට වැඩි දරුවන් සඳහා කේවල ක්‍රමයට ලබාදේ.

2.1.2.1.11 සහනාධාර මුදල් ප්‍රතිලාභියා වෙත නිදහස් කිරීම

සහනාධාර දීමනා ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය හරහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු මට්ටමින් ලබාදෙන මාසික උපරීම වාර්තා පදනම් කර ගනිමින් ප්‍රධාන කාර්යාලය මගින් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ නිල ජංගම ගිණුම වෙත ඉලෙක්ට්‍රොනිකව මුදල් ප්‍රේෂණය කළ පසු ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් ගිණුම් හරහා මුදල් ගෙවීමට කටයුතු කරයි.

2.1.2.1.12. පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා වියදම. (2018 - 2022)

සංඛ්‍යා සටහන - (III)

වර්ෂය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු).
2018	1,384,021	39,257,773,920.00
2019	1,800,182	44,676,637,360.00
2020	1,770,086	52,471,893,980.00
2021	1,760,485	51,550,652,440.00
2022	1,727,266	63,705,938,820.00

2022 වර්ෂයේ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව

සංඛ්‍යා සටහන - (IV)

අනු අංකය	දිස්ත්‍රික්කය	2022 (ජනවාරි සිට නොවැම්බර් දක්වා)					2022 දෙසැම්බර්				
		420/=	1,500/=	2,500/=	3,500/=	මුළු එකතුව	420/=	1,900/=	3200/=	4,500/=	මුළු එකතුව
		සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව	සංඛ්‍යාව
1	කොළඹ	510	25,746	10,175	16,840	53,271	454	25,586	9,867	15,769	51,676
2	ගම්පහ	3,334	54,173	27,879	51,421	136,807	3,017	55,017	27,055	48,647	133,736
3	කළුතර	3,419	31,721	12,966	22,374	70,480	3,140	31,946	12,614	20,705	68,405
4	මහනුවර	2,308	44,977	17,199	34,055	98,539	2,074	44,960	16,644	32,069	95,747
5	මාතලේ	1,387	23,309	9,856	17,855	52,407	1,292	23,505	9,333	16,738	50,868
6	නුවරඑළිය	4,283	24,404	10,913	13,663	53,263	3,369	25,328	10,599	13,387	52,683
7	ගාල්ල	4,244	29,170	15,453	31,465	80,332	3,654	29,894	15,279	29,215	78,042
8	මාතර	1,222	29,154	13,247	25,762	69,385	1,134	28,856	12,876	24,183	67,049
9	හම්බන්තොට	1,487	20,990	13,434	28,663	64,574	1,377	21,215	12,972	27,467	63,031
10	යාපනය	2	24,842	14,182	39,426	78,452	4	25,047	14,181	39,310	78,542
11	මන්නාරම	236	6,812	4,206	11,586	22,840	237	7,035	4,055	11,340	22,667
12	වව්‍රනියා	299	7,293	4,709	11,271	23,572	283	7,411	4,600	11,023	23,317
13	මුලතිව්	15	7,827	4,883	11,555	24,280	14	8,017	4,694	11,463	24,188
14	කිළිනොච්චි	22	7,652	4,242	11,902	23,818	50	7,593	3,844	11,021	22,508
15	මඩකලපුව	9,131	33,366	18,552	38,234	99,283	8,716	34,604	18,161	36,888	98,369
16	අම්පාර	7,394	33,899	16,412	31,736	89,441	7,249	35,263	15,505	29,424	87,441
17	ත්‍රිකුණාමලය	1,061	21,924	12,094	25,323	60,402	872	22,340	11,545	24,266	59,023
18	කුරුණෑගල	5,512	64,604	32,215	66,115	168,446	5,307	64,328	30,785	62,053	162,473
19	පුත්තලම	588	28,285	11,806	23,200	63,879	675	27,924	11,556	22,331	62,486
20	අනුරාධපුරය	1,739	33,892	14,029	22,494	72,154	1,580	34,404	13,008	20,733	69,725
21	පොලොන්නරුව	1,884	11,067	8,451	14,582	35,984	1,668	11,327	8,057	13,606	34,658
22	බදුල්ල	1,787	31,963	14,934	26,843	75,527	1,632	33,016	14,576	25,473	74,697
23	මොණරාගල	3,869	20,929	12,207	20,341	57,346	3,464	21,617	12,054	19,293	56,428
24	රත්නපුර	5,059	35,375	26,562	55,641	122,637	5,205	35,917	26,198	53,778	121,098
25	කෑගල්ල	4,427	24,529	13,613	27,808	70,377	4,105	24,730	13,290	26,284	68,409
	මුළු එකතුව	**65,219**	**677,903**	**344,219**	**680,155**	**1,767,496**	**60,572**	**686,880**	**333,348**	**646,466**	**1,727,266**

***** 2022 වර්ෂයේ පෙබරවාරි මස සිට අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව සහනාධාර වටිනාකම් වෙනස් කරන ලදි.

******රු.420/- (ආර්ථික වශයෙන් සුවිබල ගන්වා ඇති පවුල්) ප්‍රතිලාභ මුදල **2022** වර්ෂයේ මැයි, ජුනි, ජූලි, සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් යන මාසවල ලබාදී නොමැත.

2.1.2.2. සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන / සමෘද්ධි ජාතික සංවර්ධන භාරකාර අරමුදල

2.1.2.2.1. හැඳින්වීම

අංක 8 දරණ භාරකාර ඔප්පුව මගින් 1997.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි ජාතික සංවර්ධන භාරකාර අරමුදල ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. සමාජ ආරක්ෂණ අරමුදල ලාභ නොලබන පදනමින් සුබසාධන අරමුණ පෙරදැරිව සංස්ථාපනය කොට ඇත. සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ස්වේච්ඡා මාසික දායකත්වය, බැංකු ආයෝජනයන් සහ සමාජ ආරක්ෂණ අරමුදල මගින් පාලනය වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය වැනි ආයතන මගින් ලැබෙන ආදායම් තුලින් සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල ගොඩනැගී ඇත.

2013 අංක 01 දරණ දිවිනැගුම සංවර්ධන පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ දී, සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කටයුතු එලෙසම ක්‍රියාත්මක කිරීම සඳහා මීට සම්බන්ධ කරන ලදී. ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල ලෙස ක්‍රියාත්මක වූ අතර, 2017 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තු නාමය සංශෝධනය වීමත් සමග මෙම අරමුදල සමෘද්ධි ජාතික සංවර්ධන භාරකාර අරමුදල නමින් ක්‍රියාත්මක වේ. සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මගින් අරමුදලේ කළමනාකරණය, පරිපාලනය යන මෙහෙයුම් කටයුතුවලට අදාල තීරණ ගනු ලබයි. එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සිදු කරන රාජකාරිවලට අමතරව මෙම රාජකාරී සඳහා ද අවස්ථාව ලබා දී ඇත.

2.1.2.2.2.අරමුණු

- සමෘද්ධි සහනාධාරලාභීන් සහ සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්, කණ්ඩායම්, අනපේක්ෂිතව හා අපේක්ෂිතව මුහුණ දීමට සිදුවන මූල්‍යමය දුෂ්කරතා අවමකර ඔවුන්ගේ සමාජීය හා ජීවන තත්වය සුරක්ෂිත කිරීම සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම
- සහනාධාරලාභී ප්‍රජාවගේ පෝෂණ මට්ටම ඉහල නැංවීම සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කිරීම තුලින් ඔවුන්ගේ සමාජීය හා ආර්ථික තත්වය නගා සිටුවීමට ක්‍රියා කිරීම.
- අතිරික්ත මුදල් ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරීම තුලින් සහ නිලාවේලී පුහුණු මධ්‍යස්ථානයේ ආදායම ඉහල නැංවීම තුලින් අරමුදල තර කර ගැනීම.

2.1.2.2.3 ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම් පිළිබඳව හැඳින්වීම

සමෘද්ධි ප්‍රතිලාභීන් විසින් ස්වකැමැත්තෙන් දෙනු ලබන මාසික දායකත්ව මුදල හා එම දායකත්ව මුදලින් ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරි වන මුදල් රාජ්‍ය බැංකු වල ආයෝජනය සහ එමගින් උපයා ගන්නා පොලී ආදායම් මගින් මෙම අරමුදල ගොඩනැගී ඇත.

මෙම අරමුදල තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභීන් හා අවාසි සහගත තත්වයන්ට පත්වූ පුද්ගලයන්, කණ්ඩායම් සඳහා ප්‍රධාන වශයෙන් උපත්, නිවුන් දරු උපත්, විවාහ, රෝහල් ගතවීම, මරණ සහ සිප්දොර ශිෂ්‍යත්ව යන අපේක්ෂිත හා අනපේක්ෂිත සිදුවීම් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් වශයෙන් ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.

මීට අමතරව සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයින්, කණ්ඩායම්, ආයතන සඳහා මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර ලබා දෙනු ඇත. තවද එම අරමුදල පරිපාලනය හා කළමනාකරණය සඳහා අවශ්‍ය වියදම් දරනු ඇත.

එසේම අරමුදලට අයත් ස්ථාවර වත්කමක් වන නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය, පොතුවිල් සංචාරක බංගලාව, අභ්‍යන්තර සහ වෙනත් බාහිර ආයතන වෙත නේවාසික පහසුකම්, පුහුණුවීම්, දේශණ, වැඩමුළු සඳහා ලබා දී ඇත.

2.1.2.2.4. ඉලක්ක කණ්ඩායම :-

I. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සමාජිකයන්
II.සමාජයේ අවාසි සහගත තත්වයට පත් පුද්ගලයන්,කණ්ඩායම්,ආයතන

2.1.2.2.4. ක්‍රියාත්මක ක්‍රමවේදය:-

සමෘද්ධි ප්‍රතිලාභීන් තමන්ට හිමි රු.4500,රු.3200, රු.1900 යන සහනාධාර වටිනාකම් අනුව පිළිවෙලින් ස්වකැමැත්තෙන් දෙනු ලබන රු.200/= රු.150/=, රු130/= යන මාසික දායකත්ව උපයෝගී කරගෙන උපත්, නිවුන් දරු උපත්,මරණ විවාහ,රෝහල් ගතවීම්, සහ සිප්දොර ශිෂ්‍යත්ව සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දේ. එම ප්‍රතිලාභී ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව ඉතිරිවන මුදල් ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ආයෝජනය කරනු ලැබේ. මෙම සිදුවීම් අතරින් ප්‍රමාණය නිශ්චිතවම දැක්විය හැකි සිදුවීම වන්නේ සිප්දොර ශිෂ්‍යත්ව පමණි. එනම් වසරකට අ.පොස (සා.පෙ.) සමත්ව උසස් පෙළ හදාරණ සියළුම සමෘද්ධිලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දේ. අනිකුත් සියළුම සිදුවීම් සම්බන්ධයෙන් නිශ්චිත ගණනය කිරීමක් දැක්විය නොහැකි නමුත් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිලාභී ඉල්ලීම් සඳහා චක්‍රලේඛ අනුකූලව ගෙවීම් සිදු කරනු ලැබේ. ඉහත සිදුවීම් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය පහත පරිදි වේ.

2.1.2.2.5. ගෙවීම් ක්‍රියාවලිය

වසම ⟶ කලාප කාර්යාලය (සමෘද්ධි ප්‍රජාමූල බැංකුව) ⟶ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (සමෘද්ධි මූලස්ථානය) ⟶ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කාර්යාලය ⟶ ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල

ඒ අනුව වර්ෂය ආරම්භයේ දී ඊට අදාල මුදල් ප්‍රධාන කාර්යාලයේ සමෘද්ධි සමාජ ආරක්ෂණ අංශය මගින් සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අත්තිකාරම් මුදලක් නිදහස් කරනු ලැබේ. එම අත්තිකාරම් මුදල් උපයෝගී කර ගෙන ප්‍රතිලාභ සඳහා ගෙවීම් කල යුතු අතර, ඉන්පසු අදාල වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.

අදාල සිදුවීම් සඳහා වසම භාර සංවර්ධන නිලධාරියා විසින් නිසි ලෙස සම්පූර්ණ කරන ලද සමාජ ආරක්ෂණ ප්‍රතිලාභී අයදුම්පත් සමග අදාල ලිපි ලේඛන කලාපභාර කළමණාකරු හෙවත් ප්‍රජාමූල බැංකු කලමණාකරු වෙත භාර දිය යුතුය. ඔහුගේ නිර්දේශය සහිත එම අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කලමණාකරු වෙත භාර දිය යුතුය. මූලස්ථාන කළමණාකරුගේ අනුමැතිය ලබා ගත යුතු අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂයභාර නිලධාරි විසින්, සකස් කරන ලද ශිෂ්‍යත්වලාභී නාම ලේඛනය ප්‍රාදේශීය ලේකම් වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී විසින් වියදම් සහතික කිරීමෙන් පසු අදාල ප්‍රතිලාභීන්ට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හරහා ගෙවීම් සිදුකරනු ලබන අතර, තවද 2022 දිස්ත්‍රික් 25 තුලින් තෝරා ගන්නා ලද බැංකු 25 තුල, සමෘද්ධි ප්‍රතිලාභ මාර්ගගත ක්‍රමය හරහා, සමෘද්ධි ප්‍රතිලාභීන්ට මුදල් බැර කිරීමේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. එය සියළුම බැංකු වෙත ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සියළු වසම්වලට අදාලව සිදුකල ප්‍රතිලාභ ගෙවීම් මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුය. ඉන්පසුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සියළු ප්‍රතිලාභ ගෙවීම් සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල මගින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. මේ ආකාරයකට ලබාදුන් අත්තිකාරම් මුදල් ප්‍රමාණවත් නොවේ නම්, සමාජ ආරක්ෂණ අරමුදල මගින් අමතර අත්තිකාරම් ඉල්ලුම් කල හැකිය.

2.1.2.2.6. සමාජ ආරක්ෂණ අරමුදල - වියදම් ඇස්තමේන්තුව 2022

2022 ක්‍රියාකාරී සැලැස්ම අනුව අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලි.3,959.15 කි.

සංඛ්‍යා සටහන - (V)

විස්තරය	ප්‍රධාන කාර්යාලය	දිස්ත්‍රික් ලේකම් කාර්යාල	නිලාවේලි	පොතුවිල්	එකතුව
පුනරාවර්තන වියදම් (රු.මි)	3,871.23	3.00	2.95	0.30	3,877.48
ප්‍රාග්ධන වියදම් (රු.මි)	1.37	76.00	4.30		81.67
එකතුව (රු.මි)	**3,872.60**	**79.00**	**7.25**	**0.30**	**3,959.15**

2.1.2.2.7. ව්‍යාපෘතියේ නිමැවුම

2022.01.01 දින සිට 2022.12.31 දක්වා ඉල්ලුම් කරන ලද ප්‍රතිලාභීන් සඳහා වක්‍රලේඛ අනුකූලව ගෙවීම් සිදුකිරීම සහ සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලයේ අනුමත මාණ්ඩලික පත්‍රිකාවලට අදාල කටයුතු ඉටුකිරීම. වර්ෂය තුල අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් විසින් ඉල්ලුම් කරන ලද නේවාසික පහසුකම්, පුහුණු වැඩමුළු දේශනා ආදීන් සඳහා නිලාවේලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය මගින් අදාල පහසුකම් සැපයීම. මෙම වර්ෂය තුල උපලබ්ධි වූ ආයෝජන ඉහල පොලී අනුපාතයන් යටතේ රාජ්‍ය බැංකුවල ප්‍රති ආයෝජනය සිදු කරන ලදී.

2.1.2.2.8. ලබා ගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය පහත වැටීමට සිදු වන අවස්ථාවල දී මූල්‍යම හා වෙනත් ආධාර සැපයීම තුලින් ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම.
- අ.පො.ස(සා.පෙළ) සමත් අ.පො.ස (උ.පෙළ) හැදෑරීමට වරම් ලද සමෘද්ධි ප්‍රතිලාභී දරුවන්ගේ ද්විතීක අධ්‍යාපනය බිඳවැටීමට ඉඩ නොදී සාර්ථක උසස් අධ්‍යාපනයක් සඳහා දිරිගැන්වීම.
- උපත් සහ නිවුන් දරු උපත් හා රෝග සඳහා මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම තුලින් පෝෂණ මට්ටම ඉහල නංවා සෞඛ්‍ය සම්පන්න සමාජ ආරක්ෂණ පරිසරයක් සඳහා දායකත්වය සැපයීම.
- සමෘද්ධි සහනාධාරලාභීන් සඳහා වූ ප්‍රධානතම සමාජ ආරක්ෂණ ජාලය උදෙසා දායකවීම තුලින් ජනගහන දරිද්‍රතා දර්ශකය පහත හෙළීමට හේතු වී ඇත.
- ඉහල පොලී අනුපාතයන් යටතේ ආයෝජනය කිරීම තුලින් අරමුදලේ මූල්‍ය තත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම.

2.1.2.2.9. අරමුදල මගින් දැනට ඉටුකරනු ලබන කාර්යයන්

සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

- උපත් සඳහා ගෙවීම

  සමෘද්ධිලාභී පවුල් වල පළමු, දෙවන හා තෙවන දරු උපත් සඳහා රු. 10,000/=ගෙවීම් කිරීම.

  ඉහත රු. 10,000/= ට අමතරව නිවුන් දරු උපත් සඳහා පහත පරිදි ගෙවීම් කිරීම

  දරුවන් දෙදෙනෙකුට මාසික රු. 5,000/= බැගින් වර්ෂයක්

  දරුවන් තිදෙනෙකුට වැඩි අවස්ථාවක මාසිකව රු. 10,000/= බැගින් වර්ෂයක්

- විවාහක දීමනා

  සමෘද්ධිලාභී පවුල් වල ප්‍රතිලාභියාගේ හා දරුවන්ගේ විවාහ 02 ක් සඳහා රු. 10,000/=ගෙවීම් කිරීම.

- රෝහල් ගත වීමක දී ගෙවීම

  සමෘද්ධිලාභී පවුල්වල ප්‍රතිලාභියා හෝ කලත්‍රයා සහ පවුලේ අවිවාහක දරුවන් රෝහල් ගත වීමක දී දිනකට රු.350/= බැගින් වර්ෂයේ දින 30 ක් සඳහා රු. 10,500/= ලෙස ප්‍රතිලාභ ගෙවීම් කිරීම.

- මරණයක් සඳහා ගෙවීම-

  සමෘද්ධිලාභී පවුල්වල මරණයක් සඳහා රු. 20,000/=ගෙවීම් කිරීම.

- සිප්දොර ශිෂ්‍යත්ව

  සමෘද්ධිලාභී පවුල්වල අ.පොෂ. (උ.පෙළ) හදාරන දරුවන්ට සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
  දිවයින පුරා විසිරී සිටින සහනාධාරලාභී පවුල්වල අ.පොෂ (උසස් පෙළ) හදාරන සියළුම සිසු දරු දැරියන්ට මසකට රු. 1,500/= බැගින් වසර දෙකක අධ්‍යන කාලයක් සඳහා ශිෂ්‍යත්ව ලබා දේ.

- සමෘද්ධි සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය මගින් අනුමත කරනු ලබන වෙනත් අඩු ආදායම්ලාභීන් ඉලක්ක කරගත් සනීපාරක්ෂක වැසිකිලි ඉදිකිරීම් වැනි සමාජ සංවර්ධන ව්‍යාපෘතිද අවස්ථානුකූලව ක්‍රියාත්මක කරනු ලබයි.

2.1.2.2.10. මාර්ගගත ක්‍රමය (Online) හරහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම

මේ වන විට නියමු ව්‍යාපෘතියක් ලෙස දිස්ත්‍රික් 25 සඳහා, තෝරා ගත් සමෘද්ධි බැංකු 25ක සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ප්‍රධාන කාර්යාල හරහා මාර්ගගත ක්‍රමයට (online) මුදල් ගෙවීම් සිදුවේ.2023 දෙවන කාර්තුවේදි , සමස්ත බැංකු පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට (online) සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම් කිරීමට සැලසුම් කර ඇත.ඒ සඳහා මූලික පුහුණු කටයුතු මේ වන විට අවසන් කරමින් පවති.මෙසේ සමස්ත බැංකු පද්ධතිය හරහා මාර්ගස්ත ක්‍රමයට ප්‍රතිලාභ ගෙවීම් ආරම්භ කිරීම තුලින් ඉතා කෙටි කාලයක් තුල කාර්යක්ෂමව අඩු වියදමකින් අදාල සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ඉලක්ක ප්‍රජාව වෙත ලබා දීම මූලික අරමුණ වේ.

සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල
ප්‍රතිලාභී ගෙවීම් -
2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා

සංඛ්‍යා සටහන - VI

අනු අංකය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	උපත්		විවාහ		රෝග		මරණ		ශිෂ්‍යත්ව		නිවුන්දරු උපත්		එකතුව	
		ප්‍රමා	මුදල රු.ශත	ප්‍රමා	මුදල රු.ශත	ප්‍රමා	මුදල රු.ශත	ප්‍රමා	මුදල රු.ශත	ප්‍රමා	මුදල රු.ශත	ප්‍රමා	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.ශත
1	කොළඹ	124	1,240,000.00	993	9,930,000.00	2,222	8,887,150.00	1,990	39,800,000.00	20,612	30,918,000.00	13	65,000.00	25,954	90,840,150.00
2	ගම්පහ	604	6,040,000.00	2,721	27,210,000.00	9,735	41,416,550.00	4,325	86,500,000.00	56,661	84,991,500.00	12	70,000.00	74,058	246,228,050.00
3	කළුතර	235	2,350,000.00	1,258	12,580,000.00	2,923	10,978,450.00	2,898	57,960,000.00	31,912	47,868,000.00	45	225,000.00	39,271	131,961,450.00
4	මහනුවර	514	5,140,000.00	2,106	21,060,000.00	5,123	19,893,350.00	3,703	74,060,000.00	59,344	89,016,000.00	125	625,000.00	70,915	209,794,350.00
5	මාතලේ	416	4,160,000.00	1,008	10,080,000.00	2,602	9,950,644.00	1,660	33,200,000.00	23,918	35,877,000.00	56	280,000.00	29,660	93,547,644.00
6	නුවරඑළිය	369	3,690,000.00	837	8,370,000.00	1,776	7,508,750.00	1,769	35,380,000.00	25,054	37,581,000.00	43	215,000.00	29,848	92,744,750.00
7	ගාල්ල	394	3,940,000.00	1,669	16,690,000.00	3,592	13,366,050.00	2,830	56,600,000.00	51,972	77,958,000.00	58	290,000.00	60,515	168,844,050.00
8	මාතර	488	4,880,000.00	1,697	16,970,000.00	3,950	14,986,350.00	2,705	54,100,000.00	49,930	74,895,000.00	33	165,000.00	58,803	165,996,350.00
9	හම්බන්තොට	924	9,240,000.00	1,671	16,710,000.00	4,719	19,170,550.00	1,857	37,140,000.00	58,732	88,098,000.00	130	665,000.00	68,033	171,023,550.00
10	යාපනය	1,206	12,060,000.00	1,973	19,730,000.00	4,293	14,752,400.00	1,681	33,620,000.00	53,330	79,995,000.00	150	795,000.00	62,633	160,952,400.00
11	මන්නාරම	504	5,040,000.00	860	8,600,000.00	1,812	4,319,500.00	474	9,480,000.00	17,270	25,905,000.00	23	115,000.00	20,943	53,459,500.00
12	වව්නියාව	546	5,460,000.00	717	7,170,000.00	942	4,594,800.00	463	9,260,000.00	14,829	22,243,500.00	37	185,000.00	17,534	48,913,300.00
13	මුලතිව්	422	4,220,000.00	604	6,040,000.00	8,318	3,209,300.00	385	7,700,000.00	11,499	17,248,500.00	47	235,000.00	21,275	38,652,800.00
14	කිලිනොච්චි	379	3,790,000.00	674	6,740,000.00	9,550	5,561,150.00	490	9,800,000.00	20,347	30,520,500.00	6	30,000.00	31,446	56,441,650.00
15	මඩකලපුව	1,560	15,600,000.00	3,266	32,660,000.00	4,386	17,295,200.00	2,205	44,100,000.00	62,750	94,125,000.00	224	1,120,000.00	74,391	204,900,200.00
16	අම්පාර	1,589	15,890,000.00	2,815	28,150,000.00	7,380	26,198,892.16	2,136	42,720,000.00	72,293	108,439,500.00	115	575,000.00	86,328	221,973,392.16
17	ත්‍රිකුණාමලය	1,323	13,230,000.00	1,696	16,960,000.00	2,481	7,516,000.00	1,235	24,700,000.00	32,233	48,349,500.00	67	470,000.00	39,035	111,225,500.00
18	කුරුණෑගල	1,426	14,260,000.00	3,439	34,390,000.00	9,257	38,758,350.00	6,013	120,260,000.00	111,265	166,897,500.00	164	845,000.00	131,564	375,410,850.00
19	පුත්තලම	695	6,950,000.00	1,422	14,220,000.00	2,348	9,107,900.00	2,091	41,820,000.00	25,412	38,118,000.00	93	465,000.00	32,061	110,680,900.00
20	අනුරාධපුරය	698	6,980,000.00	1,342	13,420,000.00	2,629	10,915,000.00	1,896	37,920,000.00	32,822	49,233,450.00	97	477,670.00	39,484	118,946,120.00
21	පොළොන්නරුව	486	4,860,000.00	749	7,490,000.00	1,851	7,324,150.00	761	15,225,000.00	13,648	20,472,000.00	15	150,000.00	17,510	55,521,150.00
22	බදුල්ල	652	6,520,000.00	1,586	15,860,000.00	4,051	14,923,100.00	2,246	44,920,000.00	43,861	65,791,500.00	62	544,000.00	52,458	148,558,600.00
23	මොණරාගල	593	5,935,000.00	1,449	14,490,000.00	3,642	14,530,300.00	1,370	27,400,000.00	39,191	58,786,500.00	126	630,000.00	46,371	121,771,800.00
24	රත්නපුර	944	9,440,000.00	2,597	25,970,000.00	4,967	20,764,050.00	4,027	80,540,000.00	82,135	123,202,500.00	95	475,000.00	94,765	260,391,550.00
25	කෑගල්ල	242	2,420,000.00	1,323	13,230,000.00	3,145	14,147,900.00	3,055	61,100,000.00	46,705	70,057,500.00	21	105,000.00	54,491	161,060,400.00
	එකතුව	**17,333**	**173,335,000.00**	**40,472**	**404,720,000.00**	**107,694**	**360,075,836.16**	**54,265**	**1,085,305,000**	**1,057,725**	**1,586,587,950**	**1,857**	**9,816,670.00**	**1,279,346**	**3,619,840,456.16**

2.1.2.2.11. ජීවනෝපාය හදිසි මූලාශ්‍රධාර ආධාර වැඩසටහන

වර්තමානයේ රටතුල පවතින ආර්ථික අර්බුධකාරී බලපෑම හමුවේ අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත සහන සැලසීමේ අරමුණින් ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව මගින් ලබාදෙන ලද ණය පහසුකම් යටතේ 2022 වර්ෂයේ මැයි , ජූනි, ජූලි සහ සැප්තැම්බර් , ඔක්තොබර්, නොවැම්බර් යන මාස 06 සඳහා රුපියල් 3,000/= සිට රු.5,000/- දක්වා මාසික දීමනාවක්, පහත සඳහන් ප්‍රතිලාභී කාණ්ඩ සඳහා. ඔවුන්ට අදාල නිත්‍ය දීමනා හා අමතර දීමනා ලබා දෙන ලදි.

01. සමෘද්ධි සහනාධාරලාභීන් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්.

02. නිදන්ගත වගුගඩු රෝගී දීමනා ලබන පුද්ගලයින් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්.

03. වැඩිහිටි දීමනා ලබන පුද්ගලයින් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්.

04. ආබාධිත දිමනා ලබන පුද්ගලයින් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්.

මීට අමතරව 2022 වර්ෂයේ අගොස්තු සහ දෙසැම්බර් යන මාස දෙක සඳහා සෘජු භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් ඉහළ ප්‍රතිලාභී කාණ්ඩ සඳහා අමතර මුදල් ආධාර ලබාදෙන ලදි.

ලෝක බැංකු මූලාශ්‍රධාර (World Bank) යටතේ හදිසි මූලාශ්‍රය ආධාර ලබාදීමේ වැඩසටහනේ ප්‍රගතිය- 2022

සංඛ්‍යා සටහන - (VII)

පවුල් කාණ්ඩය		හඳුනාගත් පවුල් සංඛ්‍යාව	මූලාශ්‍රධාර ලබාදෙන ලද පවුල් සංඛ්‍යාව	ලබාදුන් මුදල (රු.මි.)
1	සමෘද්ධි නිත්‍ය සහනාධාර දීමනාව ලබන පවුල්	1,689,461	1,689,461	10,778.29
2	සමෘද්ධි TOP UP දීමනාව ලබන පවුල්	1,689,461	1,689,461	15,544.30
3	සමෘද්ධි පොරොත්තු ලේඛනගත පවුල්	731,975	726,449	10,512.00
4	වැඩිහිටි පොරොත්තු ලේඛනගත පවුල්	131,152	131,152	1,427.87
5	ආබාධිත පොරොත්තු ලේඛනගත පවුල්	25,072	25,072	232.03
6	වකුගඩු රෝගී පොරොත්තු ලේඛනගත පවුල්	3,232	3,232	28.79
එකතුව		**2,580,892**	**2,575,366**	**39,619.31**

ආසියානු සංවර්ධන බැංකු (ADB) යටතේ හදිසි මූල්‍ය ආධාර ලබාදීමේ වැඩසටහනේ ප්‍රගතිය - 2022

සංඛ්‍යා සටහන - (VIII)

ප්‍රතිලාභී වර්ගීකරණය		හඳුනාගත් පවුල් සංඛ්‍යාව	මූල්‍යාධාර ලබාදෙන ලද පවුල් සංඛ්‍යාව	ලබාදුන් මුදල (රු.මි.)
1. සමෘද්ධි සහනාධාරලාභීන්				
1.1	සමෘද්ධි නිත්‍ය ගෙවීම්	1,702,603	1,670,878	10,580.71
1.2	සමෘද්ධි විශේෂ දීමනා ගෙවීම්	1,702,603	1,670,878	15,303.70
1.3	සමෘද්ධි පොරොත්තු ලේඛන ගෙවීම්	731,975	711,567	10,690.57
	එකතුව	**2,434,578**	**2,382,445**	**36,574.98**
2. වැඩිහිටි ආධාරලාභීන්				
2.1	ජ්‍යෙෂ්ඨ පුරවැසි වයස 100 ට වැඩි			
2.1.1	වැඩිහිටි ආධාරලාභී නිත්‍ය ගෙවීම්	478	363	5.48
2.1.2	වැඩිහිටි ආධාරලාභී විශේෂ දීමනා ගෙවීම්	289	193	1.41
2.2	ජ්‍යෙෂ්ඨ පුරවැසි වයස 70 ට වැඩි			
2.2.1	වැඩිහිටි ආධාරලාභී නිත්‍ය ගෙවීම්	416,667	390,788	2,336.81
2.2.2	වැඩිහිටි ආධාරලාභී විශේෂ දීමනා ගෙවීම්	248,126	276,446	2,116.82
2.2.3	වැඩිහිටි ආධාරලාභී පොරොත්තු ලේඛන ගෙවීම්	132,500	82,529	1,293.48
	එකතුව	**549,645**	**473,680**	**5,754.00**
3. ආබාධිත දීමනාලාභීන්				
3.1	ආබාධිත නිත්‍ය ගෙවීම්	72,000	68,296	1,019.69
3.2	ආබාධිත විශේෂ දීමනා ගෙවීම්	23,837	16,825	128.04
3.3	ආබාධිත පොරොත්තු ලේඛන ගෙවීම්	25,327	22,249	330.88
	එකතුව	**97,327**	**90,545**	**1,478.61**
4. වකුගඩු රෝගී ආධාරලාභීන්				
4.1	වකුගඩු නිත්‍ය ගෙවීම්	39,150	39,006	583.93
4.2	වකුගඩු විශේෂ දීමනා ගෙවීම්	21,003	10,928	123.96
4.3	වකුගඩු පොරොත්තු ලේඛන ගෙවීම්	3,256	4,248	63.72
	එකතුව	**42,406**	**43,254**	**771.61**
මුළු එකතුව		**3,123,956**	**2,989,924**	**44,579.20**

2.1.3. සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය හා මහා සංගම් වැඩසටහන

2.1.3.1. හැදින්වීම

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1996 දී සමෘද්ධි බැංකු සංගම් ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගනුදෙනු අඩු කිරීමටත්, එමගින් ඔවුන් ණය බරින් මුදවාලමින් ලාභදායී ආයතනික රටාවක් ඇතිකිරීමේ අරමුණින්, ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය / මහා සංගමය, ප්‍රාදේශිය මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් හා කලාප මට්ටමින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,089 ක් ක්‍රියාත්මක වේ.

2013 අංක 1 දරණ දිවිනැගුම පනතේ 33 (1) ,33 (2), 33 (9) වගන්ති අනුව බැංකු හා බැංකු සමිති අධික්ෂණය හා නියාමනය සඳහා සමාජිකයින් 8 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවා ඇත. එම කළමනාකරණ මණ්ඩලය විසින් බැංකු හා බැංකු සමිති වෙත කලින් කල විධාන නිකුත් කරනු ලබයි.

2.1.3.2. අරමුණු

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් නියෝග නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියළු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/ මිලට ගැනීම් කටයුතු සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. සමෘද්ධි ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලය රැස් කිරීමට සහාය වීම, කළමනාකරණ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධික්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. සමෘද්ධි ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මගින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.
13. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩසටහන් සඳහා ප්‍රජාමූල බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කිරීම.
14. සමෘද්ධි පනත අනුව (34 වගන්තිය) ස්ථාපිත බැංකු මහා සංගමයේ කටයුතු සඳහා සහාය වීම.
15. සමෘද්ධි බැංකු, සමෘද්ධි බැංකු සමිති, මහා සංගමය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය පරිගණක ජාලගත කිරීමට සහාය වීම.
16. සමෘද්ධි බැංකුවල , සමෘද්ධි බැංකු සමිතිවල නිලධාරීන් හා ප්‍රජා නායකයින් පුහුණු කිරීමට පියවර ගැනීම.

2.1.3.3. බැංකු සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ සාමාජිකත්වය හිමිවේ. ඒ තුළින් ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

සංඛ්‍යා සටහන - (IX)
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකත්ව ප්‍රගතිය - (2010-2022)

වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	පසුගිය වසරට සාපේක්ෂ වර්ධනය	වර්ධනය අනුපාතය %
2010	1,830,840	970,693	2,801,533	213,475	8
2011	1,881,808	987,740	2,869,548	68,015	2
2012	2,079,173	1,078,546	3,157,719	288,171	9
2013	2,199,135	1,121,833	3,320,968	163,249	5
2014	2,389,133	1,214,461	3,603,594	282,626	8
2015	2,503,840	1,253,016	3,756,856	153,262	4
2016	2,543,403	1,248,042	3,791,445	34,589	1
2017	2,624,784	1,266,833	3,891,617	100,172	3
2018	2,680,394	1,276,500	3,956,894	65,277	2
2019	2,913,912	1,399,106	4,313,018	356,124	9
2020	2,751,341	1,341,176	4,092,517	-220,501	-5.1
2021	2,791,244	1,300,942	4,092,186	-331	-0.008
2022	2,811,900	1,303,200	4,115,100	22,914	0.56

2.1.3.4. බැංකු සංගම් තැන්පතු වැඩසටහන

සංඛ්‍යා සටහන - (X)
තැන්පතු (සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා) (2010 – 2022)

වර්ෂය	ගිණුම් සංඛ්‍යාව	ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය	මුදල (රු.මි)	මුදලේ වර්ධනය (රු.මි)
2010	5,505,853	337,999	15,906.77	2,370.12
2011	5,524,025	18,172	18,907.33	3,000.56
2012	6,206,484	682,459	20799.06	1,891.73
2013	6,383,307	176,823	23,916.57	3,117.52
2014	6,822,409	439,102	29,436.10	5,519.53
2015	7,096,317	273,908	36,528.03	7,091.93
2016	7,417,540	321,223	43,716.00	7,187.97
2017	7,800,246	382,706	49,320.02	5,604.02
2018	8,177,216	376,970	55,627.64	6,307.62
2019	8,892,916	715700	65,498.00	9871.00
2020	8,715,703	(177,213)	70,338.00	4,840.00
2021	8,538,191	(177,512)	72,835.00	2,497.00
2022	9,463,470	925,279	93,765.53	20,930.55



2.1.3.5. ප්‍රජාමූල බැංකු ණය වැඩසටහන.

- සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම් සපයාදීම ප්‍රජාමූල බැංකු ණය ක්‍රමය යටතේ සිදුවේ.

- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා ක්ෂණික මුල්‍ය අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී දියත් කර ඇත.

- ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.25,000 සිට රු.1,000,000 දක්වා විවිධ ණය යෝජනා ක්‍රම යටතේ සමෘද්ධි බැංකු මගින් ණය නිකුත් කෙරේ. ඒ අනුව ජීවනෝපාය සංවර්ධන, වගා, වෘත්තිය පුහුණු වැනි ක්ෂේත්‍රයන් සඳහා මෙන්ම ක්ෂණික ණය අවශ්‍යතා වෙනුවෙන් ද ණය නිකුත් කෙරේ.

- නිවාස, පාරිභෝගික, ආපදා වැනි අවශ්‍යතා වෙනුවෙන් බැංකු ණය පහසුකම් ක්‍රියාත්මක වේ. මේ සඳහා රු.25,000 සිට රු. 500,000 දක්වා උපරිම ණය නිකුත් කෙරේ.

- සමෘද්ධි බැංකු ණය වැඩසටහන මගින් සාර්ථක වූ ව්‍යවසායකයින්ගේ ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට රු. 500,000 සිට රු.2,000,000 දක්වා ණය සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති මගින් ‘‘ඉසුර’’ සහ නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රමය යටතේ ණය නිකුත් කෙරේ.

- ක්ෂණික මුල්‍ය අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහණයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති, සමෘද්ධි අරුණළු, සමෘද්ධි මිතුර ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් සඳහා සහනයක් දී ඇත.

- 2022 වසර අවසන් වන විටදී සාමාජිකයින් 11,959,271ක් සඳහා රු.මි. 424,906.65 ක මුදලක් සමෘද්ධි බැංකු ණය ලෙස ලබා දී ඇත.

සංඛ්‍යා සටහන - (XI)
ණය නිකුත් කිරීම (2010 - 2022)

වර්ෂය	සංඛ්‍යාව (සමුච්චිත)	සමුච්චිත මුදාහල ණය මුදල (රු.මි.)	වසර තුල ණය නිකුත් කිරීම (රු.මි)
2010	4,160,596	58,531.61	10,178.88
2011	4,682,822	71,721.04	13,189.43
2012	5,085,275	87,046.00	15,324.96
2013	5,360,115	98,056.00	11,010.00
2014	6,388,489	127,805.40	29,749.40
2015	6,851,459	153,989.65	26,184.25
2016	7,536,257	180,229.25	26,239.60
2017	8,202,461	220,873.20	40,643.95
2018	8,868,512	264,519.13	43,645.93
2019	9,562,062	317,915.26	53,396.13
2020	11,790,396	357,496.70	39,581.44
2021	11,669,343	394,546.41	37,049.71
2022	11,959,271	424,906.65	30,360.24



සංඛ්‍යා සටහන - (XII)
ණය වර්ගීකරණය 2022.12.31 දිනට සමුච්චිත මුදාහල

ණය වර්ගය	මුදල (රු.මි)
වගා	18,921.36
පාරිභෝගික	17,573.79
ස්වශක්ති	11,011.02
ආපදා	20,08.58
ජීවනෝපාය චක්‍රිය	11,396.27
ජීවනෝපාය සංවර්ධන	143,278.17
සමෘද්ධි සම්පත	60,330.37
හදිසි ව්‍යාපාරික ණය	1,673.85
දිවිනැගුම අරුණළු	3,631.64
රන් ප්‍රදීප	14.07
සේවක පාරිභෝගික ණය	1,491.6
සහන පියවර	5,279.59
සමෘද්ධි අභිමාන	676.77
උත්සව අත්තිකාරම් ණය	726.32
නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය	1,790.02
එකතුව	**277,794.84**

ප්‍රස්ථාර සටහන III - ණය වර්ගීකරණය



2.1.3.6. ප්‍රජාමූල බැංකු අතිරික්ත අරමුදල් ආයෝජනය (ස්ථීර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්)

බැංකුවල වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව අතිරික්ත අරමුදල් ප්‍රජාමූල බැංකු සමිති හරහා භාණ්ඩාගාර චක්‍රලේඛන ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කිරීමට අවසර ලබාදී ඇත. මේ මගින් ප්‍රජාමූල බැංකු සමිති මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමද අරමුණ වේ.

සංඛ්‍යා සටහන - (XIII)
සමෘද්ධි ප්‍රජාමූල බැංකු හී අතිරික්ත මුදල් ආයෝජනය කිරීම. (2010 – 2022)

වර්ෂය	මුදල(රු.මී)	වර්ධනය(රු.මී)	වර්ධන ප්‍රතිශතය (%)
2010	27,248	3,209	13%
2011	39,048	11,800	43%
2012	42,098	3,050	8%
2013	55,690	13,592	32%
2014	48,309	-7,381	(13)%
2015	55,906	7,597	16%
2016	68,692	12,786	23%
2017	77,978	9,286	13%
2018	85,942	7,964	10%
2019	95173	9231	10%
2020	89,314	(5859)	6.2%
2021	108,233	18,919	21.18%
2022	149,882	41,649	27.79%



2.1.3.7. ක්ෂුද්‍ර මූල්‍ය අංශය තුළින් ක්‍රියාත්මක ප්‍රවර්ධන වැඩසටහන්

2000 වසරේ සිට ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස අංශයේ උපයාගත් පොලී ආදායම් තුලින් විවිධ සංවර්ධන වැඩසටහන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය ඔස්සේ අඩු ආදායම්ලාභී ප්‍රජාව ඉලක්ක කර ගනිමින් සිදු කිරීම ක්ෂුද්‍රමූල්‍ය අංශයේ ප්‍රධාන අරමුණ වේ. මේ සඳහා අංශය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් පහත පරිදි වේ.

- **අලුත් අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.**

බැංකුවලට ගොනු වී ඇති ගිණුම් හිමියන් සහ අනෙකුත් ජනතාව සඳහා සෑම වසරකම සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව සමෘද්ධි බැංකු මගින් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් හා අලුත් අවුරුදු උත්සවයක් ජන ක්‍රීඩාවලට මුල් තැන දෙමින් සමෘද්ධි බැංකු 1089 පුරා එකම දිනයක් තුල සාර්ථකව ක්‍රියාත්මක කර, සමෘද්ධි බැංකු නාමය හා සේවාවන් පිළිබඳ ජනතාව වෙත පණිවුඩයක් ගෙනයාමට කටයුතු කරන ලදී. එම කාලය තුල තැන්පත් කරන මුදල් සඳහා ගනුදෙනුකරුවන්ට ප්‍රයෝජනවත් හා වටිනාකමකින් ඉහල තිලිණ ලබාදීම සිදු කරන ලදී. මේ තුලින් අදාල කලාප තුල ජනතාව ඒකරාශී වීමත් ප්‍රජාවගේ සංස්කෘතික හැඟීම් ඔප්නැංවීමටත් මෙය අවස්ථාවක් කර ගැනීමට හැකි විය. තවද, සමෘද්ධි බැංකු කටයුතු හා විශ්වාසය තහවුරු කර, අඩු ආදායම්ලාභීන් ඇතුළු ප්‍රජාව තුල සමෘද්ධි බැංකුවෙහි නාමය ප්‍රචලිත කර, ඔවුන් ආර්ථික/ සමාජීය සවිබලගැන්වීමක් අපේක්ෂා කෙරේ.

- **"රන් ප්‍රදීප" රන් උකස් ණය සේවාව**

සමෘද්ධි බැංකු සාමාජිකයින් විසින් හදිසි මුදල් අවශ්‍යතාවය වෙනුවෙන් තමා සන්තයේ පවතින රන් භාණ්ඩ උකස් කර මුදල් ලබාගැනීමේදී ඇති වන දුෂ්කරතා මඟ හරවා සහන පොලි මත කඩිනමින් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට පහසුකම් සැලසීම සිදු වේ. මේ වන විට රත්නපුර, මුලතිව් දිස්ත්‍රික්කවල මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර, ලබා දුන් මුළු ණය මුදල රු.මි.514 ක් වේ. උඩවලව සමෘද්ධි බැංකුව තුල වැඩසටහන ක්‍රියාත්මක වන අතර බැංකු සාමාජිකයින් 543 දෙනෙකුට රු. මිලියන 14කට ආසන්න මුදලක් උකස් අත්තිකාරම් ලබාදී ඇති අතර, දැනට බැංකු සාමාජිකයින් 503 උකස් බේරාගෙන ඇත.

- **සමෘද්ධි ප්‍රජාමූල බැංකු ආශ්‍රිතව "අරුණළු ක්ෂණික ණය" වැඩසටහන**

සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මගින් අරුණළු ක්ෂණික ණය වැඩ සටහන හඳුන්වා දීම. දිවයිනපුරා සියළුම ප්‍රජාමූල සංවිධාන හරහා සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විසින් ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා වෙනුවෙන් අවිධිමත් ක්ෂුද්‍රමූල්‍ය ආයතන/ පුද්ගලයින් මගින් ඉහල පොලි අනුපාතයක් හා විවිධ බැඳීම් මත ලබාගන්නා ණය සඳහා විකල්පයක් ලෙස, සහනදායි හා කෙටිකාලීන ණය මුදල් ලබා ගැනීමට පහසුකම් සැලසීම මෙමගින් සිදුවේ.

- **පුහුණු කටයුතු**

ප්‍රජාමූල බැංකු ජාලයේ 1089 ක හා ප්‍රජාමූල බැංකු සමිති 334 හි සමිතිවල සේවය කරන කාර්ය මණ්ඩල සඳහා සඳහා බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරීම් ප්‍රජාමූල බැංකු අරමුදල් මගින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධීකරණය සිදුකරයි.

ගනුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් සැපයීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරීම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මූලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුටම ලබා දීමට කටයුතු කරයි. මෙයට අමතරව ප්‍රජාමූල බැංකු කටයුතු හා ප්‍රජාමූල බැංකු සමිතියේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු ප්‍රජාමූල බැංකු/ බැංකු සමිතියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට කටයුතු කර ඇත.

- **කළමනාකරණ තොරතුරු ඒකකය**

1089 ක් වූ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මඟිනි. ඒ අනුව සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක්ම මාසිකව තම බැංකු ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල පවතින තත්ත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව සමෘද්ධි ප්‍රජාමූල බැංකු ඇගයීම් සිදු කිරීමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතියෙහි තොරතුරු ක්ෂුද්‍රමූල්‍ය අංශය වෙත සම්ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් ප්‍රජාමූල බැංකු පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. සමස්ත බැංකු පද්ධතිය තිරසාර මූල්‍ය ඒකක බවට පත්කිරීමේ අරමුණ ඇතිව මෙන්ම සේවක අභිප්‍රේරණය අපේක්ෂාවෙන් බැංකු ශ්‍රේණිගත කිරීම හා ඇගයීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. එම වැඩසටහන සෑම වර්ෂයක් පාසාම වැඩිදියුණු කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2.1.3.8. 2022 වර්ෂයේ ලභා කරගත් ප්‍රධාන ප්‍රතිඵලයන්

1. කොටස් මුදල් ප්‍රමාණය රු.ද.ල.1,206.50 කින් වර්ධනය කර ගැනීම.
2. සමෘද්ධි බැංකුවල සාමාජික සංඛ්‍යාව 22,914 කින් වර්ධනය කර ගැනීම.
3. සියළුම තැන්පත් ප්‍රමාණය රු.ද.ල.20,794.00 කින් වර්ධනය කර ගැනීම.
4. 2022 වර්ෂය තුල පමණක් රු.ද.ල.30,408.15 ක ණය මුදල් ලබාදීමට හැකියාව ලැබීම.
5. සමෘද්ධි පනත අනුව ක්‍රියාත්මක මට්ටමින් ස්ථාපිත කළ බැංකු මහා සංගමය හා ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ රු.ද.ල. 7873 ක ලාභයක් ලබාගත හැකිවීම.
6. සමෘද්ධි බැංකුවල ලාභදායි බැංකු ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව බැංකු 790 සිට 986 දක්වා වැඩිකර ගත හැකි වීම.
7. සමෘද්ධි බැංකුවල ලාභදායිත්වය රු.බිලියන 5.6 ක් දක්වා වර්ධනය කර ගත හැකි වීම. (විගණනයට යටත්ව)
8. ප්‍රජාමූල සංවිධාන හරහා ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්ට "අරුනළු" ක්ෂණික ණය ක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
9. අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා 6% ක් පොලි ප්‍රතිශතයක් ලබාදිය හැකිවීම.
10. ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන නැවත හඳුන්වාදිය හැකිවීම
11. බැංකු අධීක්ෂණ ඒකකය නැවත ස්ථාපිත කල හැකිවීම.
12. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ලියාපදිංචිය අවසන් කිරීම.
13. සියළුම බැංකු සමිති පරිගණක ජාලගත කිරීම සිදු කිරීමට කටයුතු කිරීම.
14. බැංකු ඇගයීමේ ක්‍රමවේදයන් සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම.
15. සමෘද්ධි පනත අනුව ඉලක්ක ලබා දී ඒ අනුව නිලධාරීන් හා ප්‍රතිලාභීන් ඇගයීමට ලක් කිරීම.

2.1.4. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

2.1.4.1 හැඳින්වීම

අප රට මුහුණ දී ඇති ආර්ථික හා මූල්‍ය අර්බුදයන් හමුවේ 2022 වර්ෂයේදී ද සමෘද්ධිලාභීන් සවිබලගැන්වීමේ වැඩසටහන අභියෝග රැසකට ලක් වූ බව ප්‍රථමයෙන් පෙන්වා දිය යුතුය.

වාර්ෂිකව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද ජීවනෝපාය වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් සමෘද්ධිලාභී පවුල්වල මාසික ආදායම වඩාත් වර්ධනය කරමින් ඔවුන් සවිබලගන්වා සහනාධාර මානසිකත්වයෙන් මුදවාලීමේ අරමුණට ගමන් කිරීමට නොහැකි විය.

එසේ වුව ද වත්මන් රටෙහි පවත්නා ආර්ථික අර්බුද හමුවේ වඩාත්ම බලපෑම් එල්ල වන ප්‍රජාවක් වූ සමෘද්ධිලාභී පවුල්වල ආහාර අවශ්‍යතාවයට කඩිනමින් විසඳුම් ලබාදීම අප දෙපාර්තමේන්තුවේ වගකීම වූ බැවින් භාණ්ඩාගාරය විසින් අප ආයතනයට වෙන් කරන ලද සීමිත ප්‍රතිපාදන තුළින් රු. මි. 44 ක් ජීවනෝපාය වැඩසටහන සඳහා ලබා දෙන ලදි.

එමෙන්ම ආහාර අර්බුදයට මුහුණපා සිටින සමෘද්ධිලාභී පවුල් වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතු සමාජ ආරක්ෂණ අරමුදල් හරහා ද රු. මි. 22 ක සීමිත මුදල් ප්‍රමාණයක් 1 අදියර යටතේ වෙන් කරවා ගැනීමට ජීවනෝපාය අංශයට හැකියාව ලැබුණු අතර යම් පමණකින් හෝ ප්‍රතිලාභීන්ට සහාය වෙමින් පහත පරිදි 2022 වර්ෂයේ ජීවනෝපාය වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව 2021 වර්ෂයේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි / අඩු ආදායම්ලාභී පවුල් 200,000ක් සවිබලගැන්වීම් වැඩසටහන යටතේ නිම කරන ලද ජීවනෝපාය ව්‍යාපෘති වෙනුවෙන් රු. මි 606.28 ක අතැති බිල්පත් පියවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණය ලබාදීමට 2022 වර්ෂයේදී කටයුතු කරන ලදී.

එමෙන්ම 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ ක්‍රියාත්මක වූ **"හරිත දැයක්"** ජාතික කෘෂි ගෙවතු වගා වැඩසටහන යටතේ පැල නිෂ්පාදනය කරන ලද සමෘද්ධි පැල තවාන්කරුවන් වෙනුවෙන් ගෙවීම් කිරීමට තිබූ රු. මි. 104.27 ක අතැති බිල්පත්වලට අදාල ප්‍රතිපාදන, අප අමාත්‍යාංශය හරහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන්ද ක්‍රියා කළ බව පෙන්වා දෙමි.

2.1.4.2. භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

01. " හරිත දැයක්" ජාතික ගෙවතු වගා සංග්‍රාමය

කොවිඩ් -19 වසංගතයත් , ගෝලීය මූල්‍ය අර්බුදය හේතුකොට ගෙන රට මුහුණ දී ඇති උග්‍ර මූල්‍ය අර්බුදයෙන් සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් සමගින් කෘෂි කාර්මික ප්‍රජාව ආරක්ෂාකර ගැනීම සඳහා කාබනික පොහොර භාවිතයෙන් වී, එළවළු ඇතුළු කෘෂි භෝග ආහාර නිෂ්පාදනය ඉලක්ක කර ගනිමින් අප අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ 08ක ඒකාබද්ධ **"හරිත දැයක්"** ජාතික ගෙවතු වගා සංග්‍රාමය 2022 යල කන්නයේදී ආරම්භ කරන ලදී.

මෙම ජාතික වැඩසටහන යටතේ අප දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුව බීජ සැකසුම් මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන වම්බටු, තක්කාලි. මාලු මිරිස්, මිරිස් හා වැරණිය මිරිස් යන බීජ කට්ටල දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හරහා ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය කාර්යාල වෙත භාරදීම. සමෘද්ධි පැල තවාන්කරුවන් හරහා එම බීජ රෝපණය කර තවාන් පැල සැපයීමේ වගකීම හා ගෙවතු වගාව සඳහා අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය ඇතුළු සහාය සේවාවන් ලබා දෙන ලදී.

එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන - (XIV)

වැඩසටහන	ව්‍යාපෘතිය	වෙන් කල ප්‍රතිපාදන (රු. මි)	නිමි වැඩසටහන් /වැඩමුළු	වියදම (රු. මි)	ප්‍රතිලාභී සංඛ්‍යාව
හරිත දැයක් ජාතික කෘෂි ගෙවතු වගා සංගාමය	1.1එළවළු බීජ ප්‍රවාහනය සදහා	0.33	වැඩසටහන් 01 (දිස්ත්‍රික්ක 23)	0.33	12,912
	1.2 කාබනික පොහොර නිෂ්පාදන පුහුණුව ලබාදීම	2.81	වැඩමුළු 429	2.80	12,671
එකතුව		**3.14**		**3.13**	**25,583**

මෙහිදී බීජ ප්‍රවාහනය සදහා වැය වූ ඉන්ධන වෙනුවෙන් අවශ්‍ය මුදල් ලබාදීමත්, කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ට ඒ වෙනුවෙන් අවශ්‍ය පුහුණුව ලබා දීමටත් පළමු කාර්තුව තුළ මුදල් වැය කරන ලදී.

02. ආහාර සුරක්ෂිතතාවය , පෝෂණය හා ආදායම් ප්‍රවර්ධනය

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය පරිදි පළමු කාර්තුවෙන් පසු වෙන් කරන ලද සියළු ප්‍රතිපාදන ශූන්‍ය වූ අතර උග්‍ර මූල්‍ය අර්බුදය හමුවේ තුන්වන කාර්තුව අවසානයේ නැවත වතාවක් භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කරමින් උක්ත වැඩසටහනට අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදි.

මෙහිදී ද ආර්ථික අර්බුදය හමුවේ පීඩාවට පත්වන ප්‍රතිලාභීන්ගේ ආහාර සුරක්ෂිතතාවය ඉලක්ක වූ අතර ඒ අනුව පහත පරිදි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක විය.

සංඛ්‍යා සටහන - (XV)

වැඩසටහන	ව්‍යාපෘති / අයිතමයන්	වෙන්කල ප්‍රතිපාදන (රු.මි.)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ආහාර සුරක්ෂිතතාවය පෝෂණය හා ආදායම් ප්‍රවර්ධනය	2.1 මහ කන්නයේ එළවළු බීජ ලබා දීම.	14.03	බීජ පැකට් 140,120 දිස්ත්‍රික්ක 25	14.02	140,210
	2.2 ධාන්‍ය හා අතිරේක භෝග වගාව	25.83	ව්‍යාපෘති 122 හම්බන්තොට, පුත්තලම	1.39	122
එකතුව		**39.86**	**122**	**15.41**	**140,332**

- මහ කන්නයේ එළවළු බීජ ලබා දීම යටතේ වසමකට සමෘද්ධි ප්‍රතිලාභීන් 10 දෙනෙකු බැගින් ප්‍රතිලාභීන් 140,120 දෙනෙකුට දඹල, බෝංචි, බඩඉරිඟු, මිරිස්, රාබු, තම්පලා, බණ්ඩක්කා, තක්කාලි, මෑ වැනි ප්‍රාදේශීය දේශගුණික කලාපයන්ට උචිත බීජ ලබාදෙන ලදී.
- මෙහිදී බීජ ලබා ගැනීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගන්නෝරුව කෘෂි බීජ සැකසුම් මධ්‍යස්ථානය වෙතින් සිදුවූ අතර එම ආයතනය වෙත රු. මි. 14.02 ක මුදලක් ගෙවන ලදී.

- ධාන්‍ය හා අතිරේක භෝග වගා ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් 18 කට ව්‍යාපෘති අනුමත කර, වැඩ ආරම්භ කිරීමට උපදෙස් ලබා දුන් නමුත් අක් මුදල් නොලැබීම මත ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි විය.
- එසේ වුවද ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිස්ත්‍රික් 2 ක (හම්බන්තොට, පුත්තලම) සමෘද්ධිලාභීන් 122 වෙනුවෙන් රු.මි. 1.39 ක මුදලක් වැය දැරූ අතර, ඒ යටතේ රටකජු, මිරිස් හා මුං ඇට වගා කරන ලදි.

2.1.4.3. සමාජ ආරක්ෂණ අරමුදල් හරහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන

ආහාර සුරක්ෂිතතාව, පෝෂණය හා ආදායම් ප්‍රවර්ධනයට ධාන්‍ය හා අතිරේක භෝග වගාව
රටේ පවත්නා දැඩි මූල්‍ය අර්බුදය හමුවේ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දී තිබුන ද අක්මුදල් නොලැබීම හේතුවෙන් වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා යම් පමණක් හෝ ප්‍රතිලාභ ලබා දිමේ අරමුණ ඇතිව සමාජ ආරක්ෂණ අරමුදල් මණ්ඩලය වෙත ලබා දුන් ව්‍යාපෘති යෝජනාවකට අනුව පළමු අදියරේදි පහත සඳහන් දිස්ත්‍රික් 05ක් වෙත පමණක් රු.මි. 22.49 ක මුදලක් ලබා දෙන ලදි.

ඒ අනුව ධාන්‍ය හා අතිරේක භෝග වගාව වෙනුවෙන් මහ කන්නයේදි පහත සඳහන් පරිදි මුදල් වැය කරන ලද අතර, ආහාර සුරක්ෂිතතාවය හා මාසික ආදායම වැඩිදියුණු කිරීමට අදාලව මෙම වැඩසටහන අඛණ්ඩව ඉදිරියට ගමන් කරනු ඇත.

සංඛ්‍යා සටහන - (XVI)

වැඩසටහන	ව්‍යාපෘතිය	වෙන්කල මුදල (රු.මි.)	වැය කල මුදල (රු.මි.)	වගා කල භෝග	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
ආහාර සුරක්ෂිතතාවය පෝෂණය හා ආදායම් ප්‍රවර්ධනය	ධාන්‍ය හා අතිරේක භෝග වගාව	පොළොන්නරුව 2.86	2.85	මුංඇට, බඩඉරිඟු, උඳු හා රටකජු අක්.100	237
		යාපනය 1.25	1.17	උඳු, කව්පි, කුරක්කන් අක්. 42	114
		අම්පාර 9.19	9.19	මිරිස්, බඩ ඉරිඟු, කුරක්කන් අක්. 381	441
		මාතලේ 2.27	0.84	කුරක්කන්, කෙසෙල් අක්.19	50
		මොණරාගල6.93	6.81	බඩඉරිඟු, වන්නි මිරිස් අක්. 184	184
		එකතුව 22.49	20.86		1,026

ඒ අනුව අස්වැන්න ලබා ගැනිම මාර්තු මස පමණ වන විට සිදුවන අතර, ආදායම් උපයමින් ආහාර සුරක්ෂිතතාවය ඇති කරලීමටත් ඉදිරි කන්න වලදි අවශ්‍ය බිජ තමා විසින්ම සපයා ගැනීමටත් හා අඛණ්ඩව වගාව ඉදිරියට ගෙන යෑමටත් ප්‍රතිලාභීන් මේ වන විට ගිවිසුම් ගත වි ඇත.

2.1.4.4. 2022 අතැති බිල්පත් ගෙවීම

(I.) සමෘද්ධි/ අඩු ආදායම්ලාභී පවුල් 200,000 ක් සවිබලගැන්වීමේ වැඩසටහන

2022 වර්ෂය තුල සමාද්ධි අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂ 2 ක ජීවනෝපායන් වැඩිදියුණු කර මාසික ආදායම ඉහල නැංවිම හරහා ඔවුන් සවිබලගන්වා සහනාධාර මානසිකත්වයෙන් ඔවුන් ඉවත් කිරිම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, එම වර්ෂය අවසාන වන විටත් රටේ පැවැති අයහපත් මූල්‍ය අර්බුදය හමුවේ ව්‍යාපෘති සඳහා අක් මුදල් ලබා දීමට නොහැකි විය.

මේ හේතුවනේ රු.මි. 606.28 ක අතැති බිල්පත් ප්‍රමාණයක් වියදම සඳහා පළමු කාර්තුව තුල රු.මි. 350.00 ක ප්‍රතිපාදන ලබා දීමට හැකියාව ලද අතර, ඉතිරි බිල්පත් ප්‍රමාණය වු රු.මි.256.28 ක ප්‍රතිපාදන 4 වන කාර්තුවේ මැද ලබා දීමට හැකිවිය.

ඒ අනුව ප්‍රගතිය පහත පරිදි වේ .

සංඛ්‍යා සටහන - (XVII)

දිස්ත්‍රික්ක ගණන	අතැති බිල්පත් වල වටිනාකම (රු .)	මේ වන විට දරා ඇති වියදම (රු.)	ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
19	606.28	527.69	10,554	10,554

(II) " හරිත දැයක් " ජාතික ගෙවතු වගා සංග්‍රාමය 2022

ආහාර අර්බුදයට පිළියමක් ලෙස වර්ෂය ආරම්භයේ අප අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ 07 ක් ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද හරිත දැයක් ගෙවතු වගා වැඩසටහන සඳහා අවශ්‍ය පැල නිෂ්පාදනය කරන ලද්දේ සමෘද්ධි/අඩු ආදායම්ලාභී පැල තවාන් වෙතිනි.

මේ වෙනුවෙන් වැයවන ප්‍රතිපාදන ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ පළමු කාර්තුව තුල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී තිබුණද අක් මුදල් නොලැබීම හේතුවෙන් පැල තවාන්කරුවන් දැඩි අපහසුතාවයකට පත්ව තිබුණි.

මේ හේතුවෙන් රු. මි. 104.74 ක අතැති බිල්පත් ප්‍රමාණයක් තිබූ අතර අප අමාත්‍යාංශය හා ඒකාබද්ධව මීට අදාල ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් ලබා ගෙන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදීමට කටයුතු කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු කරන ලදී.

එහි භොතික හා මුල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

සංඛ්‍යා සටහන - (XVIII)

දිස්ත්‍රික්ක	අතැති බිල්පත් වල වටිනාකම (රු .)	වියදම (රු.)	පැල තවාන් සංඛ්‍යාව	ගෙවතුලාභීන් සංඛ්‍යාව
(කොළඹ, කළුතර, හම්බන්තොට, මහනුවර, මාතලේ, පුත්තලම, බදුල්ල, මොණරාගල, කෑගල්ල, රත්නපුර, අනුරාධපුර, අම්පාර, ත්‍රිකුණාමලය,යාපනය, මුලතිව්, කිලිනොච්චිය)	104.74	90.17	4,256	904,402

කෙසේ වුවද 2021.12.31 දින වන විට ගෙවීම් කිරීම සඳහා රු.මි.730.93 ක අතැති බිල්පත් ප්‍රමාණයක් තිබුණද මුල් කාර්තු 2ක තුළ බිල්පත් පියවීමට නොහැකිවීම හේතු කොට ගෙන, ප්‍රතිලාභීන් විසින් තම ව්‍යාපෘතියට ලබාදුන් දායකත්වය ඉවත් කර ගැනීමත් නියමිත මිළ ගණන් යටතේ අදාල ජීවනෝපාය භාණ්ඩ උපකරණ ලබා ගැනීමට නොහැකිවීමත් හා අදාල ආයතන ලබා දුන් උපකරණ නැවත ලබා ගැනීමට කටයුතු කිරීම නිසා අපේක්ෂිත ඉලක්කයට ළඟා වීමට නොහැකි වූ බව පෙනී යයි.

කෙසේ වුවද 2022 වර්ෂය අප රටෙහි ආර්ථික හා මුල්‍ය අර්බුද හමුවේ දැඩි අපහසුතාවයන්ට පත් වර්ෂයක් වූ අතර ඒ හේතුවෙන් ප්‍රතිපාදන භාණ්ඩාගාරය වෙතින් නොලැබුණු බව ක්‍රියාත්මක වැඩසටහන් දෙස බැලීමේදී පෙනී යනු ඇත. එවන් අවස්ථාවක ස්වාධීන අරමුදලක් ලෙස පරිපාලන හා සංවර්ධන වියදම් රැසක් දරමින් විශාල වැඩ කොටසක් සිදු කර ඇත.

ආහාර අර්බුදය උදෙසා කඩිනම් පියවර වර්ෂය පුරා ගෙන ඒමට කටයුතු කල අතර ඒ තුළින් වඩාත් අවදානමට ද ලක් වන සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට මෙම අරමුදලට හැකියාව ලද බව පෙන්වා දිය හැකිය.

2.1.5. ව්‍යවසාය සංවර්ධන වැඩසටහන

අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් මට්ටමින් පවත්වා ගනිමින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික්ක 25 තුළ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

2.1.5.1. අරමුණ

සමෘද්ධිලාභී ව්‍යවසායකයින්ගේ දැනුම කුසලතා වර්ධනය කිරීම,ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන උසස් ප්‍රමිතියෙන් හා නිමාවකින් යුක්තව සිදු කිරීම, ස්ථාවර වෙලඳපළක් ඇති කර ගැනීම, දීප ව්‍යාප්තව භාණ්ඩ විකිණීම හා ප්‍රචාරණය, තෘප්තිමත් පාරිභෝගික ප්‍රජාවක් ගොඩනැංවීම, නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබා ගැනීම හා පරිසර හිතකාමී හරිත රැකියා අවස්ථා සුලභ කිරීම මගින් ව්‍යවසායකයා ආර්ථික හා සාමාජීය වශයෙන් සවිබලගැන්වීම තුලින් ජාතික ආර්ථික වර්ධනයට සෘජුව දායක වීම.

2.1.5.2. 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

1. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය, අළුත්වැඩියා කිරීමේ වැඩසටහන.
2. ව්‍යාපාරික කාන්තාවන් සඳහා වසවිස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව.
3. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන.
4. විශේෂ අලෙවි සංවර්ධන වැඩසටහන.
   2022 වර්ෂයේ දිළිඳුකම පිටුදැකීමේ දිනයට සමගාමීව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා ජාතික සමාජ සංවර්ධන ආයතනය සමග එක්ව සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන්ට ජපන් භාෂාව ඉගැන්වීම සඳහා පාඨමාලා පැවැත්වීමේ වැඩසටහන ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.
5. සෞභාග්‍යා අලෙවි ප්‍රදර්ශණය පැවැත්වීම.

2.1.5.3. සමස්ත ප්‍රගතිය පිලිබඳ සාරාංශය.

සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන් සඳහා 2022 වර්ෂයේදී වැය කර ඇති සමස්ත මුදල රුපියල් මිලියන 11.74 කි.

සංඛ්‍යා සටහන - (XIX)
අලෙවි සංවර්ධන වැඩසටහන - මූල්‍ය හා භෞතික ප්‍රගතිය

	වැඩසටහන	වෙන් කළ මුදල (රු.මි)	වියදම (රු.මි)	ව්‍යාපෘති වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	සමෘද්ධි සුව බොජුන් හල් සහ අලෙවි මධ්‍යස්ථාන අළුත්වැඩියාව	6.97	6.44	7	102
2	වස විස රහිත ආහාර සැකසීම පිළිබඳ පුහුණුව	0.25	0.21	6	478
4	ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	4.91	4.54	276	11,681
5	සෞභාග්‍යා වෙළඳ ප්‍රදර්ශන හා සති පොළ	2.18	0.14	1	38
6.	විශේෂ අලෙවි ඩැඩසටහන	0.50	0.42	23	2,088
එකතුව		**14.81**	**11.74**	**313**	**14,295**

2022 වර්ෂයේ සමස්ත අලෙවි වැඩසටහන සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 30 ක් වුවත්, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරය මගින් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා අපේක්ෂා කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසු විය.

2.1.6. සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන

2.1.6.1.සමාජ සංවර්ධන හා පරිසර අංශය

හැදින්වීම

සමස්ත ශ්‍රී ලාංකික ප්‍රජාව අතරින් විශේෂයෙන් තෝරාගත් සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථිකය, සමාජීය, සංස්කෘතික, මානසික හා කායික වශයෙන් සවිබල ගැන්වීමත් එසේම අනෙකුත් සියළුම ප්‍රජාව තුල ඇති ධනාත්මක සිතිවිලි හා දැනුම, කුසලතා, ආකල්ප තවදුරටත් සංවර්ධනය කර එතුලින් මුළු මහත් ශ්‍රී ලාංකික ප්‍රජාව ලෝකයේ දියුණු රටවල් අතරට ගෙන ඒමට දිරිගැන්වීම හා ළමා, තරුණ, වැඩිහිටි මෙන්ම වැන්දඹු, ආබාධිත හා විසිරි පවුල්වල සාමාජිකයන් හට සතුටින් ජීවත්වීමට හැකි පරිසරයක් ඇති කිරීමට කටයුතු කිරීම හා ඔවුන් දිරිගැන්වීමේ වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම සමාජ සංවර්ධන අංශයේ කාර්යභාරය වේ.

අරමුණු

- විවිධ සමාජීය හේතු නිසා ජීවත්වීමට සුදුසු නිවසක් නොමැති ප්‍රජාවගේ නිවසක අයිතිය සහතික කරමින් ඔවුන්ගේ සමාජීය ජීවිතය සුරක්ෂිත කිරීම.
- මත් හා දුම්වැටි වලට ඇබ්බැහිවී ඇති සාමාජිකයන් සිටින පවුල් වල සංවර්ධන කටයුතු හා සුබසාධනය ඇති කිරීම.
- දිවයින පුරා විසිරි සිටින වයස අවුරුදු 7 -18 සීමාවට අයත් දරුවන් හඳුනාගෙන ඔවුන් කාණ්ඩායම් ගතකර ඔවුන්ගේ සංස්කෘතික හා සාහිත්‍ය හැකියාවන් ඉස්මතු කිරීම, නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම, ජය පරාජය විඳගැනීම හා සුරක්ෂිතභාවය තහවුරු කිරීම.
- අධ්‍යාපන තරඟකාරිත්වය හා නූතන තාක්ෂණ දියුණුවේ ඇති වී ඇති විවිධ මෙවලම්වලට පෙළඹවීම නිසා පොත්පත් පරිශීලනයෙන් ඈත්ව ඇති ළමා පරපුර පොතපත කියවීමට පෙළඹවීම හා ඔවුන්ගේ පරිකල්පනය අවධි කිරීම.
- ප්‍රජාවගේ මනෝ සමාජීය ගැටළු හඳුනාගෙන එවා අවම කිරීම සඳහා සුදුසු වැඩසටහන්ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම හා ඔවුන්ගේ සමාජීය ජීවිතයේ ඵලදායිතාවය සහතික කිරීම.
- සමාජයේ තුරන්වෙමින් පවතින අනෙකාට ගරු කිරීමේ හැදියාව හා ආකල්ප සංවර්ධනය සඳහා ප්‍රජාව පුහුණු කිරීම.
- සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතා කිරීමට ජනතාව පෙළඹවීම.
- ඉහත වැඩසටහන නිසි වේලාවට ඉලක්කගතව ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිඵල ඇගයීම.
- අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ සනීපාරක්ෂක පහසුකම් සලසා දීම.

2.1.6.1.1. ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

(I) සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල කායික මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්

විවිධ සමාජ මට්ටම් වල ජීවත්වන ප්‍රජාව නොයෙකුත් හැලහැප්පීම් ගැටළු මධ්‍යයේ තම දූ දරුවන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය සංස්කෘතිය නගා සිටුවීමට වෙහෙස වෙන අතර ගෘහ ජීවිතය සාර්ථකව පවත්වා ගැනීමට වෙහෙසෙයි. නමුත් මේ සඳහා වැඩි දැනුවත් භාවයක් නොතිබීම හේතුවෙන් අඩු වයස් විවාහ, අඩු අධ්‍යාපනය, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම වැනි හේතු නිසාවෙන් විසිරි පවුල් බිහිව ඇත. පෝෂණයෙන් අඩු දරුවන් බිහිවීම මතට ඇබ්බැහිවූවන් හා දෙමාපියන් වෙනම ජීවත්වීම දික්කසාද වැනි විවිධ ගැටළු ඇති වී ඇත. මෙම ගැටළු නිරාකරණය කර ගැනීමට හා සෞඛ්‍ය සම්පන්න ආහාර රටාවක් වෙනුවෙන් ගෙවතු වගාකිරීමත් ඒ තුලින් වසවිසෙන් තොර ආහාර ලබා ගැනීමට හැකි බවත්, පිරිසිදු බව, පිළිවෙල, කාල කළමනාකරණය, ගෘහ කළමනාකරණය වැනි විවිධ ක්ෂේත්‍ර පිළිබඳව මෙම ප්‍රජාව දැනුවත් කර දැනුම ආකල්ප කුසලතා සංවර්ධනය කර ඔවුන් ඵලදායී පුරවැසියන් ලෙස ජීවත්වීමට දිරිගැන්වීම මෙහි අරමුණ වේ.

(II) ජාත්‍යන්තර දින සැමරීම්

• ලෝක ළමා හා වැඩිහිටි දිනට සමගාමී සමාජ සංවර්ධන වැඩසටහන

වර්තමානයේ පවතින විවිධ ආර්ථික හා සමාජීය ගැටළු හේතුවෙන් සමස්ත දිවයින තුලම අඩු ආදායම්ලාභී ළමා හා වැඩිහිටි ප්‍රජාව ඉතා අයහපත් මානසික මට්ටමක ජීවිතය අත්විඳිමින් සිටී. එයින් ඇතිවන කායික හා මානසික දුබලභාවය නිසාවෙන් අසතුටින් ද ජීවිතය විඳවමින් සිටී. මෙම හේතු මූලික කර ගනිමින් විවිධ වූ වැඩසටහන් ඉදිරිපත් කර ඔවුනගේ කායික හා මානසික සංවර්ධනය ඇති කර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සතුටුදායක අන්දමින් ගෙවීමට හැකියාව ලබා දීමට සමාජ සංවර්ධන අංශයේ සියළු සාමාජිකයින් හා ප්‍රජාව එක්ව කටයුතු සිදුකර ඇත. විවිධ වූ සංස්කෘතික වැඩසටහන්, සෞඛ්‍ය සම්පන්න ආහාර වේල් පරිත්‍යාග කිරීම්, ඇඳුම් පැළඳුම් ලබාදීම, වැඩිහිටි වන්දනා, විවිධ ආගමික වැඩසටහන්, වෛද්‍ය සායන සඳහා යොමු කිරීම් වැනි කටයුතු තුලින් වැඩිහිටි ප්‍රජාව සතුටු සිතින් තැබීම මගින් ඔවුනගේ සෞඛ්‍ය මට්ටම ද යහපත් කිරීමට හැකි බවත්, ළමුන් සඳහා පාසල් උපකරණ ලබා දීම, විවිධ රසවින්දනාත්මක වැඩසටහන් පැවැත්වීම, අධ්‍යාපනික වැඩසටහන් මෙන්ම විවිධ ස්ථාන නැරඹීමට අවස්ථාව සලසා දීම, මත්ද්‍රව්‍ය මගින් සිදුවන හානි මෙන්ම මත්ද්‍රව්‍ය වලක්වා ගැනීම පිළිබඳව දැනුවත් කිරීම, විවිධ තරඟ පවත්වා කුසලතාවයන් එළි දැක්වීමට අවස්ථාව සලසාදීම වැනි විවිධ වැඩසටහන් පැවැත්වීම මගින් මෙම ළමා හා වැඩිහිටි ප්‍රජාවගේ ආකල්ප ධනාත්මකව පවත්වා ගැනීමට හැකියාව ඇත. එයින් සමස්ත දිවයිනේ ජීවත්වන සියළු ප්‍රජාවගේ ජීවිතය සතුටින් ගත කිරීමට මෙම වැඩසටහන මහත් රුකුලක් බවට පත්ව ඇත.

(III) 5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන

Covid 19 වසංගතය හමුවේ මුළු ලෝ වැසියන්ගේ අනාගත අපේක්ෂාවන් බිඳ වැටෙමින් තිබෙන අවස්ථාවක ශ්‍රී ලංකාවාසී මුළු මහත් ජනතාවගේද අනාගත අපේක්ෂාවන් බිඳ වැටුනි. මෙහිදී සමස්ත ආර්ථික ක්‍රියාවලියම විශාල බලපෑමකට ලක්වීමෙන් සියළු ප්‍රජාවගේ ආදායම් තත්වය පහත වැටුණි. මෙහිදී විශාල වශයෙන් අධ්‍යාපනය කෙරෙහි බලපෑමක් එල්ලවූයේ පන්ති බේදයකින් තොරව වීමත් විශේෂත්වයකි. පාසල් පැවැත්වීම, පෞද්ගලික පන්ති පැවැත්වීම සඳහා විවිධ බාධා එල්ලවීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය ඉතා දුර්වලවීම ආරම්භ විය. මෙම කරුණ සැලකිල්ලට ගත් සමෘද්ධි සමාජ සංවර්ධන අංශය මේ සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කරන ලදී. 5 වසර ශිෂ්‍යත්ව දරුවන් වෙනුවෙන් පෙරහුරු වැඩසටහනක් මුළු දිවයිනම ආවරණය වන පරිදි සමාජ සංවර්ධන පවුලේ සියළු සාමාජිකයන් එක්ව ප්‍රජාවගේ දායකත්වය ඇතිව 5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා ගුරු මහත්ම මහත්මීන්ගේ විශාල දායකත්වයක් ලබා ගැනීමට හැකියාව ලැබුණි. දරුවන්ගේ හා දෙමාපියන්ගේ නොමසුරු සහයෝගය සමස්ත දිවයිනෙන්ම ලබා මෙම වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.

(IV) දිළිඳුකම පිටුදැකීමේ දින වැඩසටහන

සමෘද්ධි වැඩසටහන ප්‍රජාව පිළිබඳව මනා අවබෝධයෙන් කටයුතු කරනු ලබන බැවින් මේ සඳහා වත්මනට ගැලපෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ විශේෂ හැකියාවන් වලින් පන්නරය ලබා ඇති බැවින් මේ සඳහා පෙර පාසල් දරුවන් මූලික කර ගනිමින් වැඩසහනක් ක්‍රියාත්මක කරන ලදී. දරුවන්ගේ උදෑසන ආහාර වේල මෙන්ම කොළ කැඳ වීදුරුවක් ලබා දීමෙන් පෝෂණ තත්වය ඉහල දැමීම මගින් දරුවන්ගේ මෙන්ම දෙමාපියන්ගේ ද මෙම අසහනකාරී තත්වයෙන් මුදා ගැනීමට මෙම වැඩසටහන ඉවහල් විය. මේ සඳහා සමෘද්ධි වැඩසටහන මෙන්ම ධානපතියන්ගේ මෙන්ම සියළු ප්‍රජාවගේ සහයෝගය ලබා ගැනීමට හැකිවී ඇත.

(V) පිවිතුරු සයුරක් වැඩසටහන

MV PERL X-PRES නෞකාව නිසා ඇතිවූ පාරිසරික හානිය පාලනය කිරීම සඳහා පිවිතුරු සයුරක් වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දියත් කළ වැඩසටහන පරිසර හානිය වලක්වා ගැනීමට මහත් රුකුලක් විය. මේ සඳහා වෙරළ රැකබලාගන්නන් ලෙස කටයුතු කළ සමෘද්ධිලාභීන් බල ගැන්වීමට සඳහා කටයුතු කර ඇත. මේ සඳහා 195 දෙනෙකු පමණ සහභාගි වී ඇත.

(VI) දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම්

සමෘද්ධි සමාජ සංවර්ධන වැඩසටහන මුළු දිවයිනම ආවරණය වන පරිදි පවත්වන වැඩසටහනක් බැවින් මූලිකවම අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික හා සුබසාධන අවශ්‍යතා ඉටුකරමින් පවතී. මෙහිදී මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා දිවයින පුරා විසිරී රාජකාරී කරනු ලබන නිලධාරීන් සමස්ත දිවයිනේම වැඩසටහන් පිළිබඳව අවබෝධයෙන් සිටිය යුතුය. ප්‍රජාවගේ අවශ්‍යතා හා ඒවා ඉටුකරන ආකාරය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන බැවින් කිසියම් අවබෝධයක් මෙතුලින් ලබා ගත හැක. මෙහි දී ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන්, ජත්‍යන්තර මත්නිවාරණ වැඩසටහන්, ජාත්‍යන්තර සාක්ෂරතා දින වැඩසටහන්, ලෝක ළමා හා වැඩිහිටි දින වැඩසටහන්, දිළිඳුකම පිටු දැකීමේ දින වැඩසටහන හා නිවාස හා සනීපාරක්ෂක වැනි විශේෂ වැඩසටහන් මෙන්ම කාලීනව ප්‍රජාවගේ අවශ්‍යතාවය මත නිර්මාණය කර ඉදිරිපත් කරන වැඩසටහන් වල සමස්ත ප්‍රගතිය හා එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන් මුහුණපාන ගැටළු හා ඒවා නිරාකරණය කර ගත හැකි ක්‍රම මෙන්ම නව දැනුවත් කිරීම් මෙම ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් සමස්ත නිලධාරීන් වෙත ලබා දිය හැක.

අංශයේ සමස්ත ප්‍රගතිය පිළිබඳ සාරාංශය - 2022
සංඛ්‍යා සටහන - (XX)

අනු අ	දිස්ත්‍රික්කය	ජාත්‍යන්තර දින වැඩසටහන					පිවිතුරු සයුරක් වැඩසටහන (ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රා.ලේ.කොා.
		සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල කායික මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන	ලෝක ළමා හා වැඩිහිටි දින	5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු	දිළිඳුකම පිටුදැකීමේ දින	
1	කොළඹ			968	6		
2	ගම්පහ			7926	13	65000	
3	කළුතර			1239	15	350000	
4	මහනුවර			7412			
5	මාතලේ			7562	15	45000	
6	නුවරඑළිය			678			
7	ගාල්ල			4273	30	110000	
8	මාතර			3020	18	80000	
9	හම්බන්තොට			12539	12	59995	
10	යාපනය				17	450000	
11	මන්නාරම			187	5	25000	
12	වව්නියාව					12000	
13	මුලතිව්					20000	
14	කිලිනොච්චිය				8		
15	මඩකලපුව			3777	37	61370	
16	අම්පාර					55000	
17	ත්‍රිකුණාමලය			652			
18	කුරුණෑගල			9427	43	150000	
19	පුත්තලම			3597	4		
20	අනුරාධපුරය			1966	9		
21	පොළොන්නරුව			8	7	35000	
22	බදුල්ල			2295	15		

අනු අංකය	දිස්ත්‍රික්කය	ජාත්‍යන්තර දින වැඩසටහන					පිවිතුරු සයුරක් වැඩසටහන (ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ප්‍රා.ලේ.කොා.
		සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල කායික මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන	ලෝක ළමා හා වැඩිහිටි දින	5 වසර ශිෂ්‍යත්ව පෙරහුරු	දිළිඳුකම පිටුදැකීමේ දින	
23	මොණරාගල			1116	නැත		
24	රත්නපුරය			1360	6		
25	කෑගල්ල			3621	13	55000	
➢	මුළු වැඩසටහන් සංඛ්‍යාව	6	19	280	273	332	
➢	සහභාගි වූ සංඛ්‍යාව			73623	36535	30488	195
➢	ප්‍රා.සංවිධානයෙන් ලබා දුන් මුදල			8,364,311	544,351		
➢	අනෙකුත් ලැබීම් මුදල			12416235	1485317		
➢	භාණ්ඩාගාර ප්‍රතිපාදන	1.53	0.17	0.4168	3.823	1.573	0.118

2.1.6.2. නිවාස ලොතරැයි වැඩසටහන

2.1.6.2.1. හැඳින්වීම

සමාජ සංවර්ධන අංශය මගින් 2022 වසරේදී ප්‍රධාන වැඩසටහන් 02 ක් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

1. සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන
2. සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන

සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන

2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය මගින් සලසා ඇති ප්‍රතිපාදන මගින් 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරී පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල රෙගුලාසි මාලාවකට අනුව ක්‍රියාත්මක කොට නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම පවත්වාගෙන යනු ඇත.

සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක් සඳහාම ස්ථීර නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල පවත්වාගෙන යනු ලැබේ.

මෙම අරමුදල ගොඩනංවා ඇත්තේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වලට ලබාදෙනු ලබන සහනාධාර මුදලින් මාසිකව රු. 100/-ක මුදලක් නිවාස ලොතරැයි අරමුදලට බැර කිරීමෙනි. සමෘද්ධි නිවාස ලොතරැයි අරමුදල රෙගුලාසි මාලාවකට අනුකූලව ක්‍රියාත්මක වන අතර, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමත කර ඇත.

එම නිලධාරී මණ්ඩලය පහත පරිදි වේ.

- විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් (සභාපති)
- විෂයභාර අමාත්‍යාංශයේ තවත් එක් නියෝජිතයෙක්
- විෂයභාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
- දෙපාර්තමේන්තුවේ සහනාධාර විෂයභාර අධ්‍යක්ෂවරයා
- සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ නියෝජිතයෙක්

- සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ නියෝජිතයෙක්
- ප්‍රධාන ගණකාධිකාරී
- විෂයභාර අංශයේ අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ
- විෂයභාර කළමනාකරු

(I) සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීම.

අරමුණු

01. සෑම සමෘද්ධි ප්‍රතිලාභී පවුලක්ම සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහනට දායක කර ගැනීම.

02. සෑම මසකම සමෘද්ධි ලොතරැයි දිනුම් ඇදීමක් සිදුකොට ප්‍රතිලාභී පවුල් 335ක් සඳහා රු. ලක්ෂ 2 බැගින් නිවාස ත්‍යාග 335ක් ලබා දෙමින් වාර්ෂිකව පවුල් 4,020කගේ නිවාස ප්‍රශ්නය විසඳීම තුළින් ප්‍රතිලාභී පවුල්වල ස්ථීර නිවාස ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබාදීම.

03. මාසිකව පිරිනමන නිවාස දිනුම් 335 ලබා දීමෙන් පසු ඉතිරි වන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම, විශේෂ නිවාස ලබාදීම හා දේශීය මුදල් වෙළඳපලේ වඩාත් ඵලදායී ලෙස ආයෝජනය තුලින් ලැබෙන ආදායම යලිත් මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම.

පරමාර්ථ

01. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල සුබසාධනය වැඩි කිරීම සඳහා ඔවුන්ගේ තාවකාලික නිවාස ප්‍රශ්නයට ස්ථීරසාර විසඳුමක් ලබාදීම.

02. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම

03. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ස්ථීර නිවාස ප්‍රශ්නය විසඳීම තුළින් ඔවුන් ආර්ථික සමාජීය අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික ගුණ වගාවන් දියුණු කිරීම.

04. ජයග්‍රාහී ප්‍රතිලාභියා ස්ථීර නිවසකට හිමිකම් කියන අවස්ථාවලදී ප්‍රතිලාභියාගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘතිවලට යොමු කිරීම.

05. අසරණභාවයට පත් නිවසක් අහිමි ප්‍රතිලාභීන් සඳහා විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීම
2022 වසරේ දිස්ත්‍රික් මට්ටමින් නිවාස ඉදිකිරීම සඳහා සෑම මාසයකම ප්‍රතිලාභීන් 335ක් මාසිකව දිනුම් වාර ක්‍රියාත්මක කිරීමෙන් තෝරාගන්නා ලදී. ඒ අනුව දිනුම් වාර 12කදී ප්‍රතිලාභීන් 4,020 ක් නිවාස ඉදිකිරීම සඳහා තෝරාගන්නා ලද අතර එක් නිවසක් සඳහා රු. 200,000/- ක මුදලක් ලබාදෙන ලදී.

(පහත වගුව අනුව එක් එක් දිස්ත්‍රික්ක සඳහා නිවාස ඉදිකිරීම සඳහා මුදල් නිදහස් කර ඇත.)

2022 වසර සඳහා දිනුම් අදිනු ලැබූ ජයග්‍රාහකයින් සංඛ්‍යාව හා නිදහස් කළ මුදල සංඛ්‍යා සටහන - (XXI)

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොං. ගණන	ජයග්‍රාහී ලොතරැයි ගණන	මුදල
1	අම්පාර	20	240	48,000,000.00
2	අනුරාධපුර	22	264	52,800,000.00
3	බදුල්ල	15	180	36,000,000.00
4	මඩකලපුව	14	168	33,600,000.00
5	කොළඹ	13	*156*	31,200,000.00
6	ගාල්ල	**22**	264	52,800,000.00
7	ගම්පහ	13	156	31,200,000.00
8	හම්බන්තොට	12	144	28,800,000.00
9	කළුතර	14	168	33,600,000.00
10	මහනුවර	20	240	48,000,000.00
11	කෑගල්ල	11	132	26,400,000.00
12	කුරුණෑගල	30	360	72,000,000.00
13	මාතලේ	11	132	26,400,000.00
14	මාතර	16	192	38,400,000.00
15	මොනරාගල	11	132	26,400,000.00
16	නුවර එළිය	5	60	12,000,000.00
17	පොලොන්නරුව	7	84	16,800,000.00
18	පුත්තලම	16	192	38,400,000.00
19	රත්නපුර	17	204	40,800,000.00
20	ත්‍රිකුණාමලය	11	132	26,400,000.00
21	වවුනියාව	4	48	9,600,000.00
22	යාපනය	15	180	36,000,000.00
23	කිලිනොච්චිය	4	48	9,600,000.00
24	මුලතිව්	6	72	14,400,000.00
25	මන්නාරම	5	60	12,000,000.00
එකතුව		**335**	**4,020**	**804,000,000.00**

(II) සමෘද්ධි විශේෂ නිවාස වැඩසටහන

නිවාස ත්‍යාග ලබාදීමෙන් පසු අරමුදලේ ඉතිරිවන යම් ශේෂයක් වේ නම් ඒවා මෙම අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට වැඩි දුරටත් යොදා ගැනීමට සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි භාරකාර අරමුදල් මණ්ඩලයට බලය ඇත්තේය.

ඒ අනුව පහත වැඩසටහන් 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇත.

1. රු. 125,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන
2. රු. 225,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන
3. රු. 650,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන
4. ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය මගින් ඉදිරිපත් වන හා අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන

1. **රු. 125,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන**

   අඩු ආදායම්ලාභීන්ගේ හා සමෘද්ධිලාභීන්ගේ අඩක් නිමකළ නිවාස සංවර්ධනය කර ගැනීම සඳහා මෙම වැඩසටහන හඳුන්වාදී ඇත. මෙහි දී මෙම නිවාසවල තත්ත්වය හඳුනාගැනීමෙන් අනතුරුව අදාල පවුල වෙනුවෙන් රු. 125,000/-ක මුදලක් ලබාදෙනු ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැගින් නිවාස 1005 ක් සඳහා මුදල් ලබා දී ඇත.

2. **රු. 225,000/- බැගින් නිවාස ලබාදෙන වැඩසටහන**
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට නිවාස 03 බැගින් ලබාදෙන අතර මෙම ප්‍රතිලාභීන්ගේ පවුල් සඳහා සවිස්තරාත්මක තොරතුරු ගොනුවක් පවත්වාගත යුතුය. මෙම නිවාස ඉදිකිරීමේදී ලබාදෙන රු. 225,000/- අමතරව ප්‍රභූ හා ප්‍රජා දායකත්වය එක් කරගනිමින් සම්පූර්ණ නිවසක් ඉදිකිරීමට කටයුතු කළ යුතුය.

3. **රු. ලක්ෂ 650,000/- බැඟින් නිවාස ලබාදෙන වැඩසටහන**
නිවාස සෑදීම සඳහා ස්ථීරවම තමන් සතු ඉඩමක් තිබිය යුතුය. අවම වශයෙන් පවුලේ සාමාජිකයින් 03 දෙනෙක්වත් සිටීම අනිවාර්ය වන අතර වැන්දඹු පවුලක්වීම හෝ ආබාධිත අයෙකු පවුලේ සිටීම සුදුසුකමක් සේ සැලකේ. මෙම පවුල් තෝරාගැනීමේදී දරිද්‍රතාවයෙන් යුත් පහල ආර්ථික මට්ටමක් සහිත පවුල් තෝරා ගැනීම සුදුසුය.

මේ සඳහා මුදල් ලබාදීමේදී අදියර 03ක් යටතේ රු. 200,000/-, රු. 200,000/-, 250,000/- ක් බැගින් ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු කරනු ඇත. වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී මෙහි වගකීම ගෙන කටයුතු කරනු ඇත.

4. **ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය මඟින් ඉදිරිපත් වන හා අභියාචනා සඳහා නිවාස ලබාදෙන වැඩසටහන**

සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ නිවාස පිළිබඳව පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මඟින් ප්‍රචාරය වන නිවාස අවශ්‍යතා හා ජනාධිපති, අගමැති, අමාත්‍යාංශ ලේකම් හා මැති ඇමතිවරුන්, අධ්‍යක්ෂ ජනරාල් හා වෙනත් නිලධාරීන් මඟින් ඉදිරිපත් වන ප්‍රජාවගේ අභියාචනා වෙනුවෙන් රු. 225,000/- හා රු. 650,000/- නිවාස යෝජනා පරීක්ෂා කර බලා නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව මෙම නිවාස යෝජනා සඳහා සුදුසුකම් ලබාදීම සිදුවේ.

2.1.7 ප්‍රජාමූල සංවිධාන වැඩසටහන

2.1.7.1 හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධන කාර්යභාරයන් දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ මූලිකම පදනම ප්‍රජාමූල සංවිධානයයි. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් යනු සමෘද්ධි පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේදී ප්‍රජාව සම්බන්ධ වන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කොටගෙන සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන, සමෘද්ධි දිස්ත්‍රික් කමිටු සහ සමෘද්ධි ජාතික සම්මේලනය යනාදී වශයෙන් සමස්ත සංවිධාන ව්‍යූහය ගොඩනැඟී ඇත.

සමෘද්ධි පනතට අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකල යුතු සියලු සංවර්ධන කාර්යයන් හා ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධාන මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයෙන් ඉටු කරනු ඇත. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් එයට සමගාමීව ප්‍රාදේශීය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යාම සිදු කෙරේ. මේ වන විට ප්‍රජාමූල සංවිධාන 30,128 ක් පිහිටුවා ඇත.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල කර්තව්‍ය ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ ඇගයීමේ කාර්ය සඳහා ප්‍රජාමූල සංවිධාන වල සභාපතිවරුන්ගේ සහභාගිත්වයෙන් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන 335 ක් පිහිටුවා ඇත. දිස්ත්‍රික්කයක් ඇතුළත ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සභාපති හා ලේකම් නියෝජනය කරමින් සමෘද්ධි දිස්ත්‍රික් කමිටු පිහිටුවනු ලැබේ. මෙම දිස්ත්‍රික් කමිටු සෑම තුන් මසකට වරක් රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සිදුකල යුතුය.

සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල අනුයෝජිතයන්ගෙන් සමන්විත වන පරිදි සමෘද්ධි ජාතික සම්මේලනය පිහිටුවනු ලැබේ. අමාත්‍යවරයා සමෘද්ධි ජාතික සම්මේලනයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතුය.

ජාතික මට්ටමින් සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය වන යෝජනා සහ මත සමාලෝචනය කිරීම සහ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සැපයීම සමෘද්ධි ජාතික සම්මේලනයේ පරමාර්ථ වේ.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම, පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීම මෙන්ම එම සංවිධානවල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදු කරනු ඇත. ඒ සඳහා සහාය වීමට ප්‍රතිලාභීන් හා ප්‍රජාමූල සංවිධානවල නිලධාරීන්ගෙන් සමන්විත, සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල ඇතිකර, අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇත.

2.1.7.2 ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන පිහිටුවීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචි කිරීම.
- ❖ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ලියාපදිංචිය අලුත් කිරීම.
- ❖ සමෘද්ධි ජාතික සම්මේලනය වාර්ෂිකව පැවැත්වීම.
- ❖ ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ප්‍රජාමූල සංවිධාන හා ප්‍රාදේශීය සංවිධානවල ගිණුම් කටයුතු ක්‍රමාණුකූල කිරීම.
- ❖ ආර්ථික සංවිධාන පිහිටුවීම.
- ❖ ව්‍යාපාර සංවිධාන පිහිටුවීම.
- ❖ සංවිධාන අරමුදල් වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ වූ ක්‍රියාමාර්ග හදුන්වා දීම.
- ❖ කාලීන ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස මැදිහත්වය හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ ආදායම් උත්පාදනය සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ **"සමෘද්ධි පූර්ව ළමා සවිබල කරණ"** පෙර පාසැල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හඳුනාගැනීම.
- ❖ **"සමෘද්ධි හරිත වර්ණ අස්වැද්දුම මාතෘභූමි"** ජාතික රුක්රෝපණ දින පරිසර වැඩසටහන
- ❖ ක්ෂුද්‍රමූල්‍ය ගැටළුවට විසඳුමක් ලෙස සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ❖ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ජාතික හා අන්තර් ජාතික මට්ටමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වන දරුවන්ට ක්‍රීඩා සංවර්ධන ආධාර ලබාදීම.
- ❖ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාව 30128
- ❖ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සංඛ්‍යාව 335
- ❖ ත්‍රෛයි මාසිකව රැස්වන දිස්ත්‍රික් කමිටු සංඛ්‍යාව 100
- ❖ ප්‍රජාමූල සංවිධානවල මුළු සාමාජික සංඛ්‍යාව මිලි. 17

2.1.7.3 පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 04 වන වගන්තියේ (උ) හා (ඌ) හි සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා 05 වන වගන්තියේ (ඕ) හි සඳහන් බලතල ප්‍රකාරව 06 වන වගන්තියේ (ඈ) හා (ඒ) හි සඳහන් කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අනුකූලව කටයුතු කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම කල යුතු වේ.

2.1.7.4 දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම.

සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල, ප්‍රාදේශීය සංවිධානවල වැඩසටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම, සහ ඇගයීම. දිස්ත්‍රික්කය තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල යෝජනා ඉදිරිපත් කිරීම, වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ස්ථානය - දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

සහභාගීත්වය - ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරු, ලේකම්වරු, ප්‍රජාමූල බැංකු සමිති ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්, දිස්ත්‍රික්කය භාරව සිටින දෙපාර්තමේන්තු නිලධාරියා, අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවල යෙදී සිටින තැනැත්තන් තුන්දෙනෙකු

සෑම වර්ෂයකම තුන් මසකට වරක් රැස්වීම් පවත්වන අතර වර්ෂයකට රැස්වීම් 04 ක් පැවැත්වේ.

දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනා සහ මත සලකා බැලීම සහ ඒවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම. දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම සිදු කෙරේ.

2.1.7.5 සමෘද්ධි සමාජ සංවර්ධන කොඩි වැඩසටහන

2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 10 (ඒ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආත්ම විශ්වාසය, සමාජය කෙරෙහි සාමූහික වගකීම, යහපත් ගුණාංග හා ගුණ ධර්ම ප්‍රවර්ධනය කිරීම ප්‍රජාමූල සංවිධානවල එක් පරමාර්ථයක් වන අතර පනතේ 16 (ඉ) ඡේදයට අනුව සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානව පෞර්ෂය, සාමූහික ක්‍රියාකාරකම් දැහැමි හා ආධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානවල එක් පරමාර්ථයක් වේ.

මෙම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. තම වසමට අයත් ප්‍රජාමූල සංවිධානවල සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාව මෙන්ම සාමාජිකයන් සමඟ එක්ව සමෘද්ධි ප්‍රතිලාභීන් මගින් කොඩි හා ස්ටිකර් පිළිගැන්වීම දුම් වැටි හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැලකී සිටීමේ පණිවුඩය ජනතාව වෙත ලබා දෙමින් අරමුදල් රැස් කිරීම මින් බලාපොරොත්තු වේ.

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ හා අඩු අදායම්ලාභීන්ගේ සමාජ සුබසාධන කටයුතු සඳහා මෙම අරමුදල් යොදවනු ලැබේ.

මෙම වැඩසටහන සියළුම ප්‍රජාව සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කෙරේ. දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම හා කොඩි වැඩසටහන තුලින් එක්රැස් කරන ලද අරමුදලින් ප්‍රතිලාභීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල දරුවන්ගේ සුබසාධනය සඳහා යෙදවීම. මත් නිවාරණ වැඩසටහන්, නිවාස ඉදිකිරීම්, නිවාස අලුත්වැඩියා කිරීම්, පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම, පාසල් දරුවන් සඳහා පොත් උපකරණ ලබාදීම, සනීපාරක්ෂක වැඩසටහන, සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන්, ආබාධිත සුබසාධනය, කාන්තා හා වැඩිහිටි දින වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

2.1.7.6. ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XXII)

අ.අ.	වැඩසටහන	වියදම (රු.මි.)	සංඛ්‍යාව
01	සමෘද්ධි ප්‍රජා පුහුණුකරුවන් පුහුණු කිරීම.	2.00	ප්‍රජා පුහුණුකරුවන් - 1501
03	දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීම	1.38	කමිටු රැස්වීම් - 62
	එකතුව	**3.38**	

2.1.7.7 "සමෘද්ධි හරිත වර්ණ අස්වැද්දුම මාතෘභූමි" ජාතික රුක්රෝපණ දින පරිසර වැඩසටහන

- සැප්තැම්බර් 17 දිනය යෙදෙන ජාතික රුක්රෝපන දිනය යථාර්තයක් බවට පත් කරමින් රට පුරා ප්‍රජාමූල සංවිධාන මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
- සියළුම ප්‍රාදේශීය සංවිධාන බල ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි පාසැල්, පන්සල් හා ආගමික සිද්ධස්ථාන ආශ්‍රිත ඉඩම්වල රුක් රෝපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- සියළුම ප්‍රාදේශීය සංවිධාන බල ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි වගා කිරීමට සුදුසු හිස් භූම්වල, ඇල දොල ඉවුරු, ජල පෝෂක ප්‍රදේශ හා සුසාන භූමි වැනි පොදු ස්ථානවල පැල සිටුවීම.
- දිගුකාලීන ආර්ථික වටිනාකමක් ඇති මහෝගනී, කොස්, බුරුත, නැදුන්, කළුවර ආදී පැල වර්ග සිටුවීම.
- ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සඳහා උචිත මී, කුඹුක් වැනි පැල වර්ග හා වෙරළ ආශ්‍රිතව මුහුදු බාදනය අවම කර ගැනීමට සුදුසු පැලවර්ග සිටුවීම
- පුද්ගලික වගා නොකරන ලද ඉඩම්වල කෙටිකාලීන ආර්ථික ප්‍රතිලාභ ලබා දෙන පලතුරු භෝග , කෙසෙල්. ගස්ලබු ආදී පැල වගාකිරීම.

2.1.7.8 "සමෘද්ධි පූර්ව ළමා සවිබලකරණ" පෙර පාසැල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා හඳුනාගැනීම.

- ආර්ථික අර්බුදය හමුවේ රටෙහි පැවති මන්ද පෝෂණ මට්ටම අවම කර ගැනීම සඳහා පෙර පාසැල් දරුවන්හට පෝෂණීය කොළ කැඳ වීදුරුවක් ලබාදීමේ වැඩසටහන ජාත්‍යන්තර දිළිඳුකම පිටු දැකීමේ දිනය යෙදෙන ඔක්තෝබර් 17 දින සමෘද්ධි බැංකු කළාප මට්ටමින් ආරම්භ කිරීමට හැකිවිය.
- සෑම සමෘද්ධි බැංකු කළාපයක්ම ආවරණය වන පරිදි තෝරාගත් පෙර පාසැල් 2213ක දරුවන් 57000ක් සඳහා පෝෂණීය කොළකැඳ වීදුරුවක් ලබාදීමට කටයුතු කරන ලදී.
- ආරම්භක සතිය තුළ පෙර පාසැල් 2213ක ක්‍රියාත්මක කලද මෙම වැඩසටහන කාලීනව මතුවූ ගැටළු පදනම් කර ගෙන පෙර පාසැල් 1000 ක 2022 වර්ෂය පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකිවූ අතර පෝෂණීය කොළ කැඳ වීදුරුවට එහා යමින් පෝෂණීය ආහාර වේලක් ලබාදීමටද ඇතැම් ප්‍රජාමූල සංවිධාන කටයුතු කර ඇත.
- මෙම කාලීන වැඩසටහන සඳහා ප්‍රජා සංවිධාන ,කලාපයේ ධානපතීන් ,ව්‍යාපාරිකයින් ,මූළ්‍ය ආයතන හා සහාය දෙන්නන්ගේ දායකත්වයෙන් හා ප්‍රදේශවාසීන්ගේ අනුග්‍රහයෙන් සාර්ථකව ක්‍රියාත්මත කිරීමට හැකිවිය.

2.1.7.9 ප්‍රජා නායකයින් හා නිලධාරින් සඳහා දිස්ත්‍රික් වැඩමුළු පැවැත්වීම.

2022 වර්ෂයේ ප්‍රජාමූල සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක වැඩසටහන් හා 2023 වසරේ ප්‍රජාමූල අංශයේ ක්‍රියාත්මක සැලැස්ම පිළිබඳ ප්‍රජාමූල නායකයින් හා සමෘද්ධි නිලධාරින් දැනුවත් කිරිම මගින් අපේක්ෂිත ඉලක්ක සාධනීය ලෙස ලභා කර ගැනිම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරිමේ වැඩමුළු මාලාවක් 2022 වර්ෂයේ ඔක්තොම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා දිවයිනම ආවරණය වන පරිදි සමාජ සංවර්ධන හා පරිසර අංශය සමඟ ඒකාබද්ධ පවත් වන ලදී.

එහි දී පහත සඳහන් මාතෘකා සම්බන්ධව දැනුවත් කිරිමට කටයුතු කරන ලදී.

- ➢ ජාතික නිෂ්පාදනයට ආර්ථික ප්‍රතිලාභ ලභා කර දීම උදෙසා ක්‍රියාත්මක විශේෂ ආදායම් උත්පාදන වැඩසටහන
- ➢ ජාත්‍යන්තර රැකියා වෙළඳ පොලට සුදුසු පරිදි ප්‍රජාමූල සංවිධානවල දරු දැරියන්ට වෘත්තීය පුහුණුව හා භාෂා පුහුණුව ලබාදීමේ වැඩසටහන
- ➢ ජාතික රුක්රෝපණ දිනයට සමගාමී හරිත වර්ණ අස්වැද්දුම මාතෘභූමි පරිසර වැඩසටහන (මේ යටතේ වාර්ෂිකව ගස් මිලියනයක් පරිසර පද්ධතියට එක් කිරිමට අපේක්ෂිතය)

- ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින්, දරුවන් හා තරුණ ප්‍රජාවගේ ක්‍රීඩා කුසලතාවය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගත් ජාතික ක්‍රීඩා වැඩසටහන
- සමාජ සංවර්ධන හා පරිසර අංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට යෝජිත ජාත්‍යන්තර දුම්වැටි විරෝධී සමෘද්ධි කොඩි වැඩසටහන ඇතුළු ජාත්‍යන්තර දි සැමරීමේ වැඩසටහන
- සමෘද්ධි ව්‍යවසායකයින් ඇගයීමේ ජාතික වැඩසටහන
- ප්‍රජාමූල සංවිධාන ගිණුම් ගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම
- ක්ෂුද්‍ර මූල්‍ය ගැටළුවට පිලියම් ලෙස හදුන්වා දුන් අරුණළු ණය වැඩසටහනේ ප්‍රගතිය සාකච්ජා කර ඉලක්ක සාධනය කර ගැනීමට විසදුම් සෙවීම
- සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කාර්ය භාරය හා ප්‍රජාමූල විෂය පිළිබඳ සාකච්ජා කිරීම
- ප්‍රජා නායකයින් විගණකයන් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ දැනුවත් කිරීම
- ප්‍රජාමූල සංවිධාන පිහිටුවීම, ලියාපදිංචිය හා පවරා ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සාකච්ජා කිරීම
- ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර වැඩසටහන තුළ සමෘද්ධි අපේ කාර්ය භාරය පිළිබඳ සාකච්ජා කිරීම.

මේ යටතේ දිවයිනම ආවරණය වන පරිදි 3,323 කගේ සහභාගිත්වයෙනන් වැඩමුළු 25ක් පැවැත්වීමට හැකි වූ අතර ඒ සඳහා ජාතික සමාජ සංවර්ධන පදනමෙන් රු.මි. 2.1 වැය දරණ ලදී.

2.1.7.10. අධික පොලී අයකරන ක්ෂුද්‍රමූල්‍ය ගැටළුවට විසදුමක් ලෙස සමෘද්ධි අරුණළු සහන ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ කුඩා පරිමාණ ව්‍යයසායික ප්‍රාග්ධන අවශ්‍යතා මෙන්ම පැන නගින හදිසි මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් අවශ්‍ය වන්නාවූ කෙටි කාලීන මූල්‍ය ඕනෑ එපාකම් තම ගම් ප්‍රදේශයේදීම පිරිමසාලීමටත්, අඩු ආදායම්ලාභීන් ණයගැනි භාවයෙන් මුදවා ගැනීමත් මෙම ණය වැඩසටහනේ ප්‍රධාන අරමුණවේ.

ප්‍රතිලාභීන්ට හිමිවන පහසුකම්

- තම ගම් ප්‍රදේශයේදීම ණය ලබා ගැනීමේ හැකියාව.
- ඉතා කෙටි කාලයක් තුල ණය ලබා ගැනීමට හැකිවීම.
- සහනදායි පොලී අනුපාතයක් යටතේ ණය ලබාදීම.
- සරල පහසු ක්‍රමවේදයක් යටතේ ආපසු ගෙවීමේ හැකියාව.

ප්‍රජාමූල බැංකු 852 ක ප්‍රතිලාභීන් 296,546 සඳහා මේ වන විට රු.මි. 1,013 ණය ප්‍රමාණයක් නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත. ග්‍රාම නිලධාරී වසම් 4,583 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

2.1.8 තොරතුරු තාක්ෂණ වැඩසටහන

2.1.8.1 හැඳින්වීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන කාර්යයන් තොරතුරු තාක්ෂණයත් සමඟ සම්බන්ධ කොට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබාදීම මෙම අංශයේ ප්‍රධාන අරමුණයි. දැනට ලිපි ලේඛන තැපෑල භාවිතයෙන් සිදුකරනු ලබන ක්‍රියාවලිය අන්තර්ජාලය භාවිතා කොට Email පණිවුඩ හුවමාරු හා පරිගණක වැඩසටහන් නිර්මාණය කොට සේවාවන් කාර්යක්ෂම කිරීමද තොරතුරු තාක්ෂණ අංශයේ අරමුණ වේ.

2.1.8.2. ක්‍රියාකාරකම්

- සමෘද්ධි සහනාධාරලාභී නාම ලේඛන අන්තර්ජාලය ඔස්සේ යාවත්කාලීන කළ හැකි ආකාරයට ප්‍රතිලාභී කලමනාකරණ මොඩියුලය (CRM) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- බැංකු ලිපි ද්‍රව්‍ය ගබඩාවේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා නව මෘදුකාංගයක් හඳුන්වා දීම.
- දිවයින පුරා පැතිරී ඇති සමෘද්ධි බැංකු 1089 හා සම්බන්ධ පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග සමාගම් දෙකක් දැනට තෝරාගෙන පළාත් 06 ක් සඳහා එක් මෘදුකාංගයකුත් පළාත් 03 ක් සඳහා අනෙක් මෘදුකාංගය වශයෙන් සියලු බැංකු පරිගණක ගත කිරීමට කටයුතු කිරීම.
- දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් සඳහා වන වියදම් අවම කිරීම සඳහා ඇතිකර ඇති Calling circle දුරකථන ජාලය වඩාත් ශක්තිමත් කිරීම.
- 2022 වර්ෂයට අදාළ සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේ දත්ත CRM මෘදුකාංගය හරහා ලබා දීම.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව නිල වෙබ් අඩවිය, දෙපාර්තමේන්තු මගින් නිකුත් කරනු ලබන චක්‍ර ලේඛන, උපදෙස් ලිපි හා දැනුම් දීම් සියල්ල යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම.www.samurdhi.gov.lk
- දිවයින පුරා විසිරී ඇති සමෘද්ධි මූලස්ථාන කාර්යාල 335 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම බිල්පත් ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- සමෘද්ධි මූලස්ථාන කාර්යාල 335 හා දිස්ත්‍රික් කාර්යාල 25 සඳහා අවශ්‍යතා ඇති වන ආකාරයට පරිගණක හා පරිගණක උපාංග ලබාදීම.
- නිලධාරීන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදීම.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිල විද්‍යුත් තැපැල් සේවාව (e-mail) පවත්වාගෙන යාම.

2.1.8.3. CRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම.

i. අන්තර්ජාලය ඔස්සේ සමෘද්ධිලාභී නාම ලේඛන යාවත්කාලීන කිරීම.

ii. නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීම සඳහා යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් ලබා ගැනීමට හැකිවීම

iii. සමාජ ආරක්ෂණ ගෙවීම් කඩිනම් වීම

සියලුම සමෘද්ධි මූලස්ථාන කාර්යාලවල ක්‍රියාත්මක වේ. 2019 වර්ෂයේ සිට ක්‍රියාතමක වන මෙම වැඩසටහන සඳහා 2022 වර්ෂයේ රු.මිලියන 2.03ක් වෙන්කරන ලදි. වැඩසටහන ඉදිරියටත් අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර 2022 වර්ෂයේ මේ සඳහා වියදම් කල මුදල රු.මිලියන 2.03 කි. භෞතික ප්‍රගතිය 100% පමණ වේ.

2.1.8.4. CRM ව්‍යාපෘතිය මගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵලය

i. සමෘද්ධි සහනාධාර නාමලේඛන යාවත්කාලීනව පවත්වාගැනීම.
ii. සමාජ ආරක්ෂණ ගෙවීම් කඩිනම් කිරීමට සමෘද්ධි බැංකු හා සම්බන්ධ කිරීම.
iii. සහනාධාර මුදල් නිවැරදිව ලබා දීම

2.1.8.5 . දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.

මේ මගින්, වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම, දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා නිකුත් කරන චක්‍ර ලේඛ, නිවේදන, ලිපි ආදිය නිලධාරීන්ට කඩිනමින් ලබා දීම සිදු කෙරේ.

2.1.8.6. සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති පරිගණකගත කිරීම

මෙම වැඩසටහන සමෘද්ධි ප්‍රධාන කාර්යාල මගින් ක්‍රියාත්මක වන අතර .බැංකු සඳහා අඛණ්ඩ මනා සේවාවක් සැපයීම සඳහා පරිගණක මෘදුකාංගය නිෂ්පාදිත ආයතන සමඟ සේවා ගිවිසුමකට එළඹීමත්, මෘදුකාංගයේ දෝෂ සියල්ල හඳුනාගෙන ඒවා නිවැරදි කර සියලු බැංකු වෙත ලබාදීමත් මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් මේ සඳහා වියදම් දරණ අතර, 2022.12.31 වන විට බැංකු හා මූලස්ථාන 1,482ක් පරිගණකගත කර ඇත. මෙහිදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

i. ගනුදෙනුකරුවන් ලියාපදිංචිය
ii. ගිණුම් ඇතුලත් කිරීම
iii. ගනුදෙනු ආරම්භය
iv. ණය වර්ග හා තැන්පත් වර්ග ඇතුලත් කිරීම
v. පාස්පොත් මුද්‍රණය
vi. දෛනික ගිණුම් කටයුතු, පොළී ගණනය කිරීම ශේෂ පිරික්සුම ආදී බැංකුවේ කටයුතු හා බැංකුවට අවශ්‍ය වාර්තා සකස් කිරීම.
vii. සමෘද්ධි සහනාධාර බැර කිරීම.
viii. ලෝක බැංකු ,ADB හා රජය මගින් සහනාධාර යටතේ ලබාදෙන අමතර සහනාධාර මුදල (topup) හා වැඩිහිටි, වකුගඩු, ආබාධ සහිත තැනැත්තන් සඳහා ලබාදෙන සහනාධාර බැර කිරීම
ix. ක්ෂේත්‍රයේදී මුදල් තැන්පත් භාර ගැනීම හා සහනාධාරලාභීන්ට නිවසේදීම මුදල් ලබා ගැනීම සඳහා ජංගම දුරකතන යෙදවුම (Mobile App) ක්‍රියාත්මක කිරීම.
x. ATM Machine භාවිතය සඳහා පරිගණක මෘදුකාංගය තුල පහසුකම් සපයා ඇත.
xi. සමාජ ආරක්ෂණ ගෙවීම් සිදු කිරීමට සහය වීම.

මෙමගින් ලබාගත් සමාජ ආර්ථික ප්‍රතිඵල

- දැනට ක්‍රියාත්මක නියමු සමෘද්ධි බැංකුවල කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමක පවතී.
- නිළධාරීන්ගේ ශ්‍රමය යොදා කරන ලද ක්‍රියාවලිය පරිගණක මෘදුකාංගය මගින් කිරීමේ දී නිවැරදිව හා පහසුව කිරීමටත්, කාලය ඉතිරිකර ගැනීමටත් හැකිවීම.
- ප්‍රතිලාභීන්ට ප්‍රමාද දෝෂයකින් තොරව කලට වේලාවට තම ගනුදෙනු කටයුතු කරගැනීමේ පහසුව සැලසීම.
- විශාල පිරිවැයක් ඉතුරු කිරීමට සහය වීම.

2.1.8.7. HRM මොඩියුලය ක්‍රියාත්මක කිරීම

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 25000කට අධික සේවකයන් පෞද්ගලික හා රාජකාරි තොරතුරු ඇතුළත් කිරීම.
- පද්ධතිය තුලින් එම සේවකයන් සඳහා රාජකාරි හැඳුනුම්පතක් නිකුත් කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම.
- දෙපාර්තමේන්තුගත නිලධාරීන් පෞද්ගලික ලිපිගොනුවේ ලේඛන scan කර පද්ධතියට upload කිරීම.
- එම upload කරන ලේඛන තුලින් දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා විශ්‍රාම ලිපි ගොනුවක් පද්ධතිය තුළින් සකස් කිරීම සහ ඒ ඒ වර්ෂයේ අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම යන නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් වාර්තාවක් Home page එකේ ඇතුලත් කිරීම.
- මෙය ප්‍රධාන කාර්යාලයේ, සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අංශ වලින් හා මූලස්ථාන කාර්යාල වලින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින්,

- ප්‍රමාදයකින් තොරව සේවක ගැටළු විසඳීමට හැකි වීම
- කාර්යාල කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ යාම.
- නිලධාරින් විශ්‍රාම යාමේදී විශ්‍රාම ගොනුවට අවශ්‍ය ලේඛන සහිත නිවැරදි ගොනුවක් සකස් කිරීම.
- නිවැරදි සහ යාවත්කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම බලා පොරොත්තු වේ.

2.1.9. මාධ්‍ය වැඩසටහන

2.1.9.1 හැඳින්වීම

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර, ඊට අදාලව දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් ජනතාව අතරට ගෙනයාම මාධ්‍ය අංශයේ මූලික අරමුණ වේ. මේ සඳහා මුද්‍රිත මාධ්‍ය මෙන්ම විද්‍යුත් මාධ්‍යය ද භාවිතා කරන අතර පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි.

ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්

1. සමෘද්ධි E අන්තර්ජාල පුවත්පත
2. සමෘද්ධි උදානය රූපවාහිනී වැඩසටහන
3. සමෘද්ධි FM අන්තර්ජාල රේඩියෝව
4. මාධ්‍ය අංශය සඳහා කැමරා උපකරණ ලබා ගැනීම.

2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්වල ප්‍රගතිය

සංඛ්‍යා සටහන - (XXIII)

වැඩසටහන්		වැඩසටහන් ගණන	වෙන්කල මුදල රු.මි.	වැය වූ මුදල රු.මි.
1.	සමෘද්ධි E පුවත්පත.	සිංහල 24 දෙමළ 24 ඉංග්‍රීසි 24	3.12	3.12
2.	රූපවාහිනී වැඩසටහන.	52	11.11	11.11
3.	මාධ්‍ය අංශය සඳහා අවශ්‍ය වීඩියෝ කැමරා උපකරණ මිලදී ගැනීම.	1	1.5	1.50
4.	මාසික ප්‍රචාරණ හා පුවත්පත් දැන්වීම්		0.27	0.21
එකතුව			**16.00**	**15.94**

2.1.10. අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනය

2.1.10.1 හැඳින්වීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මුදල් රෙගුලාසි 133,134 අනුව පිහිටුවා ඇති අතර, කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා පූර්ව මහපෙන්වීම මත ක්‍රියාත්මක වනු ලැබේ.

2.1.10.2 අරමුණ හා කාර්ය භාරය

අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තුවේ විගණන කාර්යයට අමතරව දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1089 ක් හා බැංකු සමිති 334 ක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් හා ප්‍රජාමූල සංවිධානවලින් කොටසක් විගණනයට ලක් කරනු ලැබේ. දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතන විසින් ඉටුකරනු ලබන වැඩසටහන් වල කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ අරමුණෙන්, අදාල පරිදි මූල්‍ය විගණනය, කාර්ය සාධන විගණනය, කලමනාකරණ විගණනය , පාරිසරික විගණනය, පද්ධති පාලන විගණනය හා අවධානම් සහිත ක්ෂේත්‍ර පදනම් කරගත් විගණනය සිදු කරනු ලබයි.

මේ අනුව 2022 වාර්ෂික විගණන සැලැස්ම අනුව වර්ෂය තුල පහත අරමුණු ඉටුකර ගැනිමට සමත්ව ඇත.

i. විගණන සැලැස්මේ 75% ක ප්‍රගතියක් ලගාකර ගැනිමට හැකි වීම
ii. වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම.
iii. වර්ෂය තුල විශාල මූල්‍ය වංචා කීපයක් අනාවරණය කර ගැනීම, ඒ සඳහා විශේෂ විගණන පරීක්ෂණ පැවැත්විම හා විනයානුකූකව කටයුතු කිරීම සඳහා යොමු කිරීම.

ඉහත කරුණු වලට අමතරව කොවිඩ් 19 වසංගතය වෙනුවෙන් 2020-2021 වර්ෂවල ගෙවන ලද සමාජ ප්‍රතිලාභ සම්බන්ධයෙන් විශේෂ විගණනයක් සිදු කිරීම හා අදාල වියදම් වාර්තාවල නිරවද්‍යතාවය පිළිබඳව පරීක්ෂා කර කළමනාකරණයට වාර්තා කිරීම සිදු කරන ලදි.

2.1.11 සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන

2.1.11.1 හැඳින්වීම

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතුරින් ජනතාවගේ දිළිඳුබව තුරන් කිරීමේ අරමුණ වෙනුවෙන් කටයුතු කරන ප්‍රධානතම ආයතනය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීම, වාර්ෂික සැලසුම් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැන හා එම සැලසුම් අනුව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති පිළිබඳ පසු විපරම් කිරීම, ආයතනික තීන්දු තීරණ ගැනීම සඳහා ඵලදායී දත්ත ඉදිරිපත් කිරීම හා තොරතුරු වාර්ෂික වියදම් සීමාව තුළ ඊට සරිලන ප්‍රතිඵල ළඟා කරගෙන ඇත්ද යන වග නිරීක්ෂණය කිරීම, ආයතනික ඉදිරි විභවතා පිළිබඳ පර්යේෂණ සිදු කර දිළිඳු බව තුරන් කිරීමේ මෙරට ජාතික මෙහෙවරට උරදෙන ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීමේ මෙහෙවර අප අංශය මගින් සිදු කරයි.

2.1.11.2 සැලසුම් හා මෙහෙයුම් අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

(I) ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

ප්‍රධාන කාර්යාලය මගින් මෙම රැස්වීම් සංවිධානය කරනු ලබන අතර, අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සෑම මසකට වරක්ම පැවැත්වේ. දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලැස්ම අනුව ක්‍රියාතමක වන ව්‍යාපෘති වල ප්‍රගතිය මෙන්ම, අනෙකුත් සියළුම පරිපාලන කරුනු පිලිබඳව සාකච්ඡා කරනු ලබන අතර, මේ සඳහා දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් සහභාගී වේ. මේ යටතේ, 2022 වර්ෂය සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 10 ක් පවත්වා ඇති අතර, වියදම් කළ මුදල රු.මි.0.17 කි.

(II) දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

සෑම මාසයකම දිස්ත්‍රික් කාර්යාලවල දිස්ත්‍රික් අධ්‍යක්ෂකගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීම් මූලස්ථාන කළමණාකරුවන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරේ. දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම ප්‍රගතිය සාකච්ඡා කිරීම මෙහි දී සිදු වේ. 2022 වර්ෂය සඳහා රැස්වීම් 185 ක් පවත්වා ඇති අතර, වියදම් කල මුදල රු.මි.4.64 කි.

(III) වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.

පෙර වර්ෂයට අදාලව ඒ ඒ අංශ මගින් ක්‍රියාත්මක කරන ලද දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය සාධනය පදනම් කරගෙන වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කරනු ලැබේ. එය පොතක් වශයෙන් සකස් කර සෑම වසරකම අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ. මේ යටතේ 2022 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව සකස් කර, ඉන් පිටපත් 25 ක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

2023 සමෘද්ධි වැඩසටහනේ ඉලක්ක පිළිබඳ සාරාංශය

1. සමාජ සුබසාධන වැඩසටහන යටතේ අනෙකුත් කාණ්ඩගත ප්‍රතිලාභීන් 3,016,373 සඳහා මාසිකව මූල්‍ය සහනාධාර ලබා දීමට කටයුතු කිරීම.

    * සමෘද්ධි සහනාධාරලාභී පවුල් සංඛ්‍යාව - 2,373,659
      (දැනට සහනාධාර ලබන හා පොරොත්තු ලේඛනගත පවුල්)

    * වැඩිහිටි ආධාරලාභී පුද්ගලයින් සංඛ්‍යාව - 513,700
      (දැනට ආධාර ලබන හා පොරොත්තු ලේඛනගත පුද්ගලයින්)

    * ආබාධිත ආධාරලාභී පුද්ගලයින් සංඛ්‍යාව - 88,228
      (දැනට ආධාර ලබන හා පොරොත්තු ලේඛනගත පුද්ගලයින්)

    * වකුගඩු රෝගී ආධාරලාභී පවුල් සංඛ්‍යාව - 40,786
      (දැනට ආධාර ලබන හා පොරොත්තු ලේඛනගත පුද්ගලයින්)

2. සමෘද්ධි සහනාධාර වැඩසටහන තුල සිටින ඉහල ආර්ථික මට්ටමක් ලභාකරගෙන ඇති පවුල් හඳුනාගෙන ඔවුන් "රන්පත්ලාභීන්"ලෙස ඇගයීමට ලක්කර, සහනාධාර මානසිකත්වයෙන් මුදවා ගැනීමට කටයුතු කිරීම.

3. ඉහතින් සඳහන් "රන්පත්ලාභී"පවුල් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම්, නිවාස ආධාර හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ දිගටම ලබාදීමට කටයුතු කිරීම.

4. සමෘද්ධි බැංකු ජාලය තව දුරටත් ප්‍රාදේශීය මට්ටමට ව්‍යාප්ත කිරීම සඳහා සමෘද්ධි බැංකු ශාඛා ගණන 1,100 දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම.

5. සමෘද්ධි පනත අනුව සියළුම සමෘද්ධි බැංකු හා බැංකු සමිති ව්‍යවස්ථාපිත බැංකු ඒකක බවට පරිවර්ථනය කිරීමට කටයුතු කිරීම.

6. සමෘද්ධි හා අනෙකුත් ඛාණ්ඩගත පුද්ගලයින් 3,016,373 ගේ තොරතුරු CRM පද්ධතියට ඇතුලත් කර ඒ හරහා මූල්‍ය ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීම.

7. දෙපාර්තමේන්තුවේ සේවකයන්ගේ 24,340 ගේ තොරතුරු HRM පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමට මූලික පියවර ගැනීම.

8. සියළුම සමෘද්ධි බැංකු ගනුදෙනු Mobile App **හා** Online System හරහා සිදු කිරීමට කටයුතු කිරීම.

9. සමෘද්ධි බැංකු සඳහා ATM පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

10. සමාජ ආරක්ෂණ අරමුදලින් අතිරේක භෝග වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 440 කගේ ජීවන තත්වය ඉහළ නැංවීම.

11. ජීවනෝපාය සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සමෘද්ධිලාභී පවුල් 56,000 ක් සවිබලගැන්වීමට කටයුතු කිරීම.

12. සමෘද්ධි අලෙවි ජාලය පුළුල් කිරීම යටතේ කුඩා අළෙවිසැල් (Mini Food Cityies) 500 ක් ඇති කිරීමට පියවර ගැනිම.

13. සමෘද්ධි නිෂ්පාදකයින්ගේ අළෙවි පහසුකම් පුළුල් කිරීම සඳහා සුව බොජුන්හල් 10 ක් ඉදි කිරීම.

14. සමෘද්ධි නිෂ්පාදන අළෙවිය සඳහා ප්‍රා දේශීය මට්ටමින් අළෙවි පොළවල් 275 ක් පැවැත්වීම.

15. සමෘද්ධි ව්‍යාපාර සංවිධාන 25 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ඇති කිරීම.

16. පවුල් සඳහා වැසිකිළි 336 ක් ක් ඉදි කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම.

17. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන් 400,000 කට සමෘද්ධි බැංකු හරහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.

18. සමෘද්ධි නිවාස ලොතරැයි වැඩසටහන යටතේ සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් 6,105 ට නිවාස සකස් කිරීමට අවශ්‍ය ආධාර ලබා දීම.

19. සමාජ ආරක්ෂණ අරමුදලින් සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ උසස්පෙල හදාරණ සමෘද්ධිලාභී පවුල්වල දරුවන් 45,000 ක් සඳහා ශිෂ්‍යත්ව ආධාර ලබා දීම.

20. සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන් 200,000 ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කිරීම.

21. මෙම ක්‍රියාකාරකම් මගින් රටේ අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් වර්ධනය කර දිළිඳුකම්න් මුදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

22. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නොවිසඳුනු වෘත්තීය ගැටළු විසඳා ගැනීමට වැටුප් කොමිසම, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, කලමණාකරන සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග නිරතුරුව සාකච්ඡා කර එම ගැටළු විසඳීමට පියවර ගැනීම.

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

පරිවිජේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්ඒ්-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තක්‍ය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	එස්ඒ්-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
59,898,610,040	භාණ්ඩාගාර අග්‍රිම		**59,898,610,040**	**78,714,274,286**	එස්ඒ්-3
46,363,226,746	තැන්පතු		**46,363,226,746**	**12,989,691,125**	එස්ඒ්-4
222,888,468	අත්තිකාරම් ගිණුම්		**222,888,468**	**215,973,409**	එස්ඒ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
106,484,725,254	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**106,484,725,253**	**91,919,938,820**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**106,484,725,253**	**91,919,938,820**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)			**316,134,657**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**106,484,725,253**	**91,603,804,163**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
17,470,600,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	**16,470,680,394**	**15,467,985,544**	එස්ඒ් -2(ii)
733,000,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	**370,806,839**	**376,433,426**	
65,000,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	**37,080,483,053**	**63,081,203,584**	

-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
83,203,600,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**53,921,970,286**	**78,925,622,554**	
	මූලධන වියදම්				
11,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	**2,734,980**	**2,124,153**	
1,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	**958,103**	**2,779,460**	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**		-	එසිඒ -2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**		-	
2,000,000	හැකියා වර්ධනය	**14**	**1,236,096**	**5,977,172**	
150,000,000	වෙනත් මූලධන වියදම්	**15**	**94,618,476**	**504,591,582**	
164,700,000	මුළු මූලධන වියදම් (උ)		**99,547,655**	**515,472,367**	
	තැන්පතු ගෙවීම්		**46,441,966,904**	**12,714,847,116**	එසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		**306,462,087**	**215,773,203**	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**46,748,428,992**	**12,930,620,319**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**100,769,946,933**	**92,371,715,240**	
-	දෙසැම්බර් **31** දිනට ශේෂය ඒ=(ඉ-එ)		**5,714,778,321**	**(767,911,077)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**5,714,778,321**	**(767,911,077)**	එසිඒ-7
	දෙසැම්බර් **31** දිනට අග්‍රිම ශේෂය				එසිඒ-3
			-		

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,679,988,852	1,446,929,717
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	-	47,456,219
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		
මුළු වත්කම්		**1,679,988,852**	**1,494,385,936**
ඉදිරි වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉදිරි වත්කම්		(2,762,379,130)	(2,793,663,071)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,679,988,852	1,446,929,717
තුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,762,379,130	2,841,119,290
අදාළ ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		**1,679,988,852**	**1,494,385,935**

පිටු අංක 1 සිට 32 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ඇමුණුම් පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 33 සිට 41 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකාරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට එරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : යසුනා පෙරේරා
තනතුර : ලේකම්
දිනය : 2023.02.

.....
ගණන්දීමේ නිලධාරී
නම : ආර්.බී.බී.තිලකසිරි
R.B.B.Thilakasiri
Director General
Department of Samurdhi Development
4th Floor, "Sethsiripaya" Stage 1
Battaramulla

.....
ප්‍රධාන ගණකාධිකාරී
නම : කේ.ආර්.කුමාරදාස
දිනය : 2023.02.

කේ. ආර්. කුමාරදාස
ප්‍රධාන ගණකාධිකාරී
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
1 වන අදියර, 04 වන මහල,
"සෙත්සිරිපාය", බත්තරමුල්ල

3.4 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022	2021
	රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	984,334,264	849,936,347
අග්‍රිම ලැබීම්	59,898,610,040	78,714,274,286
අත්තිකාරම් අයකර ගැනීම්	226,615,723	216,687,068
තැන්පතු ලැබීම්	46,363,226,746	12,989,691,125
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	107,472,786,772	92,770,588,826
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	16,828,310,378	15,841,482,225
සහනාධාර සහ මාරුකිරීම්	37,080,483,053	63,081,203,584
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	6,716,635,210	85,517,520
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	316,134,657
අත්තිකාරම් ගෙවීම්	305,843,572	215,931,357
තැන්පතු ගෙවීම්	46,441,966,904	12,714,847,116
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	107,373,239,117	92,255,116,459
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	99,547,655	515,472,367
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-

උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	99,547,655	515,472,367
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	99,547,655	515,472,367
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(99,547,655)	(515,472,367)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

සංඛ්‍යා සටහන - (XXIV)

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

සංඛ්‍යා සටහන - (XXV)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්‍ෂ වියදම (රු.මි.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.මි.)	අවසාන ප්‍රතිපාදනය (රු.මි.)		
පුනරාවර්තන	83,203,600	83,203,600	53,921,970	65
ප්‍රාග්ධන	164,700	164,700	99,548	60

3.8.මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන

සංඛ්‍යා සටහන - (XXVI)

අ. අං	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්‍ෂ වියදම (රු.මි.)	උපයෝගී කර ගන්නාලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල% ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.මි.)	අවසාන ප්‍රතිපාදන (රු.මි.)		
01	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ වැටුප් ගෙවීම	798,537	798,537	761,210	95
02	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව	ඉහළ බලපෑමකට ලක් වූ පවුල් සඳහා දීමනා ගෙවීම. ලෝක ආහාර වැඩසටහන	632,020	632,020	632,020	100
03	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	අත්තිකාරම් බිී ගිණුම යටතේ ණය නිරවුල් කිරීම.	.2	.260	.260	100
04	බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව	මාතර පුහුණු මධ්‍යස්ථානයේ විදුලි වියදම් දැරීම	0.10	0.10	0.10	100

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

සංඛ්‍යා සටහන - (XXVII)

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට භාණ්ඩ මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	346,958	346,958	-	100
9152	යන්ත්‍රෝපකරණ	858,295	858,295	-	100
9153	ඉඩම්	453,084	453,084	23,336	100
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	21,651	21,651	-	100
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LSW/A/SDD/21/22/FS

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 මැයි 02/දින

02 JUN 2023

ගණන්දීමේ නිලධාරී

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 331 - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම න ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම්

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම් සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම් උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් දුර්බල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව්ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්මත ඉදිරිපත් කිරීම අගයන් ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2022 ජනවාරි 01 දිනට වටිනාකම් රු. 900,000 ක් වූ ගලගම සමෘද්ධි බැංකු ඉඩම් රු. 2,500,000 කට තක්සේරු කිරීමෙන් එකතු වූ රු 1,600,000 ක අගය මූල්‍ය ප්‍රකාශනවල ප්‍රංගම නොවන වත්කම් හා සංචිත යටතේ අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වටිනාකම් රු 5,650,000 ක් වූ හිපන්කන්ද ගල්කන්ද ඉඩම් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් සඳහා කරන්දෙනිය ප්‍රාදේශිය ලේකම් වෙත පවරා ඇතත් මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් යටතේ තවදුරටත් දක්වා තිබුණි.

(ඇ) මාතර නිල නිවස පිහිටි ඉඩමේ වටිනාකම් වූ රු 7,749,000 ක මුදල් නිල නිවාස යටතේ දක්වා නොතිබුණ අතර රු. 3,751,000 ක් වූ ගොඩනැගිල්ල පමණක් නිල නිවාස යටතේ දක්වා තිබුණි.

(ඈ) වැය විෂය අංක 1205 යටතේ මිලදීගත් රු. 115,000 ක් වූ විදුලි උපකරණ (Microwave Oven) වල වටිනාකම් රු.1,150,000 ක් ලෙස විදුලි උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඉ) වවුවර් අංක 12/390 මඟින් වීඩියෝ හා කැමරා උපාංග වත්කම් මිලදිගැනීම් සඳහා රු.1,149,000 ක් ගෙවීම් කිරීමේදී සියයට 15 ක එකතු කල අගය මත බදු මුදල් වූ රු.172,350 ක් ගෙවා නිබුණද එය වත්කමට එකතු කර දක්වා නොනිබුණි.

(ඊ) 2021 වර්ෂය තුල මිලදී ගත් රු. 879,330 ක් වූ කැමරා උපාංග සමාලෝචිත වර්ෂයේ ආරම්භ ශේෂයට එකතු කර දක්වා නොනිබුණි.

1.6.2. තැන්පතු ගිණුම් ශේෂ

(අ) පොදු තැන්පත් ගිණුම් 5 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල උපලේඛන අනුව ශේෂය අතර රු 124,709,327 වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) පොදු තැන්පතු ලේඛනයේ සටහන් කර ඇති අයිතම් 05 ක එකතු වටිනාකම් රු.2,392,568.462 ක් කෝවල ශේෂ ලැයිස්තුවේ ඇතුළත්ව නොනිබුණි.

1.6.3 හානි හා පාඩු

(අ) 2022 වර්ෂය තුළ අනතුරට ලක්ව රු 64,850 ක් වැය කර අළුත්වැඩියා කරන ලද වාහන 02 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන (i) හි දක්වා නොනිබුණි.

(ආ) 2020 වර්ෂයේ අනතුරු වලට පත්ව රක්ෂණ වන්දි ලබාගෙන නිබුණු වාහන 9 ක් හානි හා පාඩු ලේඛනයේ. පොතෙන් අස්කළ ලෙස සටහන් කර නිබුණි. මෙම වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104, 109 හා මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව ක්‍රියාකර නොනිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන් (i) යටතේ දක්වා නොනිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ව්‍යදම් කළමනාකරණය

වැයවිෂය දෙකක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 64 ක ප්‍රමාණයක ඉතිරිවීම් සිදුකර නිබුණි. ඉතිරිවීම් වලට හේතු වශයෙන් රාජ්‍ය ව්‍යදම් කළමනාකරණ ප්‍රතිපත්ති තුළ ප්‍රාග්ධන ව්‍යදම් සීමාකිරීම ලෙස දක්වා නිබුණද මෙම වැය විෂයට අදාලව පුහුණු වැඩසටහන් සඳහා වන ව්‍යදම් යටතේ දරා නිබීම ඉතිරියට හේතු වී නිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) වැය විෂය අංක 331-1-1-1202 හා 331-2-2-1402 යටතේ වෙනත් ආයතන වලට ගෙවිය යුතු එකතුව රු. 947,730 ක් බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොනිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා නිබූ රු 3,045,956 බැඳීම් හා බැරකම් වටිනාකම් වැය ලෙජරයේ පෙර වර්ෂ ගිණුම්ගත බැඳීම් යටතේ දක්වා නොනිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට පටහැනිව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ගෙවිය යුතු බැරකම් වටිනාකම් රු. 125,521 ක් බැරකම් යටතේ දක්වා නිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත් චාර්තාවේ 3.10 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 135 හා 381 (i)	පුහුණු මධ්‍යස්ථානවල සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරා දීමකින් තොරව අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර පුහුණු මධ්‍යස්ථාන 03 ක භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව බැංකු ජංගම ගිණුම් පවත්වා ගෙනගොස් තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 206 (3) හා (1)	නැන්පතුවකින් ගෙවීම් සඳහා සෑම වවුචරයක්ම නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතු වුවත් 2022 නොවැම්බර්, දෙසැම්බර් මාසවලට අදාළව නිලධාරීන් එක් අයකු විසින් එකතුව රු. 1,388,691,509 ක් වටිනාකම් වූ ගෙවීම් වවුචර් 50 ක් (රික්විසිෂන් පත්‍ර) එක් නිලධාරියෙකු විසින් සහතික කර තිබුණි. ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 206(1) ඡේදයේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම් හා ඒ බව විගණකාධිපති වෙත දැනුම් දීම් සිදු කර නොතිබුණි.
(iii) මුදල් රෙගුලාසි 395(ආ)	එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ මාස 10 කට

		අදාල බැංකු සැසඳුම් ප්‍රකාශය දින 04 ත් දින 40ත් අතර කාලයක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි.
(iv)	මූදල් රෙගුලාසි 396	සේවක ණය වක්‍රිය බැංකු ගිණුම් ප්‍රකාශනවල නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ රු. 180.100 ක් වූ චෙක්පතක් සම්බන්ධව මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	2019 වර්ෂයේ වාහන සමීක්ෂණය අනුව ධාවනයෙන් ඉවත් කරන ලද, අළුත්වැඩියා කර ධාවන තත්වයට පත්කළ හැනි වාහන 24 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොනිබුණි.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස්කර නොනිබූ අතර, සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා කාර්යමණ්ඩල ගිවිසුම් සකස්කර නොනිබුණි.
(ඈ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 2/2020 හි 7.4 ඡේදය හා 2015 ජුනි 24 දිනැති අංක 243/2015 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය	ආරම්භ කරනු ලබන එක් එක් තැන්පතු ගිණුම් කාණ්ඩ සඳහා වන වර්ෂය අවසාන ශේෂයන් සිගාස් වැඩසටහන යටතේ ලබා ගන්නා කේවල ශේෂ ලැයිස්තුව සමග සැසඳීම් කර තැන්පතු ගිණුම් කටයුතු පසුවිපරම් කිරීමට සහ විශ්ලේෂණය කිරීම සඳහා ආකෘති පත්‍ර නිසිපරිදි සම්පූර්ණ කර මූදල් වර්ෂයක් අවසානයේ එළඹෙන මූදල් වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.

2.5 තැන්පතු

(අ) 2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සහනාධාර ගෙවීම් සඳහා එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් රු.මිලියන 2,374 ක මූදල වසර 8 කටත් අධික කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොනිබුණි.

(ආ) 2014 ජුනි 01 සිට 2022 දෙසැම්බර් 30 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 3,221,847 ක් වූ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමූදලේ දායක මූදල් එම අරමූදල වෙත යැවීමට කටයුතු නොකර ගාල්ල දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ තැන්පත් ගිණුමේ රදවා ගෙන තිබුණි.

(ඇ) ලෝක බැංකු ආධාර යටතේ 2022 මැයි,ජුනි, ජුලි මාසයන්හි සමෘද්ධි/ වැඩිහිටි/ආබාධිත සහ වකුගඩු රෝගී පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන්ට ගෙවීම් කිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත 2022 මැයි - අගෝස්තු කාලපරිච්ඡේදය තුල බැර කරන ලද රු. 39,619,307,119 ක මූදලින් සහනාධාර ගෙවා ඉතිරිවූ රු. 90,318,300 ක මූදල ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ආපසු ප්‍රේෂණය කිරීම 2023 අප්‍රේල් 11 දින සිදු කර තිබුණි.

(ඇ) 2020/21 වර්ෂවල කොවිඩ් සහනාධාර ලබාදීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව යටතේ ඇති අරමුදල්වල ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබාගත් ණය මුදල් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත නිකුත් කර නිබුණි. ප්‍රතිලාභීන්ට සහනාධාර ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි වූ මුදල රු.177,731,499 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුදල් වෙත නිදහස් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන නිබුණි.

(ඉ) 2019 මැයි සිට 2021 ජූනි දක්වා කාලය තුළ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ එකතුව රු. 654,589 ක චෙක්පත් 49 ක් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන නිබුණි.

2.6 නිරවුල් නොකළ ශේෂ

සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා විවිධ අරමුණු සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුවේ පවතින අරමුදල් ගිණුම්වලින් එකී අරමුණු වලින් බැහැරව රු. මිලියන 53,594.67 ක් රජයේ විවිධ අවශ්‍යතා සඳහා ලබා දී නිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට මෙම මුදලින් රු. මිලියන 53,294.97 (පොලී සහිතව) නවදුරටත් අයවීමට නිබුණි.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

(අ) 2022 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 23,182,701 ක් වූ හදුනා නොගත් ලැබීම් අතරින් එකතුව රු. 1,068,232 ක් වූ චෙක්පත් 04 ක් 2023 මැයි 30 දින වන විටත් හදුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොනිබුණි.

(ආ) සේවක ණය වක්‍රිය ගිණුමට අදාල 2022 දෙසැම්බර් බැංකු සැසඳුම් පරීක්ෂාවේදි වර්ෂ 4 සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක් තුළ තැන්පත්කල නමුත් උපලබ්ධි නොවූ රු. 2,668,654 ක් වටිනා චෙක්පත් 84 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.

2.8 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

(අ) 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අනුව අවම ලැබීම් සීමාව රු. 280,000,000 ක් වුවත් සත්‍ය වශයෙන් ලැබී ඇති මුදල රු. 222,888,467 ක් වුයෙන් ලැබීම් වල අවම සීමාවට ළඟාවී නොනිබු වටිනාකම රු. 57,111,533 ක් විය.

මේ සඳහා පහත කරුණු හේතු වී නිබුණු බව නිරීක්ෂණය විය.

i. වසර 2 කට වඩා පැරණි අයවිය යුතු ණය ශේෂවලින් 2021 වර්ෂයේදී රු. 2,882,253 ක් අයකරගෙන නිබුණද සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන නිබුණේ රු. 511,047 ක් පමණක් විම.

ii. නිලධාරීන් 6 දෙනෙකු සඳහා රු. 250,000 බැගින් ආපදා ණය ලබාදී නිබුණද වාරික කිසිවක් අයකරගෙන නොනිබීම.

iii. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ණය ශේෂ අයවීම් සේවක ණය වක්‍රිය අරමුදලට බැර වීම. උදාහරණ මාතර දිස්ත්‍රික් කාර්යාලයේ

නිලධාරියෙකුගෙන් අයවිය යුතු ශේෂය රු. 210,652 ගිණුම් සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනයේ ඇතත් අයවිම් සේවක ණය වශීය අරමුදලට බැරවී නිබීම

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට සේවකයින් 100 දෙනෙකුගෙන් වසර 01 සිට වසර 05 ඉක්මවූ හිඟ හිටි ණය ශේෂය රු. 2,467,073 ක් විය. මෙම ණය ශේෂය තුළ වසර 05 ඉක්ම වූ ශේෂය රු. 302,233 ක් ද වසර 4 ත් 5 ත් අතර හිඟ හිටි ශේෂය රු. 922,180 ක් ද වසර 3-4 අතර හිඟ හිටි ණය ශේෂය රු. 321,336 ක් ද වසර 1-3 අතර නිහඟිටි ශේෂය රු. 921,324 ක් ද වශයෙන් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

(අ) දුප්පත්කම් නැති කිරීම මූලික අරමුණු කොට ගෙන පවුල් ඒකකය පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති උපයෝගි කරගනිමින්, ආදායම් හා සමාජීය තත්ත්වයන් නගා සිටුවීමෙන් දුප්පත්කම පිටුදැකීමත්, තරුණ තරුණියන් රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට හා පරිපාලනයට සෘජුවම දායක කරගැනීමටත් සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කර නිබුණි. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවරට අදාළව රජය විසින් වාර්ෂිකව මුදල් වියකරමින් සමෘද්ධි සහනාධාර සහ සමාජ සවිබලගැන්වීමේ විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මකකර නිබුණි. 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල සීමාව තුලදී රජය විසින් සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ විවිධ සමෘද්ධි සංවර්ධන වැඩසටහන් සඳහා රු. මිලියන 1,260 ක් වැයකර නිබුණ ද සවිබලගැන්වීම් පිළිබඳ නිශ්චිත ඉලක්කයක් හඳුනාගෙන නොනිබුණි.

(ආ) 1995 වසරේදී සමෘද්ධිලාභීන් ලෙස හඳුනාගත් සමෘද්ධිලාභීන් 312,307 ක් 2023 වර්ෂය වන විට වසර 29 ක් ගතවී ඇතත්, සවිබලගැන්වීම්කින් තොරව නවදුරටත් සහනාධාර ලබමින් පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සවිබලගැන්වූ සහනාධාරලාභීන් ලෙස 2020,2021 හා 2022 වර්ෂ වලදී පිළිවෙලින් 1,958 ක් 18,629 ක් හා 21,189ක් ලෙස හඳුනා ගෙන නිබුණි. වාර්ෂිකව සවිබලගැන්වූ ප්‍රතිලාභීන් පිළිබඳ නිශ්චිත ඉලක්ක ඇතුලත් සැලැස්මකට අනුකූලව කටයුතු කර නොනිබුණි. ඒ අනුව වාර්ෂිකව සමෘද්ධිලාභීන් සවිබලගැන්වීම සඳහා රජය විසින් සිදුකරනු ලබන ව්‍යාපෘතිවලට සාපේක්ෂව සවිබලගැන්වීම් අවම මට්ටමක පැවතුණි.

(ඈ) 2018 අගෝස්තු 20 දිනැති DSD/HO/SW/14/18/04/18 චක්‍රලේඛය හා 2021 පෙබරවාරි 11 දිනැති DSD/HO/SW/14/19/01 – Circular යන චක්‍රලේඛ ප්‍රකාරව සමෘද්ධි සහනාධාර සඳහා සුදුසුකම් නොලබන නිර්නායක තුල වූ පුහුණු ශ්‍රමික හා ශිල්පීය දැනුම් උපයෝගිකරගෙන ආදායම් උත්පාදන ව්‍යාපෘතිවල නියැලී සිටින ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි සහනාධාරය ග්‍රාමීය කමිටු වල නිර්දේශ මත ඉවත් කිරීමට කටයුතු කලයුතු වුවත් නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 34 ක ප්‍රතිලාභීන් 1,112 ක ගේ සමෘද්ධි සහනාධාරය ඉවත් කිරීමට ග්‍රාමීය කමිටු වල නිර්දේශ ලබාදී නොනිබුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රජාමූල බැංකු 1,089 ක සාමාජිකයින් 4,115,100 ක ගේ මුළු තැන්පත් මුදල රු. බිලියන 155.1 ක් වන අතර එයින් ප්‍රතිලාභීන්ට ලබාදුන් ණය මුදල්වල පිටහිටි ශේෂය රු. බිලියන 68 ක් පමණක් විය. 2022 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 149 ක් ඉහළ පොළී අනුපාත යටතේ ආයෝජනය කර නිබුණු අතර සමෘද්ධිලාභීන්ගේ ඉතිරිකිරීම් සඳහා ගෙවා ඇත්තේ සියයට 3 ක් වැනි අඩු පොළියකි. මේ අනුව සමෘද්ධිලාභීන් සවිබල ගැන්වීම අරමුණු කරගෙන ප්‍රජාමූල බැංකු පද්ධතිය ආරම්භකර නිබුණද, වර්තමානයේදී සමෘද්ධිලාභියා සවිබල ගැන්වීමේ අරමුණෙන් බැහැරව, ලාභ අරමුණින් ක්‍රියාත්මක වී ඇති බව හා ලාභදායීත්වය කරා මෙහෙයවීමක් සිදුවන බව නිරීක්ෂණය විය.

(ඊ) ප්‍රජාමූල බැංකු වෙත මාසිකව ප්‍රේෂණය කරනු ලබන සමෘද්ධිලාභී සහනාධාර මුදල් ඇතැම් සමෘද්ධිලාභීන් විසින් මාසිකව ලබා නොගෙන දීර්ඝ කාලීනව තම බැංකු ගිණුම්වල රඳවා තබා නිබුණි. මේ සම්බන්ධයෙන් කරනු ලැබූ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රජාමූල බැංකු 10 ක වසම් 41 ක් තුල සමෘද්ධිලාභීන් 2,433 කගේ ඉතිරිකිරීමේ ගිණුම්වල එසේ රඳවා නිබූ මුදල රු.59,951,537 ක් (රු. 10,000 ට වැඩි ශේෂ) විය.

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) සමෘද්ධි විදුහුන් අලෙවි ජාලයක් ස්ථාපිත කිරීමට හා සමෘද්ධි නිෂ්පාදන සඳහා ප්‍රමිත සහනික ලබාදීමට වැඩසටහන් 5 ක් පැවැත්වීමට සැලසුම්කර නිබූ නමුත් ක්‍රියාත්මක කර නොනිබුණි.

(ආ) කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 15 ක් පැවැත්වීමට සැලසුම්කර නිබූ නමුත් වැඩසටහන් 6 ක් පමණක් පවත්වා නිබූ අතර ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 40 ක් වී නිබුණි.

(ඇ) සැලසුම් හා අධීක්ෂණ වැඩසටහන් යටතේ වැඩමුළු 02 (Workshop) ක් පැවැත්වීමට අපේක්ෂා කර නිබූ නමුත් එම වැඩමුළු පවත්වා නොනිබුණි.

(ඈ) ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ නව සමෘද්ධි ප්‍රජාමූල බැංකු 25 ක් සංවර්ධනය කිරීමට රු. මිලියන 7 ක් වෙන්කර නිබුණි. ඉන් රු. මිලියන 4.90 ක් එනම් ප්‍රතිපාදන මුදලින් සියයට 70 ක වියදමින් නව බැංකු 6 ක පූර්ණ යටිතල පහසුකම් සංවර්ධනය කර නිබූ අතර බැංකු 09 ක යටිතල පහසුකම් සියයට 50 ක පමණක් සංවර්ධනය කර නිබුණි.

3.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

(අ) 2017 හා 2018 වර්ෂයන් වල කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කීරගල සමෘද්ධි ආදර්ශ ගම්මානයේ ප්‍රතිලාභීන් 72කට ව්‍යාපෘති 11 ක් සඳහා රු. 1,970,000 ක් හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්මිකන්ද සමෘද්ධි ආදර්ශ ගම්මානයේ කිතුල් නිෂ්පාදන සඳහා ප්‍රතිලාභීන් 255 කට රු. 5,824,451 රජයේ දායකය ලබාදී නිබුණද මෙම ව්‍යාපෘති ආරම්භ කර වර්ෂ 4 ක් ගත වී ඇතත් ආදායම් උත්පාදන පිළිබඳව තොරතුරු ලබාගෙන සවිබලගැන්වීමට ඇති හැකියාව පිළිබඳව පසුවිපරමක් කර නොනිබුණි.

(ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 කට අයත් සමෘද්ධිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම ,නිෂ්පාදන ගම්මාන බිහිකිරීම තුළින් සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබලගැන්වීම සඳහා 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගම්පහ දිස්ත්‍රික්කයේ ආදර්ශ ගම්මාන 11 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් රු. 38,442,329 ක මුදල් වැයකර තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද ආදර්ශ ගම්මාන 06 ක්‍රියාත්මක කොට 2020 වර්ෂය වන විට වසර 04 ක් ඉක්මවා තිබුණද ව්‍යාපෘති වලට අදාළ පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) 2017 සිට 2021 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 ක් තුළ කර්මාන්ත, අලෙවි, කෘෂි, සත්ත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් 7986 දෙනෙකු වෙනුවෙන් රු.293,281,808 ක මුදලක් වැය කර තිබුණි. නියැදි පරීක්ෂාවේදී තෝරගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10කට අයත් ග්‍රාම නිලධාරී වසම්වල සමෘද්ධි ප්‍රතිලාභීන්ට ලබා දී තිබුණු යෙදවුම් උපකරණ ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය ආදායම් උත්පාදන ව්‍යාපෘති වලදී එකම ප්‍රතිලාභියාට අවස්ථා දෙකක දී ආදායම් උත්පාදන උපකරණ ලබාදී තිබුණු හා ප්‍රතිලාභියාගේ කර්මාන්තය නිවැරදිව හඳුනා නොගෙන භාණ්ඩ උපකරණ ලබා දුන් අවස්ථා මෙන්ම පෙර වර්ෂයේ කරගෙන යන ලද ව්‍යාපාරයට වෙනස් ආකාරයේ උපකරණ ලබාදී තිබූ අවස්ථාද විය. එසේම උපකරණ ලබාදීමේ දී ප්‍රතිලාභියා උපකරණ ලබා ගන්නේ නව ව්‍යාපෘතියක් සඳහා ද නැතහොත් පැරණි ව්‍යාපෘතිය සඳහා ද යන්න පසුවිපරමක් කර නොතිබුණි.

3.4 සුවබොජුන්හල් ඉදි කිරීම

2020 හා 2021 වර්ෂයන් තුළ සුවබොජුන්හල් 4 ක් ඉදිකිරීම සඳහා රු. 19,748,110 ක් වැය කර ඇතත් 2023 මාර්තු දක්වා එම අලෙවිහල් විවෘත කිරීමට නොහැකි වී තිබුණි. හබරාදුව, මතුගම හා කිලිනොච්චි සුව බොජුන්හල් සඳහා නවදූරටත් වැයකිරීමට අපේක්ෂිත මුදල් රු. මිලියන 19.55 ක් බව්ට ඇස්තමේන්තු සකස් කර ඇතත් මේ සඳහා ප්‍රතිපාදන 2023 වර්ෂයේ සලසා නොතිබුණි. ඒ අනුව අලෙවිහල් වල ඉදිකිරීම් ආරම්භ කොට වසර 2 ක් ගත වී ඇතත් වැඩ අවසන් නොවීමෙන් මෙම අලෙවිසල් නිෂ්කාර්යව පවතින බවත් සමෘද්ධි ප්‍රතිලාභීන් සුවබොජුන්හල් වෙත යොමුකර ආදායම් ඉපයීම තුළින් සවිබලගැන්වීමට කටයුතු කර නිබීම ප්‍රමාණවත් නොවන බවත් නිරීක්ෂණය විය.

3.5 මූල්‍ය අක්‍රමිකතා

සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවල 2014-2018 කාලය තුල සිදුවූ වර්නාකම රු. 115,723,619 ක් වූ වංචා 135 ක් පිළිබඳ 2018 සහ 2019 විගණකාධිපති වාර්තාවලින් පෙන්වාදී තිබුණි. 2023 අප්‍රේල් 21 දින විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව 2014-2018 කාල පරිච්ඡේදය සඳහා වංචා 15ක් වෙනුවෙන් රු. 63,817,207 ක් ද 2019 සිට 2023 පෙබරවාරි දක්වා වංචා 92 ක් වෙනුවෙන් රු. 172,189,227ක් ද හඳුනාගෙන නිබුණි. සියළු සමෘද්ධි බැංකු හා බැංකු සමිති පරිගණක ක්‍රියාවලියට යටත් කිරීම සිදු කරමින් ගනුදෙනු කාර්යන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කිරීමත් එමෙන්ම අතින් (Mannual) සිදු කිරීමේදී ඝිනාමුනා සිදු කරනා වැරදි හා මූල්‍ය වංචා අවම කරගැනීමට අපේක්ෂා කලද වාර්තාවී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි.

3.6 කළමනාකරණ දුර්වලතා

3.6.1 දත්ත පද්ධති පවත්වා ගැනීම

(අ) ප්‍රතිලාභී කළමනාකරන මොඩියුලය

2012 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් නිර්මාණය කරන ලද සමෘද්ධිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ තොරතුරු ඇතුළත් කළමනාකරණ මොඩියුලය ආශ්‍රයෙන් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමේ e - සමෘද්ධි ව්‍යාපෘතියට 2016 වර්ෂයේ දී රු. මිලියන 4.3 ක වියදමක් දරා තිබූ අතර, 2019 වර්ෂයේදී නැවත CRM මොඩියුලය සඳහා රු.මිලියන 4.07 ක් වැයකර තිබුණි. නමුත් 2023 වර්ෂය වන විටත් පහත සඳහන් උප මොඩියුලය තොරතුරු ඇතුලත් කොට පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි.

- ජලය හා විදුලිය පරිභෝජන තොරතුරු ඇතුළත් කර නොතිබුණි.
- COVID -19 සහනාධාර ලබාදීම සම්බන්ධ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.
- ජීවනෝපාය ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය හා ක්‍රියාත්මක තත්ත්වය සහ ප්‍රතිලාභීන් සවිබල ගැන්වී ඇති ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි.
- පද්ධතිය යාවත්කාලීන නොකිරීම නිසා 2018 සිට 2021 ඔක්තෝබර් දක්වා ප්‍රතිලාභීන් 309 ගේ සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි ත්‍යාග මුදල් රු.මිලියන 61.8 ක් අත්හිටුවීමට සිදු වීම
- වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු ඇතුලත් වී නොතිබුණි.
- මාසික සහනාධාර මුදල් ප්‍රාදේශීය කාර්යාල වෙත යැවීමේදී නිවැරදි දත්ත ලබා ගත නොහැකි නිසා සහනාධාර මුදල් වැඩිපුර යවා තිබීම.

(ආ) මානව සම්පත් කළමනාකරණ මොඩියුලය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීමේ අරමුණෙන් මානව සම්පත් කළමනාකරණ මොඩියුලය ආරම්භ කර තිබුණි. මෙම වාර්තාවේ දින වන විට දෙපාර්තමේන්තු සේවක සංඛ්‍යාව 25,235 ක ගෙන් සියයට 97 ක මූලික තොරතුරු පමණක් ඇතුළත් කර තිබුණි. අධ්‍යාපන සහතික ඇතුළු වැදගත් ලියකියවිලි පරිලෝකනගත කර පුද්ගලික ලිපිගොනු 306 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව 2021 හඳුන්වාදුන් මෙම පද්ධතියේ ක්‍රියාකාරිත්වය 2023 වන විටත් මූලික අදියරයේ පැවතුණි.

(ඇ) ප්‍රජාමූල බැංකු පරිගණක පද්ධතිය

සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගණුදෙණු කාර්යක්ෂමව කිරීම සඳහා Soft Watch හා SLTS විශයෙන් මෘදුකාංග දෙකක් හඳුන්වා දී තිබුණි. සමෘද්ධි බැංකු ශාඛා 1026 ක් මෙම මෘදුකාංගය භාවිතා කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලය සමඟ ඒකාබද්ධ නොවූ ශාඛා 12 ක් විසින් වසර 10 ටත් වඩා පැරණි මෘදුකාංගයකින් කටයුතු සිදු කරනු

ලබයි. පද්ධතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ප්‍රජා මූල බැංකු 9 න සිදුකල නියැදි පරීක්ෂාවේදී පහත අඩුපාඩු පවතින බව නිරීක්ෂණය විය.

දිනකට සිමින මුදල් ගෙවීම් ප්‍රමාණයක් පමණක් ක්‍රියාත්මක කළ හැකි වීම තුළින් පද්ධතිය මන්දගාමී වීම, ණය අයවීමේදී ක්‍රමවත් බවක් නොවීම ,ගිණුම් ශේෂ නිවැරදි නොවීම, පෙර ගනුදෙනු පරීක්ෂා කළ නොහැකි වීම, පරිගණක පද්ධතිය විටෙන් විට බිඳ වැටීම, බැංකුවේ සජීවී දත්තවලට ඇතුල් වීමේ හැකියාව මෘදුකාංග ආයතනයට තිබීම හේතුවෙන් දත්ත වෙනස්කල අවස්ථා පැවතීම හා පරිගණක පද්ධතිය මඟින් සහනාධාරලාභීන්ගේ ගිණුම්වලට බැරවන මුදල් වලින් ස්වයංක්‍රියව ණය අය කර ගැනීමට ඉඩ පහසුකම් සලසා තිබීම හේතුවෙන් ප්‍රජාමූල බැංකු 05 කට අයත් සහනාධාරලාභීන් 173 දෙනෙකුගේ ගිණුම්වලට බැර වූ සහනාධාර මුදල් රු.3,857,777 ක් ණය වාරික ලෙස අය වී නිබූ අවස්ථා නියැදි විගණනයේදී නිරීක්ෂණය විය.

3.6.2 දෙපාර්තමේන්තුව සතු අරමුදල්

(අ) 2013 අංක 1 දරන දිවිනැගුම් ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම් සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වේ. ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම් සංවර්ධන අරමුදලට බැරකල යුතු වූවත් දිවිනැගුම් සංවර්ධන අරමුදල මේ දක්වා පිහිටුවා නොනිබුණි.

(ආ) උක්ත පනතේ 45 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අරමුදල් 6 ක් පවත්වාගෙන යනු ලබන අතර සමෘද්ධි අරමුදල හා සේවක ණය වක්‍රීය අරමුදල මේ වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ඇ) 2020 අගෝස්තු 22 දිනැති අංක 2020/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.2 (ආ) ඡේදය ප්‍රකාරව දැනට පවතින අරමුදල් ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවයක් බව පෙනියන්නේ නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් අනුමත කර ගත යුතු වූවත් සමෘද්ධි ජාතික සමාජ අරමුදල පාර්ලිමේන්තු පනතක් මඟින් අනුමත කර ගැනීමකින් තොරව ක්‍රියාත්මක කර නිබුණි.

(ඈ) උක්ත අරමුදලේ නීත්‍යානුකූල තත්ත්වය විගණනයට ඉදිරිපත් නොවූ අතර අරමුදලේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 22 විගණනය වෙත ඉදිරිපත් කර නිබුණි. ප්‍රජාව තුල සමාජ සාධාරණත්වයක් ඉටු කිරීම සඳහා පිහිටුවා ඇති මෙම අරමුදල මඟින් 2021 හා 2022 වර්ෂයන් තුළ රු. 8,481,773ක් වූ ව්‍යාපෘති 03 ක් පමණක් ක්‍රියාත්මක කර නිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු. 8,048,684 ක ශේෂයක් අරමුදලේ පැවතුණි. 2022 දෙසැම්බර් 31 දක්වා කොවිඩ් වසංගතයෙන් සමිති ලියාපදිංචියෙන් ලද මුදලින් රු. 91,000,000 ක ස්ථාවර තැන්පතු ශේෂයන් පවත්වා ගෙන ගොස් නිබුන අතර ඒකාබද්ධ අරමුදලට බැරකර ඇත්තේ රු. 10,000,000 ක් පමණක් විය.

3.6.3 ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ක්‍රියාත්මක වීම

දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති විගණකාධිපතිවරයාට විගණනය කිරීමට හැකිවන ආකාරයට ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇතිකර පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොනිබුණි.

3.7 ආර්ථිකමය නොවූ ගනුදෙනු

2022 දෙසැම්බර් 31 දින වන විට මෘදුකාංගය මිලදී ගැනීම ඇතුළුව "e" පුවත්පත එළිදැක්වීම සඳහා රු 7,723,900 ක් වියදම් කර නිබුණි.

2022 අවසන් කාර්තුව වන විට e පුවත්පත පරිශීලනය කරන සංඛ්‍යාව 56,234 ක් හා e පුවත්පත දුරකථන යෙදවුම (e paper app) භාවිතාකරන ප්‍රමාණය 21,565 ක් හෙවත් එය මුළු සමාදායිලාභීන්ගේ සියයට 4.6 ක් වූයෙන් ක්‍රියාත්මක වීම ඉතා පහළ මට්ටමක පැවතුණි.

3.8 විදේශාධාර මත සහනාධාර ගෙවීම.

වන්මන් ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ 2022 මූල්‍ය සහනාධාර වශයෙන් රු. මිලියන 39,640 ක මුදලක් ලබාදී තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දත්ත පද්ධතිය අනුව සමාදායී පොරොත්තු ලේඛනගත සංඛ්‍යාව අනුව බැංකු වෙත මුදල් යවා නිබුණද මැයි, ජූනි හා ජූලි මාසවල 78,604 ක්වූ ප්‍රතිලාභීන්ගේ ගිණුම් විවිධ හේතු මත බැංකුව විසින් ඉවත් කර නිබුණද එම ප්‍රතිලාභීන්වද මුදල් යවා නිබුණි. දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීන නොවීම මේ සඳහා හේතු වී නිබුණි.

(ආ) සහනාධාර මුදල් බෙදාහැරීම සම්බන්ධයෙන් ප්‍රජාමූල බැංකු කිහිපයක සිදුකල නියැදි පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක ප්‍රජාමූල බැංකු දෙකක් විසින් මූල්‍ය සහනාධාර වශයෙන් අතිරේක දීමනා එකතුව රු. 55,529,060 ක් දින 22 සිට දින 106 ක් වැනි කාල පරාසයක් ප්‍රතිලාභීන් වෙත ලබා නොදී ප්‍රජාමූල බැංකුවල රඳවා ගැනීමට කටයුතු කර නිබුණි.

3.9 ප්‍රසම්පාදනය

(අ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක PFD/08/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතන 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වියයුතු අතර දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වියයුතු වේ. නමුත් මෙම වාර්තාවේ දිනය දක්වාම දෙපාර්තමේන්තුව ලියාපදිංචි වී නොනිබුණි. වෙළඳපල මිල සැදහුම් ක්‍රමය යටතේ කරනු ලබන මිලදී ගැනීම් 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමය හරහා සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොනිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) සහ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව සහ ප්‍රසම්පාදන කාල සටහන ඇතුළත් වන පරිදි පිළියෙළ කර නොනිබුණි.

3.10 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 12 න් සඳහා පිළිතුරු ලබාදීමට ප්‍රමාද වීම මාස 1 සිට මාස 5 දක්වා කාල පරාසයක් වන අතර විගණන විමසුම් 5 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගෙවනු දෙනු වටිනාකම් රු. 4,254,728,365 කි.

3.11 2016.12.16 දින පැවති කාරක සභාවේදී දී ඇති නියෝග ක්‍රියාත්මක නොකිරීම

නියෝග අංකය	නියෝගය	වර්තමාන තත්වය
7.3	දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 6 කදී රු. මිලියන 54.02 ක මුදුන් කටයුතු අදාළ මුදල් රෙගුලාසි වලින් බැහැරව සිදුකිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකොට වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියෝග කිරීම.	අභ්‍යන්තර පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.
9.1	මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව රු. 106.873.148 මුදලක් වැය කර ජල බහාලන බඳුන් මිළ දී ගැනීම, නොරතුරු විගණයට ඉදිරිපත් නොකිරීම සහ ප්‍රවාහනය සඳහා මිළ ගණන් කැඳවීමකින් තොරව ආයතන තෝරා ගැනීම සහ ගෙවීම් සිදු කිරීම.	අමාත්‍යාංශයෙන් අදාළ මූලික විමර්ශන සිදුකරමින් පවතින බව සඳහන් කර ඇතත් මිලදීගැනීම් වලට අදාල නොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.
9.4	දිවි නැගුම් සම්මේලන සඳහා රු. 16,629,435 කට මිලදීගත් උපකරණ හා පුවු ඇතුළු යටිතල පහසුකම් සහ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් රු. 1,954,300 ක් වැය කිරීම.	එකතුව රු. 16,629,475 ක් වූ උපකරණ සහ පුවු බෙදාදීම් සම්බන්ධයෙන් මේ වන විටත් විගණනයට නොතුරු ලබා දී නොතිබුණි.
9.5	දිවිනැගුම් ලින් 5.000.000 මුදණය කිරීම් සඳහා රු. 29.400.000 වැය කිරීම් සහ සියළු මුද්‍රණයන් බෙදා හැර ඇති බවට විගණනයට නහවුරු නොකිරීම.	මේ දක්වා අභ්‍යන්තර පරීක්ෂණ කටයුතු පිළිබඳ වාර්තා ඉදිරිපත් නොවීය.

4. මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

		2022.12.31 දිනට		
වර්ගීකරණ	අනුමත	තත්‍ය	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	108	79	29	
තෘතීයික	1942	1646	296	
ද්විතියික	25,509	23,339	2170	2485
ප්‍රාථමික	516	417	99	6
එකතුව	28,075	25,481	2594	2491

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත උපාධිධාරී සංවර්ධන නිලධාරීන් 2,287 ක් අනුයුක්ත කර තිබූ අතර ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සමෘද්ධි කළමනාකරු තනතුර සඳහා අනුමත ප්‍රමාණය ඉක්මවා 132 ක් බඳවාගෙන තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ කාර්යභාරය ,දිස්ත්‍රික් කාර්යාල වල කාර්යභාරය දිස්ත්‍රික්කය යටතේ ඇති එක් එක් ප්‍රජාමූල බැංකු කලාපවල කාර්යය නිලධාරියාගේ තනතුර අනුව කලයුතු කාර්යභාරය පිළිබඳ කාර්යමණ්ඩල සමාලෝචනයකින් තොරව අනුයුක්ත කිරීම් සිදුකර තිබුණි.

(ඇ) සමෘද්ධි කළමනාකරු තනතුර දරන නිලධාරීන් 108 දෙනෙකු ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර තිබුණි. නමුත් ප්‍රජාමූල බැංකු වල වැඩ බලන හා වැඩ ආවරණය සඳහා කළමනාකරුවන් වශයෙන් 123 දෙනෙකු බැංකු කාර්ය මණ්ඩලයට පත්කර වැඩබැලීමේ දීමනා වශයෙන් රු. 4,096,380 ක් 2022 වර්ෂය සඳහා ගෙවා තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තු කාර්යභාරය කාර්යක්ෂමව සිදුවන පරිදි කාර්ය මණ්ඩලය යොදවා නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) 2019 ජූලි 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව 2013 අංක 1 දරන දිවිනැගුම පනතේ 25 (3) වගන්තිය අනුව ප්‍රජාමූල බැංකු කාර්යමණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවකයින් ස්ථිර පදනමින් පත්කිරීම නීතියට පටහැනි බව ගරු නීතිපති තුමා විසින් දැනුම් දී ඇති බවත්, ප්‍රජා මූල බැංකු සම්මිවල දැනටමත් සේවයේ යෙදී සිටින දිවි නැගුම පනතේ 44 (ඉ) හා ii යටතේ දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ නිලධාරීන් තාවකාලික පදනමින් එම ආයතනවලට මුදා "හැර ඇති බවට සැලකිය යුතු වන අතර, ඉදිරියේදී බැංකු කාර්ය මණ්ඩලය සඳහා වෙනම තනතුරු අනුමත කරවා ගැනීමටත් ඉන් අනතුරුව පුරප්පාඩු වන තනතුරු සඳහා ඒ අනුව බඳවා ගැනීම් කිරීමට කටයුතු කළ යුතු බව දැක්වුවද, මේ දක්වා ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර බැංකු කාර්ය මණ්ඩලය 7605 ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ගෙවා තිබුණි. 2022 වර්ෂය සඳහා ගෙවා ඇති මුදල රු මිලියන 4,259.25 ක් විය.

(ඉ) විශ්‍රාම වැටුපට හිමිකම් රහිතව සේවා නියුක්ත භාරඅරමුදලට හා සේවක අරමුදලට සාධක අරමුදලට අබණ්ඩව දායකත්වය දරමින් දෙපාර්තමේන්තු සේවයට එක් වූ නිලධාරීන් සඳහා උසස්වීමේ පරිපාටි අනුමත කිරීම් මේ දක්වා නොහැකි වී ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට එම සේවක සංඛ්‍යාව 546 ක් වන අතර එදිනට විශ්‍රාම ගැන්වූ සංඛ්‍යාව 41 ක් වී තිබුණි.

(ඊ) වාර්ෂික විසර්ජන පනත අනුව දෙපාර්තමේන්තුවේ නත්‍ය සේවක සංඛ්‍යාව 24.647 ක් වූය ඇස්තමේන්තුවේ දක්වා තිබුණ ද සත්‍ය විශයෙන් වැටුප් ගෙවන සංඛ්‍යාව 25.481 ක් විය. ඒ අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ ඒකාබද්ධ සේවා වල නිළධාරීන් 445 දෙනෙකු හැර ඉතිරිය වූ 389 ක් වෙනුවෙන් වැටුප් ගෙවීම් පිළිබඳ විගණනයේදී ප්‍රශ්න ගත විය.

එම්.වී.අයි. ගම්ගේ
ජෙයෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය – 04 - කාර්යය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
01	සමාජ සුබසාධන වැඩසටහන	1	දිළිඳු පවුල් 1,727,266 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දීම.	100%		
		2	ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් 2,575,366 ක් සඳහා (සමෘද්ධි පවුල් -නිත්‍ය හා පොරොත්තු ලේඛනගත 2,415,910 වැඩිහිටි ආධාර ලබන පවුල් 131,152ආබාධිත ආධාර ලබන පවුල් 25,072 සහ වකුගඩු රෝගී පුද්ගලයින් 3,232)ලෝක බැංකු ආධාර යටතේ රු.3,000/- රු.5,000/- දක්වා හදිසි මූල්‍යාධාර ලබා දීම.	100%		
		3	ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් 2,989,924 ක් (සමෘද්ධි සහනාධාරලාභීන් -නිත්‍ය හා පොරොත්තු ලේඛනගත 2,382,445 වැඩිහිටි ආධාර ලාභීන් 473,680 ආබාධිත ආධාර ලාභීන් 90,545 සහ වකුගඩු රෝගී ආධාරලාභීන් 43,254) සඳහා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රු.3,000/- රු.5,000/- දක්වා හදිසි මූල්‍යාධාර ලබා දීම.	100%		
02	සමාජ ආරක්ෂණ වැඩසටහන	1	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 221,621 දෙනෙකුට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.	100%		
		2	උසස් පෙළ හදාරන සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල දරුවන් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම.	100%		
03	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	1	අතිරේක බෝග වගා වැඩසටහන යටතේ, ප්‍රතිලාභීන් 122 ක් සඳහා මුං ඇට, රට කජු හා මිරිස් වගාවන් සඳහා ආධාර කිරීම.			40%

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
		2	ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ, වසම් මට්ටමින් ගෙවතු සංවර්ධනය සඳහා ගෙවතු හිමියන් 140,210 ක් සඳහා පැළ හා රෝපණ ද්‍රව්‍ය ලබා දෙන ලදී.		70%	
04	ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	1	සමෘද්ධි සුව බොජුන් හල් 07 ක් වැඩි දියුණු කිරීම තුලින් සමෘද්ධි ව්‍යවසායකයින් පවුල් 175 ගේ ජීවන මට්ටම ඉහල නැංවීමට			60%
		2	අලෙවි පොලවල් 230 ක් පැවැත්වීම		80%	
		3	සමෘද්ධි ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275 ක් පැවැත්වීම.		85%	
		4	සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 8,000 ක් සඳහා තෘතීක අධ්‍යාපනය යටතේවෘත්තීය මාර්ගෝපදේශ පුහුණුව ලබා දීම.		80%	
05	නිවාස සංවර්ධන වැඩසටහන	1	නිවාස සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල්වල නිවාස ඒකක 9,676 ක් සංවර්ධනය සඳහා මූලාධාර ලබාදීම.	95%		
06	සමාජ සංවර්ධන වැඩසටහන	1	සමාජ සංවර්ධනය යටතේ ලෝක දිළිඳුකම පිටු දැකීමේ දින සැමරුම් හා ලෝක ළමා දින සැමරුම් වැඩසටහන් 335 ක් පැවැත්වීම.	100%		
07	ප්‍රජාමූල සංවිධාන වැඩසටහන	1	ප්‍රජාමූල සංවිධාන සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 26 ක් පැවැත්වීම			50%
08	තොරතුරු තාක්ෂණ වැඩසටහන	1	සමෘද්ධි කාර්යාල 335 ක ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම			60%
		2	සමෘද්ධි ප්‍රජාමූල බැංකු 200 න් ප්‍රජාමූල බැංකු සමිති 150ක් පරිගණකගත කිරීම.		75%	
		3	තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් 92 ක් පැවැත්වීම	90%		

අ. අ	වැඩසටහන	විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ව නිමැවුම		
				100% -90%	75% -89%	50% -74%
09	මානව සම්පත් සංවර්ධන වැඩසටහන	1	දෙපාර්තමේන්තු සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 12ක් ක්‍රියාත්මක කිරීම			72%
		2	දෙපාර්තමේන්තුව සතු පුහුණු මධ්‍යස්ථාන 03ක් සංවර්ධනය කිරීම			55%
10	ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන	1	සමෘද්ධි ප්‍රතිලාභීන් 292,331 ට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම.			70%
		2	නව සමෘද්ධි ප්‍රජාමූල බැංකු 15 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.			**70%**
11	මාධ්‍ය හා ප්‍රචාරණ වැඩසටහන	1	**"**සමෘද්ධි උදානය**"** රූපවාහිනී වැඩසටහන් 38 ක් ප්‍රචාරය කිරීම			73%
		2	E සමෘද්ධි පුවත්පත් 24 ක් පල කිරීම	100%		
12	සැලසුම් හා මෙහෙයුම් වැඩසටහන	1	දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් 185 ක් පැවැත්වීම		80%	
		2	දෙපාර්තමේන්තුවේ 2021 කාර්ය සාධන වාර්තාව සකස් කිරීම හා එහි පිටපත් 25 ක් මුද්‍රණය කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	100%		

පරිච්ඡේදය – 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය (%)		
				0% - 49%	50% - 74%	75% - 100%
01	දුගීබව අවසන් කිරීම	2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම.	සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ලක්ෂ 17කගේ පරිභෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා මාසිකව සහනාධාර මුදලක් ලබා දීම.			100%
			සමෘද්ධි සහනාධාරලාභී පවුල් 41,389 ක් සවිබල ගැන්වීම.	42%		
			ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ, ගෙවතු හිමියන් 140,210 සඳහා පැල හා රෝපණ ද්‍රව්‍ය ලබා දීම තුළින් එම පවුල්වල ජීවන තත්වය උසස් කිරීම.		70%	
			සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් උත්පාදන මාර්ග වැඩි දියුණු කර ගැනීම සඳහා පවුල් 210,765 කට ක්ෂුද්‍රමූල්‍ය ණය පහසුකම් ලබා දීම.		62%	
		පහළ ආදායම් මට්ටමේ අයද ඇතුලත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම.	සමෘද්ධි සහනාධාරලාභී පවුල් 197,162 ගේ සමාජ ආරක්ෂණය ඉහල නැංවීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම.			75%
			සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහනාධාරලාභී පවුල්වල උසස් පෙළ හදාරණ ළමුන් 314,039 සඳහා මාසිකව ශිෂ්‍යත්ව මුදලක් ලබා දීම තුලින් එම ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම.			78%

ඉලක්කය / අරමුණ		ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය (%)		
				0% - 49%	50% - 74%	75% - 100%
			ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් 2,575,366 ක් සඳහා ලෝක බැංකු ආධාර යටතේ රු.3,000/- කට රු.5,000/- දක්වා මාසික හදිසි මූල්‍යාධාර ලබා දීම.			100%
			ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් 2,575,366 ක් සඳහා (සමෘද්ධි පවුල් -නිත්‍ය හා පොරොත්තු ලේඛනගත 2,415,910 වැඩිහිටි ආධාර ලබන පවුල් 131,152ආබාධිත ආධාර ලබන පවුල් 25,072 සහ වකුගඩු රෝගී පුද්ගලයින් 3,232)ලෝක බැංකු ආධාර යටතේ රු.3,000/- රු.5,000/- දක්වා හදිසි මූල්‍යාධාර ලබා දීම.			100%
		සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍රමූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.	ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් පීඩාවට පත් වූ පවුල් 2,989,924 ක් (සමෘද්ධි සහනාධාරලාභීන් -නිත්‍ය හා පොරොත්තු ලේඛනගත 2,382,445 වැඩිහිටි ආධාර ලාභීන් 473,680 ආබාධිත ආධාර ලාභීන් 90,545 සහ වකුගඩු රෝගී ආධාරලාභීන් 43,254) සඳහා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ රු.3,000/- රු.5,000/- දක්වා හදිසි මූල්‍යාධාර ලබා දීම.			80%
08	ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය	කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම	සමෘද්ධි සුව බොජුන්හල් 07ක් සංවර්ධනය කර සමෘද්ධි ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම.		60%	
			සමෘද්ධි ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 276 ක් ක්‍රියාත්මක කිරීම.		74%	
			සමෘද්ධි හා අඩු ආදායම්ලාභී නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අළෙවි අවස්ථා ඇති කිරීම සඳහා සමෘද්ධි අළෙවි පොළවල් 230 ක් පැවැත්වීම.		69%	
09	නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම.	සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල නිවාස 7,018ක් වැඩි දියුණු කර එම පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීම.			80%

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

i. දිළිඳු පවුල් 1,727,266 ක් සඳහා සමෘද්ධි සහනාධාර ලබා දී ඔවුන්ගේ පරිභෝජන අවශ්‍යතා සපුරා ලීම. මේ යටතේ , රු.4,500/-, රු.3,200/-, රු.1,900/- හා රු.420/- වශයෙන් කාණ්ඩ 04 ක් යටතේ මූල්‍ය සහනාධාරයන් මාසිකව ප්‍රතිලාභීන්ට ලබාදෙන ලද අතර, 2022 වර්ෂය තුල ලබාදුන් සහනාධාරයන් හි මූල්‍ය වටිනාකම රු.මි. 36,622.81ක් වේ.

ii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරු දැරියන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ, මසකට රු.1,500/= බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.36,000/= මූල්‍ය ආධාරයක් ලබා දෙන ලද අතර, ඒ අනුව 2022 වර්ෂය තුල සමෘද්ධි සිසු දරු දැරියන් 1,057,725 ක් සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දී ඇති අතර, ප්‍රධානය කල මුළු ශිෂ්‍යත්ව වටිනාකම රු.මි. 1,587 ක් වේ.

iii. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා, එම පවුල්වල දරු උපත් 19,190 ක් සඳහාත්, විවාහ 40,472 ක් සඳහාත්, ලෙඩ රෝග වැළඳුනු ප්‍රතිලාභීන් 107,694 ක් සඳහාත්, මරණ 54,265 ක් සඳහාත්, වශයෙන් මුළු පවුල් 221,621 ක් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම. මේ යටතේ, ලබාදී ඇති සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයන්හි මූල්‍ය වටිනාකම රු.මි. 3,618.78 ක් වේ.

iv. රටේ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් දුෂ්කරතාවයන්ට පත් වූ සමෘද්ධි අඩු ආදායම්ලාභී හා අනෙකුත් කාණ්ඩගත පවුල් (වැඩිහිටි ආබාධිත හා වකුගඩු රෝගී පවුල්) සඳහා හදිසි මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහනක්, ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ලෝක බැංකු මූල්‍යාධාර යටතේ ඉහත කාණ්ඩයන්ට අයත් මුළු පවුල් 2,575,366 ක් සඳහා රු.3,000/- සිට රු.5,000/- දක්වා වූ මාසික මූල්‍යාධාර ලබා දෙන ලදී. 2022 මැයි සිට ජූලි දක්වා කාලය තුළ ලබා දෙන ලදී. ලබා දෙන ලද මූල්‍යාධාරයේ මුළු වටිනාකම රු.මි.39,619.31 ක් වේ.

ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ 2022 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා කාලය තුළ ඉහත පවුල් කාණ්ඩ යටතේ මුළු පවුල් 2,989,924 ක් සඳහා රු.3,000/- සිට රු.5,000/- දක්වා වූ හදිසි මූල්‍යාධාර දීමනාවක් ලබා දෙන ලදී ලබා දෙන ලද මූල්‍යාධාරයන්හි මුළු වටිනාකම රු.මි.44,579.20 ක් වේ.

v. අතිරේක බෝග වගා වැඩසටහන යටතේ, ප්‍රතිලාභීන් 122 ක් සඳහා මුං ඇට, රට කජු හා මිරිස් වගාවන් සඳහා ආධාර කිරීම. වැය කරන ලද මුදල රු.මි.1.45 ක් වේ.

vi. ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ, වසම් මට්ටමින් ගෙවතු සංවර්ධනය සඳහා ගෙවතු හිමියන් 140,210 ක් සඳහා පැළ හා රෝපණ ද්‍රව්‍ය ලබා දෙන ලදී. වැයකල මුදල රු.මි. 14.02 ක් වේ.

vii. නිවාස ලොතරැයි වැඩසටහන යටතේ රු.200,000/- නිවාස ලොතරැයි දිනුම් ඇදීම යටතේ ප්‍රතිලාභීන් 6,680 දෙනෙකු සඳහා ද රු.600,000/-නිවාස ආධාර, ප්‍රතිලාභීන් 980 දෙනෙකු සඳහා ද රු.200,000/- නිවාස ආධාර ප්‍රතිලාභීන් 1,045 සඳහා ද රු.100,000/- නිවාස ආධාර ප්‍රතිලාභීන් 971 ක් සඳහාද ලබා දෙන ලදී. ප්‍රධානය කරන ලද මූල්‍ය ආධාරයන්හි මුළු වටිනාකම රු.මි. 1,413.94 ක් වේ.

viii. සමෘද්ධි සුව බොජුන් හල් 07 ක් වැඩි දියුණු කිරීම තුලින් සමෘද්ධි ව්‍යවසායක පවුල් 175 ගේ ජීවන මට්ටම ඉහල නැංවීමට හැකිවීම. වැයකරන ලද මුදල රු.මි. 105.23ක් වේ.

ix. දිවයින පුරා පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු1,089 ක් මගින් සහන පොළි ප්‍රතිශතයන් යටතේ,සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසාය සංවර්ධනය, ජීවනෝපාය සංවර්ධනය, ස්වයං රැකියා හා පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන්, ප්‍රතිලාභීන් 292,331 දෙනෙකු සඳහා රු.මි. 38,164 ක් වටිනා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීම. ප්‍රජාමූල සංවිධාන හා ක්‍රියාත්මක කල අරුණලු ණය 296,546 ග්‍රාම නිලධාරී වසම් 4583 ක , රු.මි. 1,013 ක් ප්‍රතිලාභීන් වෙත ගෙවා ඇත.

x. පසුගිය වසරට සාපේක්ෂව සමෘද්ධි බැංකු තැන්පතු වටිනාකමෙහි වර්ධනය රු.මි. 19,397වේ. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු හා අනුගත වෙමින් ක්ෂුද්‍රමූල්‍යකරණය තුලින් අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබල ගැන්වීමේ මහඟු කර්තව්‍ය ඉටුකර ගැනීම සඳහා පවතින බැංකු පද්ධතිය ශක්තිමත් වීම.

xi. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සේවාව පුළුල්කර ණය පහසුකම් වැඩි කිරීමේ අරමුණින් නව බැංකු හා බැංකු සමිති 15 ක් යටතල පහසුකම් සංවර්ධනය කිරීම. වැය කරන ලද මුළු මුදල රු.මි.04.90ක් වේ.

xii. අළෙවි පොළවල් පැවැත්වීම තුලින් සමෘද්ධි ප්‍රතිලාභීන් ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අලෙවි පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් 25 තුල අලෙවි පොළවල් 230 ක් පැවැත්වීම.

xiii. සමෘද්ධි ව්‍යවසායකයින් දිරි ගැන්වීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 275 ක් පවත්වා ව්‍යවසායකයින් 11,300 කට ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම.

xiv. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 8,000 ක් සඳහා තෘතීක අධ්‍යාපනය යටතේ වෘත්තීය මාර්ගෝපදේශ පුහුණුව ලබා දීම.

xv. ප්‍රතිලාභී ගනුදෙනු කාර්යක්ෂම කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,089 ක් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335 ක් පරිගණකගත කිරීමට කටයුතු කිරීම.

xvi. සමාජ සංවර්ධනය යටතේ ලෝක දිළිඳුකම පිටුදැකීමේ දින සැමරුම් හා ලෝක ළමා දින සැමරුම් වැඩසටහන් 335 ක් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

xvii. 2020,2021 වසරවල පැවති Covid වසංගත තත්ත්වය හා ඉන් පසුව පැවති ආර්ථික හා දේශපාලනික වෙනස්කම් හමුවේ වුවද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා ප්‍රජා නායකයින් එක්ව සිදුකල වැඩසටහන් මගින් අත්කරගෙන ඇති ආර්ථික හා සමාජ ප්‍රතිලාභ පිළිබඳ සාරාංශයක් පහත වගුවේ දක්වා ඇත.

	පිරිවැය ප්‍රතිලාභ	2020	2021	2022
1	**වියදම් කල මුදල (රු.මි.)**	**67,567,06**	**74,156.50**	**83,368.30**
2	**ප්‍රතිලාභ වටිනාකම (රු.මි.)**	**156,297.83**	**130,363.29**	**149,422.86**
	*ආර්ථික ප්‍රතිලාභ	148,415.93	122,918.66	141,473.83
	*සමාජ ප්‍රතිලාභ	7,881.90	7,717.63	7,949.63

ප්‍රස්ථාන සටහන V - පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය



පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සංඛ්‍යා සටහන - (XXVIII)

අනුමත සේවක සංඛ්‍යාව (2019.07.05 අනුමත කාර්ය මණ්ඩලය අනුව)		පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	108	79	29
තෘතීයික	1,942	1,646	296
ද්විතීයික	25,509	23,339	2,170
ප්‍රාථමික	516	434	99
එකතුව	**28,075**	**25,481**	**2,594**

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවේ සමෘද්ධි බැංකු පද්ධතිය හා වෙනත් අරමුදල් මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රශස්ථ කාර්යමණ්ඩල සංයුතිය සකස් කර 2021 ඔක්තෝබර් මාසයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ සඳහා අනුමැතිය ලද වහාම පුරප්පාඩු තනතුරු සඳහා විධිමත් බඳවා ගැනීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. එම කටයුතු ප්‍රමාද වීම තුල අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

6.3.1 හැඳින්වීම.

දිළිඳුකම පිටුදැකීමේ මූලික අරමුණ පදනම් කරගෙන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්වලට සජීවීව දායක වන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදිය යුතුය. ඒ අනුව එම වැඩසටහන් කාර්යක්ෂමව සහ නිවැරදිව ජනතා සේවයට වඩාත් සමීප වෙමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය දැනුම ආකල්ප සහ සුසමාදර්ශයන්ගෙන් අපගේ නිලධාරීන් සන්නද්ධ කිරීම සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල නියෝජනය වන පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

6.3.2. අරමුණු :

- දෙපාර්තමේන්තුව තුළ පරිපූර්ණ සම්පත්දායක පිරිසක් හා සියලුම කාර්යය මණ්ඩලය සුවිශේෂී දක්ෂතා ඇති මානව සම්පතක් බවට පත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙවර ලභාකර ගත හැකි වන පරිදි දක්ෂතා සහිත කාර්යය මණ්ඩලයක් බිහි කිරීම.
- නිවැරදිව කළමනාකරණය තුළින් ධනාත්මක ආකල්පවලින් පරිපූර්ණ මානව සම්පතක් බිහි කිරීම.
- සමෘද්ධි ව්‍යාපාරයට සෘජුවම දායක වන ප්‍රතිලාභී ප්‍රජාව සමග මැදිහත්කරුවන් ලෙස කටයුතු කරන නිලධාරීන් ඵලදායී හා කාර්යක්ෂම ගති ලක්ෂණවලින් සමන්විත කාර්යය මණ්ඩලයක් බවට පත් කිරීම.

- 2022 වර්ෂයේ සමස්ත දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරාලීමට සහයවීම.
    a) සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම.
    b) සමස්ත බැංකු පද්ධතිය ලාභ ලබන බැංකු බවට පත්කර සමෘද්ධි පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම.

- පාරිභෝගික ආකර්ෂණය ඉහළ නැංවෙන පරිදි සමෘද්ධි බැංකු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

6.3.3. 2022 වර්ෂයේ - ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

01. අධ්‍යාපනික සහ වෘත්තීය පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් යොමු කිරීම

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා උසස් අධ්‍යාපන පාඨමාලා සහ වෘත්තීය පුහුණු පාඨමාලා හැදෑරීම සඳහා උනන්දු කරවීමේ අරමුණින් නිලධාරීන් පෞද්ගලිකව තෝරාගෙන හදාරනු ලබන පාඨමාලා සඳහා පාඨමාලා ගාස්තු අදාල ආයතන වෙත ගෙවන ලදී.

02.සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වන සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තුවෙන් 50% ක් ගෙවා නිලධාරීන් පුහුණුවට යොමු කර ඇත.

03 **විෂයානුබද්ධ පුහුණු වැඩසටහන්**

i. කාර්යාල කාර්ය සහායකයින් සඳහා තම රාජකාරියට අදාළව ධාරිතා සංවර්ධන පුහුණුව ලබාදෙන ලදි.

ii. කළමනාකරණ සහකාරවරුන් පුහුණු කිරීම.
සියළුම දිස්ත්‍රික්වල සේවය සඳහා අනුයුක්ත කර ඇති කළමනාකරණ සහකාරවරුන් සඳහා ආයතන, පරිපාලන සහ ගිණුම් කටයුතු ඇතුළු නේවාසික පුහුණුවට ලබාදෙන ලදි. එමෙන්ම කුරුණෑගල, කළුතර නවක සංවර්ධන නිලධාරීන් සඳහා තම විෂයයට අදාලව විෂයානුබද්ධ පුහුණුව ලබාදෙන ලදි. එසේම කළුතර දිස්ත්‍රික්කයේ වැඩ බලන කළමනාකරුවන්ට තම විෂය පථයට අදාලව දැනුම ලබාදෙන ලදි.

iii. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා සමාජ වැඩ පිළිබඳ සහතිකපත් පාඨමාලා පැවැත්වීම.
සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි විෂය ඍජුවම අදාළ වන කරුණු ඇතුලත් සමාජ වැඩ පිළිබඳ සහතිකපත් පාඨමාලාවක් ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වනු ලැබේ.

iv. මානව සම්පත් මොඩියුලයට දත්ත ඇතුලත් කිරීම සහ එම දත්ත විවිධ අවශ්‍යතා සඳහා යොදා යොදා ගන්නා ආකාරය සම්බන්ධ ZOOM තාක්ෂණය ඔස්සේ දැනුවත් කරන ලදි.

v. කළමනාකරණ සහකාරවරුන් සඳහා දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ආයතන පරිපාලන සහ ගිණුම් කටයුතු සම්බන්ධ පුහුණු කරන ලදි.

04. රියදුරු කාර්යය මණ්ඩලය සඳහා පැවැත්වූ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන

රියදුරෙකු ලෙස තම කාර්යභාරය වගකීමෙන් යුතුව ඉටුකිරීම, වාහන නිසි ආකාරව නඩත්තු කිරීම සහ රියදුරෙකු වශයෙන් අත්‍යාවශ්‍යයෙන්ම දැන සිටිය යුතු තාක්ෂණික කරුණු ඇතුලත් රියදුරන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම රියදුරන් සඳහා නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදි.

05. සමෘද්ධි කළමණාකරුවන් ප්‍රජා සංවර්ධනය හා සැළසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා යොමු කිරීම.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා අප දෙපාර්තමේන්තුවේ නිළධාරීන් යොමු කර ඇත. මෙහි අන්තර්ගතයේ සඳහන් කරුණු දිළිඳුකම පිටු දැකීම සඳහා ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් සහ ක්‍රමෝපායන්ට අදාලව සකස් කර ඇත. එම දැනුම අප නිලධාරින්ට ලබාදීම දිළිඳුකම පිටු දැකීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසහටහන් වඩාත් නිවැරදිව කිරිමේදී උපකාරී වේ.

06. A+ කණ්ඩායම සඳහා NVQ Level IV සහතිකය RPL **ක්‍රමවේදය යටතේ ලබා දීම.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලු දිස්ත්‍රික්කවල තොරතුරු තාක්ෂණ අංශයට අනුයුක්තව බැංකු හා වෙනත් කාර්යාල මට්ටමින් සේවය කරන A+ පාඨමාලාව හදාරණ ලද වසර 04 ක සේවා පළපුරුද්දක් ඇති නිළධාරීන්ට අමතර වෘත්තීය සුදුසුකමක් වශයෙන් NVQ Level IV සහතිකය RPL ක්‍රමවේදය යටතේ ලබා දීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත යොමු කරන ලදී. 2022 මාර්තු/අප්‍රේල් මාසවලදී නිලධාරින් ප්‍රායෝගික පරීක්ෂණ සඳහා යොමුකර මෙම සහතික පත් නිකුත් කිරීමේ වැඩපිළිවෙල ආරම්භ කරන ලදි .

07. සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.

සමාජ වැඩ පිළිබඳ කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ ii සහ iii ශ්‍රේණි වල සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ජාතික සමාජ සංවර්ධන ආයතනය (NISD) හා ඒකාබද්ධව පවත්වනු ලැබේ. ඒ අනුව දිස්ත්‍රික් 25 සේවය කරන නිළධාරීන්ට ZOOM තාක්ෂණය ඔස්සේ මාර්ග ගත ක්‍රමයට මාස 06 ක් පුරා මෙම පුහුණු වැඩසටහනක පවත්වා අමතර දැනුම ලබා දීම.

08.ගිණුම්කරණය සහ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකා චරලත් ගිණුම්කරණ හා ව්‍යාපාර අධ්‍යනය ආයතනය හා ඒකාබද්ධව සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය බැංකු හා බැංකු සමිති වල සේවය කරන සමෘද්ධි කළමණාකරුවන් හා සංවර්ධන නිළධාරීන් සඳහා ඉහත පුහුණු වැඩසටහන පවත්වනු ලබයි. දේශීය රාජ්‍ය හා පෞද්ගලික බැංකු වල අනුගමනය කරනු ලබන කළමනාකරණය, ගිණුම්කරණය, බැංකුකරණය ඇතුළු අනෙකුත් සම්මත ක්‍රම පිළිබඳ දැනුම සහ පුහුණුව ලබා දී එතුළින් අපගේ බැංකු පද්ධතිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී තත්වයට පත් කිරීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තරව පිළිගත් විෂය නිර්දේශයන් යටතේ ඉහත පුහුණු වැඩසටහන දින 06 ක් පුරා නේවාසිකව පවත්වා අවශ්‍ය දැනුම ලබා දීමට කටයුතු කරනු ලැබේ.

09. සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

සමෘද්ධි දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල පුහුණුව සඳහා යොදාගනු ලබන මාතර, සමනළ වැව නිල්ලඹ පිහිටි පුහුණු මධ්‍යස්ථානවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදි. තවද මධ්‍යස්ථානවල කටයුතු කරගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගන්නා ලදි.

සංඛ්‍යා සටහන - (XXIX)

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
දේශීය පුහුණු වැඩසටහන්							
1	ප්‍රධාන කාර්යාලය සංවිධානය කළ නිලධාරී පුහුණු වැඩසටහන්						
	1.ධාරිතා සංවර්ධන වැඩසටහන-රියදුරු	87	දින 02	550,000.00		දේශීය	දෙපාර්තමේන්තුගත රියදුරු මහතුන් 87 දෙනෙකු පුහුණු කරන ලදී. මෙම පුහුණු වැඩසටහනේදී රියදුරු මහතුන් විසින් දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු සහ තාක්ෂණික දැනුම ලබා දෙන ලදී.
	2. ප්‍රජාසංවර්ධනය පිළිබඳ දිස්ත්‍රික් කළමනාකරුවන් දැනුවත්කිරීමේ වැඩසටහන.	12	දින 01	7,260.00		දේශීය	කළමනාකරුවන් 12 ලලලලලලලලක දෙනකු ප්‍රජා සංවර්ධන විෂයය පිළිබඳව දැනුවත් කරන ලදී.
2	1.වෘත්තීය සංවර්ධන පාඨමාලා ගාස්තු ගෙවීම.	8		358,350.00		දේශීය	නිලධාරීන් 8 දෙනෙකු සඳහා පාඨමාලා ගාස්තු ගෙවන ලදි. දෙපාර්තමේන්තු කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය අමතර දැනුම ලබාදීම එ තුළින් සිදුවිය.
	2. A+ නිළධාරීන් සඳහා NVQ 4 මට්ටම සහතික පත් ලබා දීම.	188	මාස 03			දේශීය	A+ පාඨමාලාව හදාරා ඇති නිලධාරීන්ගේ වෘත්තිය කුසලතා ඇගයීම.
	3. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්.උපාධි ඩිප්ලෝමාව(ප්‍රජා සංවර්ධන) හැදෑරීම සඳහා සමෘද්ධිකළමණාකරුවන සඳහාපාඨමාලාගාස්තුවෙන් 50% ගෙවීම(60000/ x39=2340000)	39	මාස 12			දේශීය	දිළිදුකම පිටුදැකීමේ නව උපාය මාර්ග සම්බන්ධයෙන් කළමනාකරුවන් 39 සඳහා දැනුම ලබා දීම . මෙමගින් රාජකාරී කටයුතු සඳහා අමතර දැනුම ලබා ගැනීමට හැකියාව ලැබේ.

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
	4.ස.සං.නි.සඳහා NISD ආයතනය මගින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමාව හැදෑරීමට 50% පාඨමාලා ගාස්තු ගෙවීම.	22	මාස 06	330,000.00		දේශීය	සංඥද්ධි සංවර්ධන ධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත්ව කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
	උප එකතුව			**1,245,610.00**			
3	දිස්ත්‍රික් කාර්යාල සංවිධානය කළ නිලධාරී පුහුණුවැඩසටහන්						
	1. සියලුම දිස්ත්‍රික්කවල කා.කා.ස. නිලධාරීන්සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම	75	දින 02	263,051.65		දේශීය	කා.කා.ස.නිලධාරීන් විසින් දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ දැනුම ලබා දෙන ලදී.
	2. කළුතර දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ (වැ.බ) පුහුණු වැඩසටහන	41	දින 02	35,300.00		දේශීය	රාජකාරී වපසරිය සම්බන්ධයෙන් දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී
	3.සියලු දිස්ත්‍රික්කවල කළමණාකාර සහකාරවරුන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණුව	57	දින 03			දේශීය	මෙතුළින් කළමනාකරණ සහකාර වරුන්ගේ විශය දැනුම සංවර්ධන ය කරන ලදී
	4.කුරුණෑගල දිස්ත්‍රික්කයට අලුතින් පත්වූ ස.නි. සඳහා ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම.	55	දින 01	15,250.00		දේශීය	ස.නි. වරුන්ගේ ව්‍යවසාය සංවර්ධන දැනුම සංවර්ධන ය කරන ලදී.
	5.මානව සම්පත් මොඩියුලය පිළිබඳව මන්නාරම් දිස්ත්‍රික් නිලධාරීන් පුහුණු කිරීම	22	දින 01	17,000.00		දේශීය	කාර්යක්ෂමව සහ නිවැරදිව සහ අඩු වියදමකින් පෞද්ගලික ලිපි ගොනු සකස් කිරීම
	6. උතුරු නැගෙනහිර ප්‍රදේශවල නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳ පුහුණු කිරීම	112	දින 01	130,400.00		දේශීය	කාර්යක්ෂමව සහ නිවැරදිව විශ්‍රාම වැටුප් ලිපි ගොනු සකස් කිරීම

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
	7.මානව සම්පත් මොඩියුලය පිළිබඳව මාර්ගගත පුහුණුව-දිස්ත්‍රික් /ප්‍රාදේශීය නිලධාරීන් සඳහා	441	දින 01	13,500.00		දේශීය	කාර්යක්ෂමව සහ නිවැරදිව සහ අඩු වියදමකින් පෞද්ගලික ලිපි ගොනු සකස් කිරීම
4	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන විදේශ පුහුණු අවස්ථා සඳහා සුදුසු නිලධාරීන් යොමුකිරීම.	50				විදේශීය	
	උප එකතුව			**474,501.61**			
	එකතුව			**1,720.111.65**			
	වැය ශීර්ෂ 331-02-02-003-02509						
5	i.සමනළවැව පුහුණු මධ්‍යස්ථානය			985,625.37			ආපන ශාලාව අලුත්වැඩියා කිරීම සහ Exhaust fan සවිකිරීම
	ii.නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය			1,963,405.84			නේවාසිකාගාරය, ආපන ශාලාව, නාන කාමර, ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීම
				388,779.25			උපකරණ මිලදී ගැනීම
				337159.10			රඳවා ගැනීමේ ගාස්තු ගෙවීම
	iii.මාතර පුහුණු මධ්‍යස්ථානය			1,439,156.44			ආරක්ෂක කුටිය ගේට්ටුව සහ බිත්ති අලුත්වැඩියා කිරීම
				78,279.76			උපකරණ මිලදී ගැනීම
				776,000.00			Desktop, Multimedia, Projector, Laptop මිලදී ගැනීම
				183,630.00			විදුලි සෝපානය අලුත්වැඩියා කිරීම
				158,700.00			විදුලි සෝපානය සේවා ගාස්තු
	උප එකතුව			**6310735.76**			

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
6	**දිස්ත්‍රික් නිලධාරීන් සඳහා සංවිධානය කළ වැඩසටහන්**						
	1.මානව සම්පත් මොඩියුලය පිළිබඳව මාර්ගගත පුහුණුව - විෂය කළමනාකරුවන් සඳහා	225	දින 01	31,500		දේශීය	කාර්යක්ෂමව සහ නිවැරදිව සහ අඩු වියදමකින් පෞද්ගලික ලිපි ගොනු සකස් කිරීම
	2. සියලුම දිස්ත්‍රික් නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳ පුහුණුව	85	දින 03	433,455		දේශීය	කාර්යක්ෂමව සහ නිවැරදිව විශ්‍රාම වැටුප් ලිපි ගොනු සකස් කිරීම
	3.ස.සං.නි.සඳහා NISD ආයතනය මගින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා ගාස්තු ගෙවීම.	700	මාස 06	1,187,500.00		දේශීය	සංවර්ධන නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
	4.මොණරාගල සහ කළුතර දිස්ත්‍රික්කවල බැංකු නිලධාරී පුහුණු වැඩසටහනක් පැවැත්වීම.	110	දින 01	103,950.00		දේශීය	නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
	5.කළුතර දිස්ත්‍රික්කයේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම	60	දින 02	65,550.00		දේශීය	නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
	6. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම	200	දින 02	130,240.00		දේශීය	නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
	7.කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සඳහා ජපන් භාෂා පුහුණු වැඩසටහන	264	දින 01	47,760.00		දේශීය	නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම
	8.ප්‍රාදේශීය විගණන නිලධාරී රැස්වීම	135	දින 01	85,875.00		දේශීය	
7	ප්‍රධාන කාර්යාලය සංවිධානය කළ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන්						
	1.උසස් අධ්‍යාපන පාඨමාලා ගාස්තු ගෙවීම	06	මාස 06	457,950.00		දේශීය	දෙපාර්තමේන්තු කටයුතු කරගෙන යාම සඳහා නිලධාරීන්ට අවශ්‍ය ය අමතර දැනුම ලබාදීම තුළින් සිදුවිය

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ලබාගත් දැණුම
				දේශීය	විදේශීය		
	2.MN II නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම	146	දින 02	93,750.00		දේශීය	නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
	3.වැටුප් -පුහුණුව මෙට්‍රොපොලිටන් කැම්පස්	3	දින 03	54,000.00		දේශීය	
	7.විමර්ෂණ ඒකකයේ නිලධාරී පුහුණුව	20	දින 01	30,229.00		දේශීය	නිලධාරීන්ගේ රැකියා කටයුතු වඩාත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම.
	උප එකතුව			**2,721,759.00**			
	එකතුව			**9,032,494.76**			
8	බැංකු කාර්යමණ්ඩලය සඳහා CMA ආයතනය මගින් ගිණුම්කරණ සහ ව්‍යාපාර අධ්‍යනය පිළිබඳ පුහුණු පාඨමාලාව පැවැත්වීම.	298	දින 06	6,348,550.00		දේශීය	සම්මත ක්‍රමවේද අනුව සමෘද්ධි කෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතියේ බැංකු කටයුතු කිරීම
	උප එකතුව (ක්ෂුද්‍ර මූල්‍ය බැංකු ප්‍රතිපාදන)			6,348,550.00			
	මුළු එකතුව			**17,101,156.41**			

පරිච්ඡේදය -07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ.	වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.	ගබඩා අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ.	විශේෂ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
1.6	වෙනත්	අදාල නොවේ.	වෙනත් අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන නොයයි.	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රේ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට , සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ.	නිකුත් කරනු ලබන විමසුම් සඳහා පිළිතුරු ලැබිය යුතුය.	දිස්ත්‍රික් විගණන ඒකක හරහා පිළිතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 ට වඩා අඩු කාලයකදී අපහරනය කර තිබීම	අනුකූල නොවේ		තාක්ෂණික කමිටු වාර්තා අනුව සුදුසු වාහන අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට ඵලඹීම	අනුකූල වේ		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	ආයතන ඒකාබද්ධ කිරීමේදී මතුවූ තත්ව හේතුවෙන් ගැටළු මතුවන තව දුරටත් නිරවුල් කළ යුතු ණය ශේෂ පවතී.	ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය විධි විධාන සලසා ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රේ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රේ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.3	මු.රේ. 176 අනුව නිහ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.	වෙන් කල ආදායම් ශීර්ෂයක් නොමැත	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය තුළ තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කොට තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		